**2020 අගෝස්තු මස 11 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව**

**<u>සහභාගීත්වය</u>**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා | ගරු සභාපති |
| කමල් වැල්ලගේ මැතිතුමා | ගරු උප සභාපති |
| ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ග්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී ලක්ෂ්මි හේමන්තා මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදුර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ. සෝභිත රංජිත් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මහගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ.ඉන්ද්‍රා අයිරාංගනි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී.ජී. ආර්. පේෂලා කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්. ඉනෝකා ක්‍රිශාන්ති මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| රාහුල ලලිත වික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.එම්. නිලානි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්.එම්.සරත් චන්ද්‍ර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මහගේ චම්පා සුමුදු කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |

- **පන්සිල් සමාදන් විමෙන් අනතුරුව පෙ.ව.9.30 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී**

**( 01 )** සභා රැස්වීම් වාර්තා සම්මත කිරිම

**01.01** 2020.07.07වන දින පැවති මාසික සභා රැස්විම් වාර්තාව සම්මත කිරිම

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.07.07 වන දින පැවති මාසික සභා රැස්විම් වාර්තාව සම්මත කිරිම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

2020.07.07 වන දින පැවති මාසික සභා රැස්විම් වාර්තාව සම්මත කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

එම වාර්තා මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, 127 පිටුවේ ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින් කියන එක මා නෙමේ ප්‍රකාශ කළේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔබතුමා එහෙම කිවුවේ නැද්ද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

නැහැ මා නෙමේ එහෙම කිවුවේ. එතැන වැරදිලා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

127 පිටුවේ ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින් කිය එක ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා ලෙස සංශෝධනය කරන්න.

**තීරණය**

2020.07.07 වන දින පැවති මාසික සභා රැස්විම් වාර්තාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඉහත සඳහන් සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

**( 02)** සභාපතිවරයා විසින් නිකුත් කරන විශේෂ නිවේදන නැත

**( 03)** ලැබී ඇති පැමිණිලි , පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**03.01 2020 ජුනි මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ජුනි මස වාර්තාව. ආයතනයෙහි සායන තැබූ දින ගණන 22යි. ආයතනයට පැමිණි රෝගීන් සංඛ්‍යාව 827 යි. රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය ගණන 38 . මාසය සඳහා වැයවූ ඖෂධවල මුළු වටිනාකම රු.56207.66 යි. එක් රෝගියෙක් සඳහා වැය වූ මුදල රු.67.97. මෙය සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙහි ආයතනයට පැමිණෙන රෝගීන් සංඛ්‍යාව එහෙම වාර්තාවේ තිබෙනවාද?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

තිබෙනවා. පලමු දිනයේ 01 වෙනි දින 60 යි දෙවැනි දිනයේ 42යි 03 දිනයේ 39 04 දිනයේ විශේෂ රජයේ නිවාඩු 05 වෙනිදා පෝය දින 06 වෙනි දින රෝගීන් පැමිණියේ නැත. 07 වෙනිදා ඉරිදා දිනයක්. 08 වෙනිදා 45 යි . 09 වෙනිදා 49යි. 10 වෙනිදා 42 යි .11 වෙනිදා 24 යි 12 වෙනිදා 28 යි. 13 වෙනිදා මානසික උපදේශන 14 ඉරිදා . 15 දින 54යි ක් වශයෙන් වාර්තාවක් තිබෙනවා. අවශ්‍ය කෙනෙක් ඉන්නවා නම් වාර්තාව ඉල්ලා ගන්න.

**තීරණය -**

2020 ජුනි මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ගරු සභාවේ දැනගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.02 මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කාපට් කරන ලද මාර්ග පිළිබඳ විස්තරය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අම්බලන්ගොඩ ආසනයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සංවිධායක වශයෙන් මට කිලෝ මීටර් 15ක් ලැබි තිබෙනවා කාපට් කරන්න. එම 15 සහ තවත් 10ක් වශයෙන් ලැබි තිබෙනවා. ඉන් 10ක් අපි අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාවට ලබා දි තිබෙනවා. එම 15 යොදවා තිබෙනවා අම්බලන්ගොඩ නගර සභාවේ පාරවල් වලට. සම්පූර්ණම පාරවල් වලට. දැනට එක කොන්ත්‍රාත්කරුවෙකු විතරක් කොන්ත්‍රාත් දි තිබෙනවා මා දිපු එකේ. ඒ අනුව මෙන්න මේ පාරවල් කාපට් කරනු ලබනවා. නගර සභා පාර එන්.ඩී.බී එක ළඟ සිට නගර සභාව දක්වා , පරණ ඇල්පිටිය පාර, මහ අම්බලන්ගොඩ පාර ( සම්පූර්ණ මහ අම්බලන්ගොඩ පාර ගාලු පාරේ සිටි දුව බේකරිය දක්වා ) ඊළඟට දළුකන්ද පන්සල පාර , රණසුරිය පාර . මෙය කාපට් කරන්නේ රණසුරිය පාරේ සිට පොල්වත්ත දක්වා ගිහින් එතැනින් බුද්ධ දත්ත මාවතට එළියට වැටෙන පාසලට ප්‍රවේශ වෙන්නාවූ මාර්ගය තමයි. එකට පාරවල් දෙක තුනක් අයිති වෙනවා. අපි සම්පූර්ණ ඒ කොටස ඉවර කරනවා. ඊළඟට විජයාරාම පාර ( කළුවඩුමුල්ල පන්සල දක්වා ) , ඊළඟට පඤ්ඤාලෝක මාවත ( පොල්වත්ත පැත්ත පොල්වත්තේ සිට කළුවඩුමුල්ල මහපාර දක්වා ) , විහාරගොඩ පාර , අපේ අදාහනාගාරයට තිබෙන පාර , පොකුණ පාර , පරණ පොල්වත්ත පාර අපේ කොටස. අනිත් කොටස බලපිටියෙන් දමා තිබෙන්නේ. පරණ පොල්වත්ත දක්වා ටී.එච්.ඩබ්. නිවාස දක්වා තිබෙන මාර්ගය. මේ මාර්ග ටික එක කොන්ත්‍රාත්කරුවෙකුට ලබා දී තිබෙනවා. මේ වැඩ කටයුත්ත සඳහා සහාය දෙන්න කියා මා සියළුම මන්ත්‍රිවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. මෙතැන තිබෙන්නේ කිලෝමිටර් 7ක් වගේ ප්‍රමාණයක්. දැනට පිරිනමා ඇති කොන්ත්‍රාත් ටික මෙකයි. මේ කිලෝමිටර් 15ම මාර්ග සංවර්ධන අධිකාරියෙන් කොන්ත්‍රාත්කරුවන් ලවා අපට කර දෙනවා. අපට ඉතාමත් වැදගත් . මේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ මේ මැතිවරණ පොරොන්දුවක් අනුව කාපට් ලක්ෂයක් ඇතිරිමේ වැඩ පිළිවෙලේ පලවෙනි වැඩපිළිවල තමයි මේ පාරවල් කාපට් කිරිම. කිලෝමිටර් 10ක් මේවා කර තිබෙනාවා. දැන් අපි බලපු දෙයක් තමයි අම්බලන්ගොඩ නගරය තුල දිර්ඝ කාලිනව මේ කටයුත්ත කෙරුණේ නැහැ. මේ අවස්ථාවේදි නගරයක් වශයෙන් විකාශය වෙන්න අවශ්‍ය කරන පහසුකම සඳහා මේ කටයුත්ත අපි තෝරලා තිබෙනවා. දැන් කළුවඩුමුල්ල පාර මේ ප්‍රදේශයට ඇතුළත් වෙලා නැහැ. කළුවඩුමුල්ලේ ඇතුළු පාරවල් මේකට ඇතුළත් වෙලා තිබෙනවා. ඊළඟ කොන්ත්‍රාත් එකට අපි දමා තිබෙනවා. හෙප්පුමුල්ල පාර , ඊළඟ කොටස් ටික ඊළඟ කොන්ත්‍රාත් එකෙදි සිදු කරනවා. දැනටමත් වැඩ ආරම්භ කර තිබෙන්නේ. ඒ සඳහා සහාය ලබා දෙන්න කියා සියළුම ගරු මන්ත්‍රිවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් මාර්ග කාපට් කරන්න ඔබතුමාගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ නගරයේ මාර්ග පද්ධතිය කාපට් කිරීම සම්බන්ධව අපි සහායෝගය ලබා දෙනවා. මෙය විය යුක්තක්. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයකට අනුව මෙය සිදුකිරීමට හැකිවේවා කියා ප්‍රර්ථනා කරනවා. මා හිතන්නේ මේ අපේ කොට්ඨාශ 13ම ආවරණය වන පරිදි මෙය සිදු වේ කියා හිතනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

යවලා තිබෙන්නේ. හම්බ වෙලා තිබෙන්නේ මේ කොන්ත්‍රාත් එක.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

දැන් අපේ නොලැබෙන කොට්ඨාශ තිබෙනවාද ?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

තිබෙනවා. දැනට තිබෙන්නේ මේවා. අපේ මන්ත්‍රීවරුන්ට පෙන්වා තමයි එය යැව්වේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

එක හොඳයි. මා ඉල්ලා සිටිනවා මේ මාර්ග හදන විට ජලසම්පාදන මණ්ඩලයෙන් දමන ලද බට තිබෙනවා. එමනිසා අපෙන් හරි මේ අවශ්‍ය කරන බට ටික දමන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැනට මේ ලැයිස්තුව ජාතික ජල සම්පාදන මණ්ඩලයට යවා තිබෙනවා. මෙන්න මේ මාර්ග අපි කාපට් කරනවා. එමනිසා මේ මාර්ග වලට අවශ්‍ය කරන දෙයක් තිබෙනවා නම් ඉක්මනින් මේවා කරන්න කියා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

දැන් ජල සම්පාදන දෙනවිට තිබෙන ඒවා කොහොමත් නඩත්තු කරන්න වෙනවානේ. එමනිසා එකටත් මොනවා හරි ක්‍රමවේදයක් සපයන්න කියා ඉල්ලා සිටිනවා. නැතිනම් මේ ජල සැපයුම් ලබා දෙන්න පාරවල් කඩලා මේවා සවුත්තු වෙලා යනවා. මෙය සිදු කරන්නේ විශාල වියදමක් දරලා. මේ පාරවල් කාපට් කිරීම සම්බන්ධව අපේ සහායෝගය ලබා දෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

මා කොට්ඨාශ මන්ත්‍රීවරයා විදියට අවස්ථාවක් කොට ගන්නවා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ මග පෙන්වීම යටතේ ඔබතුමා සම්බන්ධ වෙලා ළමුන් 3000ක් 4000ක් පමණ සිටින ගා / පී ද එස් කුලරත්න විද්‍යාලයට යන මාර්ගය කාපට් අතුරා මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන්. පොඩි ගැටළුවක් තිබෙනවා. එදා මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් හරහා ඔබතුමාට කතා කළා. මෙතැන වතුර පිරෙනවා. ඔබතුමා කිවුවා ඒ සම්බන්ධව දැනුවත් කරලා නගර සභාවෙන් හරි උස්සා පස් දමා පුරවා හදා දෙන්නම් කිවුවා. දෙදුවස්සේ පාරට යන

තැනයි , අපේ නිතිඥ මහතාගේ නිවස අසළ , රබින් මහතාගේ නිවස අසළ.පහත් බිම්. වැඩය සාර්ථක විදියට නිම කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එම කොටස අපි මාර්ග සංවර්ධන අධිකාරියෙන් කර ගැනීමට බැරි වුණොත් අපි නගර සභාවෙන් හරි කරලා දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මහ අම්බලන්ගොඩ පාර කාපට් කරන කොට බේකරිය ළඟින් අවසන් වෙනවා. හැකියාවක් තිබෙනවානම් එම මාර්ගය අවසන් වන තැනට වනකම් කාපට් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. එම මාර්ගයේ ව්‍යාපාරයක් කරන මහත්මයෙක් අපිට යම්කිසි මුදලක් දෙන්නම් කිවුවා මාර්ගයට. එම මුදලින් හරි කර දෙන්න. පාරේ භාගයක් කර මිනිසුන් වචන අහන්න කැමති නැහැ. හැකියාවක් තිබෙනවානම් ඉතිරි ටිකක් කර දෙන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔබතුමාගේ ඉල්ලිම මා කොහොම හරි මෙයට දමන්නම්. හැබැයි මන්ත්‍රීතුමා මේ පාර මහ අම්බලන්ගොඩ පාර කියා නම් කළාම මේ පාරේ අවසානය බේකරිය ළඟ තමයි. ඊට පස්සේ තිබෙන පාර සුමනමාතාරාමය - කැටන්තොට කියා තමයි තිබෙන්නේ. එමනිසා අපි එය ඊළඟ පාර එකට ඇතුල් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔය පාරවල් ලැයිස්තුව අප වෙත ලබා දෙන්න කියා අප ඉල්ලිමක් කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙහි ඡායා පිටපතක් ගානේ හැමෝටම දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මෙය ඉතා වැදගත් දෙයක්. නගර සංවර්ධනයට තමයි අපි හැමෝම කැමති. හැබැයි ඒ කාපට් කරන හැම මාර්ගයකම කාණු පද්ධතිය ගැන විශේෂ අවධානය යොමු කරන්න. නැතිනම් කාපට් කළාට වැඩක් නැහැ. විශාල මුදලක් වැය කර මේ රජයෙන් ගනු ලබන ක්‍රියා මාර්ගය ඔබතුමා ඇතුව අප මන්ත්‍රීවරුන්ගේත් වගකීමක් වෙනවා එය සුරැකිම. ඒ කටයුත්ත කරන්න. එය ආරක්ෂා කරන්න. රජයේ මුදල් මේ වැය කරන්නේ. අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව වුණත් වැය කරන්නේ අපේ මුදල්. මෙය ආරක්ෂාකාරිව කරන්න. කාණු පද්ධතිය ගැන දැඩි අවධානයක් යොමු කරන්න. විශේෂයෙන් නගරයේ මේ සීමාවේ මේ පාරවල් කාපට් යෙදිම ඉතා හොඳයි. මොකද ජනතාව මේ පාරේ යනවිට බනින්නේ මේ නගර සභාවට. නගර සභාවේ පතුරු යන්න

බැණ බැණ තමයි මේ පාරේ යන්නේ. එමනිසා මෙය සකස් කරන එක හරියටම කරන්න. මේ යන වියදමින් ප්‍රයෝජනයක් ගන්න. කාණු පද්ධතිය ගැන දැඩි අවධානයක් යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා. එම පාරවල් සම්බන්ධව අපිත් දැඩි අවධානයක් යොමු කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ මාර්ග කාපට් කිරීම සම්බන්ධව අප සමඟ නම් සාකච්ඡාවක් ලබා දිලා නැහැ. නමුත් ඔබතුමා මේ සභාවට ඉදිරිපත් කළ පරිදි ඒ යම් යම් පාරවල් වල මාර්ග සලකුණු කර තිබෙනවා. ඒ අනුව කරිත්ත කන්ද කොට්ඨාශයේ කිසිම මාර්ගයක සලකුණු කිරීමක් නැහැ. අනිත් පැත්තෙන් වසම් 13 ම අයවැය යෝජනා ගම්මුන්නිගෙන් ගනිද්දි කරිත්ත කන්ද ග්‍රාමසේවා වසම තමයි මේ පාරවල් කාපට් කර දෙන්න කියන ඉල්ලීම කළ එකම සමිතිය තමයි කරිත්ත සමිතිය ලෙස අයවැය යෝජනා වල සඳහන් වෙන. එකත් බැහැරවෙලා තිබෙනවා. ගම්මුන්ට අපි පිළිතුරු දිය යුතුව තිබෙනවා. මෙය සිදු කිරීම ඉතා හොඳයි. හැබැයි සෑම ග්‍රාමසේවා කොට්ඨාශයකම අඩි 100 ක් හරි කාපට් වීම හොඳයි කියන මතයේ මා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා , කළුවඩුමුල්ල පාරේ සිට පොල්වත්ත දක්වා ඇති පාරත් , කන්ද මාවතත් කාපට් කිරීම සඳහා අපි ඇතුළත් කර තිබෙනවා. මෙහි අපි ඉල්ලා සිටින කිලෝමීටර් 15න් අපට ඇවිත් තිබෙන්නේ කිලෝමීටර් 7කට ආසන්න ප්‍රමාණයක්. ඉතිරි ටික වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු ලවා කරනවා. දැනට වැඩ පටන් ගත්ත කොන්ත්‍රාත්කරු තමයි පැමිණ අප සමඟ සාකච්ඡා කර මේ ලිපි ලේඛණ ලබා දී තිබෙන්නේ. අනිත් ටිකත් මා මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා සමඟත් සාකච්ඡා කළා. කිලෝමීටර් 15ක් අපේ අම්බලන්ගොඩ නගරයේ කරනවා. අපේ පොත්වල තිබෙන විදියට අපට තිබෙන්නේ පාරවල් කිලෝමීටර් 40ක ආසන්න තාර පාරවල් ප්‍රමාණයක්. එතකොට ලබන වසර වනවිට සමස්ත නගරයේම කාපට් කර ගැනීමට පුළුවනි. ඉතිං එය සුබවාදීව බලන්න පුළුවන්. මේ අතිගරු ජනාධිපතිතුමාගේ කරන වැඩපිළිවල අනුව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා ගරු සභාවට ටිකක් ප්‍රමාද වී පැමිණීම සම්බන්ධයෙන් සමාව ඇයැද සිටිනවා. ඇත්ත වශයෙන්ම අතිගරු ජනාධිපතිතුමාගේ හොඳ වැඩසටහනක් තමයි මේ මාර්ග කාපට් කිරීමේ වැඩපිළිවෙල. ඔබතුමා මහ අම්බලන්ගොඩ පාර කාපට් කරන්න නිර්දේශ කර තිබෙනවා. ඒ අනුව ඒ මැනීම් කටයුතු කර තිබෙනවා. ගම්වාසීන් ඉල්ලීමක් කළා. මොකද ධම්මකුසල විද්‍යාලයට එහායිනුත් කරන්න කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය දුව බේකරිය දක්වා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පුළුවන්නම් දුව බේකරියට එහායින් තව මීටර් 200ක් පමණ තිබෙනවා. ඒ ටිකත් කර දෙන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා කිවුවා. අපි ඊළඟ මේකට ඇතුළත් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ඒ වගේම කාපට් කරන්න ඉස්සරවෙලා ජලනල එලිම සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා. මේ පාර හැමදාම කැඩෙනවා. එම නිසා මේ පාර කාපට් කරන්න ඉස්සරවෙලා ඔබතුමා මැදිහත් වෙලා ජල සම්පාදන මණ්ඩලය දැනුවත් කරලා මෙය කරන්න. ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් මහතා මේ පාර කාපට් කළ වේලාවේ මා දැක්ක දෙයක් තමයි සම්පූර්ණම ජලනල පද්ධතිය අලුත්වැඩියා කළා. ගම්වාසින්ගේ ඉල්ලිම පරිදි ඉල්ලා සිටිනවා. ඔබතුමා මැදහත්වෙලා මේ මාර්ගයේ ජලනල එලිම කටයුත්ත සිදු කරන ලෙස.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මාර්ග කාපට් කිරිම හොඳ යෝජනාවක් . බුද්ධදත්ත පාරෙන් තල්ගස්ගොඩට වැටෙන ඒ කොටස කෙරෙන්නේ නැහැ. මීටර් 300ක වගේ ප්‍රමාණයක් තිබෙන්නේ. අපි ඉල්ලා සිටිනවා ඒ ටිකක් කර දෙන්න කියා. තල්ගස්ගොඩ පාරේ සිට පාසල ළඟට හැරෙන්නේ. තල්ගස්ගොඩට වැටෙන්නේ. ඒ මීටර් 300 ක ප්‍රමාණයත් අපට ලබා දෙන්න ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා මා මෙහි සමහර ඒවා ඇතුල් කළේ නැහැ. මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා මගේ පෞද්ගලික මිත්‍රයෙක්. විශේෂයෙන් මහ විදියේ ඇතුළත් කළ යුතුයි. නමුත් මහවිදය මාර්ග සංවර්ධන අධිකාරියට අයිති. ඒ කොටස ඒ අය මඟින් කර දෙන්නම් කිවුවා. මේවා

මෙකට ඇතුළත් කරලා තිබෙන ප්‍රමාණය නැති කරගන්න එපා කිවුවා. මේ යෝජනා කරන එකත් මාර්ග සංවර්ධන අධිකාරිය සතුව තිබෙන එකක්.

<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ හරස් පාර කියන්නේ. බුද්ධ දත්ත මාවතෙන් ගිහින් බුද්ධ දත්ත හරස් පාර.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මා අදහස් කළේ ඔය පාර තමයි. මැනුම් කටයුතු සිදු කරන කොට අර පාර තමයි ගිහින් තිබෙන්නේ. ඔය දෙකම ඇතුල් කරන්න කියා තමයි මා කියා තිබෙන්නේ. අපි ඊළඟ මේකට ඇතුල් කරන්නම්. අපි එය කර දෙන්නම්.

**තීරණය -**

මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කාපට් කරන ලද මාර්ග පිළිබඳ විස්තරය ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ගරු සභාවේ දැනගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.03 කරුණු පැහැදිලි කිරීම යන මැයෙන් තෙත්බිම් උරුමය සංවිධානයේ ලේකම් විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

තෙත්බිම් උරුමය සංවිදානයේ කට්ටිය ඉන්නවාද කවුරු හරි. ඒ අය නැති නිසා අපි එය පසුව ගැනීමට කටයුතු කරනවා. තෙත්බිම් සංවිධානය විසින් ලිපියක් එවා තිබෙනවා. එම ලිපිය පරිදි අපි එතුමන්ලා සමඟ සාකච්ඡාවක් සිදු කරනවා. ඒ අවස්ථාවේ අපි කාරක සභාවක් බවට පත් කරනවා. එය පසුව ගන්නවා. වෙනත් කරුණු යටතේ.

**තීරණය -**

කරුණු පැහැදිලි කිරීම යන මැයෙන් තෙත්බිම් උරුමය සංවිධානයේ ලේකම් විසින් එවා ඇති ලිපිය සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා සභාව කාරක සභා අවස්ථාවකට ගෙන දෙපාර්ශවය අතර සාකච්ඡාවක් සිදු වූ අතර තීරණයකින් තොරව සාකච්ජාව නිමා විය.

**03.04 ඉඩම් විකිණීමේදී නගර සභාවට ගෙවිය යුතු 1% ක ගාස්තුව කිදහස් කරදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ, හීන් ඇල පාර, අංක 17 හි පදිංචි බී.ඒ.රත්නසිරි මහතා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙහිදි ඔප්පු සාරංශ අයදුම්පතක් යොමු කර තිබෙනවා. එහිදි 1%ක බද්දක් ගෙවන්න ඕනේ. කැබලි ගණන වැඩි නිසා. ඒ අනුව බි.ඒ. රත්නසිරි මහතා විසින් ලිපියේ සඳහන් පරිදි මවගෙන් ලැබි ඇති බවත් සහෝදරයන් අතර බෙදා ඇති බවත් සඳහන් කර ඇත. ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක් , ඔහුගේ උප්පැන්න සහතිකයේ පිටපතක් ,බෙදුම් ඔප්පුවේ පිටපතක් ද අමුණා ඇත.. ඒ අනුව ඥාතින් අතර හුවමාරු වී ඇති බැවින් ATD/8/13/2020 දරණ ඔප්පු සාරංශය ප්‍රකාරව ඒ කැබැල්ල සඳහා ගෙවිමට ඇති රු.51300/= ක 1% ගාස්තු බි.ඒ. රත්නසිරි මහතා විසින් වෙනත් අයෙකුට විකිණිමේදි එම මුදල අයකිරිමට යටත්ව සහා අනුමැතියට යටත්ව අනුමත කිරිම සුදුසු බවට ආදායම් පරික්ෂක මහතා විසින් නිර්දේශ කර තිබෙනවා. එය ලේකම්තුමිය ඇතුළු ආදායම් අංශ ප්‍රධානි නිර්දේශ කර තිබෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

අනුමත කරනවා. විගණන විමසුම් වලත් අපි බැලුවා ඒ අදාල නිලධාරින්ගෙන් මේ කර්තව්‍ය ඉටුවෙලා නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

දැනට අපි උපදෙස් දි තිබෙන්නේ ATD අයදුම් පතේ ඉහළින්ම ලියන්න කියා මේ පුද්ගලයා නැතුව වෙනත් කෙනෙකුට පවරනවානම් මෙම මුදල අයකරන්න කියා. එතකොට වෙනස් කරනකොට අහු වෙනවා.

**තීරණය -**

ඉඩම් විකිණීමේදී නගර සභාවට ගෙවිය යුතු 1% ක ගාස්තුව නිදහස් කරදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ, හීන් ඇල පාර, අංක 17 හි පදිංචි බී.ඒ.රත්නසිරි මහතා විසින් එවා ඇති ලිපිය අනුව, ඔහු විසින් වෙනත් අයෙකුට ඉඩම් කැබැල්ල විකිණීමේදී එම මුදල අයකර ගැනීමට යටත්ව 1% ගාස්තුව වන රු.51300/- ක මුදල නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.05 "දූමාරේ" සංගීත ප්‍රසංගය වෙනුවෙන් ප්‍රවේශපත්‍ර සඳහා ගෙවන ලද විනෝද බදු මුදලින් කොටසක් ලබාගත් බවත් ඉතිරි මුදල් ලබාදෙන ලෙස ඉල්ලා අහුන්ගල්ල, කොටවත්ත**

**පාර, අංක 141/ඒ හි පදිංචි ඩී.ආර්.එල්.කේ. ද සිල්වා මහතා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඩී.ආර්.එල්.කේ ද සිල්වා ඇප මුදල් ලබා ගැනීමට . අප විසින් දුමාරය සංගීතය අත්හිටුවීම මත ටිකට්පත් කලින් භාර දුන් අතර ටිකට් අඩුපාඩුවක් වූ අපට ලැබිමට වූ 290000/= ක මුදලින් 273173 ක් මුදලින් රු 16873 ක මුදලක් ලැබුණි. ඒ සඳහා අඩුපාඩු වූ රු.3000 ටිකට් පත් 01 ක්ද රු.2000/= ටිකට් පත් 80 ක්ද රු.1500/= ටිකට් පතක්ද අද දින භාර දෙන අතර හැකිතාක් ඔබලාට ගෙවීමට ඇති රු.16075ක මුදල ලබා දෙන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා. මෙය අර කොරෝනා - 19 අවස්ථාවේ පවත්වන්න යෙදි තිබුණේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එය ලබා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය ලබා දෙන්න තීරණය කරනවා.

**තීරණය -**

"දුමාරේ" සංගීත ප්‍රසංගය වෙනුවෙන් ප්‍රවේශපත්‍ර සඳහා ගෙවන ලද විනෝද බදු මුදලින් කොටසක් ලබාගත් බවත් ඉතිරි මුදල් ලබාදෙන ලෙසත් ඉල්ලා අහුන්ගල්ල, කොටවත්ත පාර, අංක 141/ඒ හි පදිංචි ඩී.ආර්.එල්.කේ. ද සිල්වා මහතා විසින් එවා ඇති ලිපිය අනුව, රු.15400/- ක මුදලක් නිදහස් කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.06 2020 වර්ෂය සඳහා හිමි ඖෂධ ලබාගැනීම යන මැයෙන් ආයුර්වේද වෛද්‍ය නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020 වර්ෂය සඳහා හිමි ඖෂධ ලබාගැනීම යන මැයෙන් ආයුර්වේද වෛද්‍ය නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුවයි. ඒ අනුව වෛද්‍ය නිලධාරිතුමිය ඉදිරිපත් කර තිබෙනවා 312295/= ක මුදල ඖෂධ ලබා දෙන්න කියා. එය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී  රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

එය ලබා දෙන්න.

**තීරණය -**

අම්බලන්ගොඩ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවට 2020 වර්ෂයට හිමි ඖෂධ ලබාගැනීම සඳහා රු.312295/- ක් වන ඖෂධ ඇස්තමේන්තුව සඳහා සහ ඖෂධ ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.07 2019.12.31 දිනට පවත්වන ලද පුස්තකාල පොත් සමීක්ෂණයේ (ප්‍රධාන පුස්තකාලය හා ශාඛා පුස්තකාල) නිර්දේශ හා යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිගොනුව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

2019.12.31 දිනට පවත්වන ලද පුස්තකාල පොත් සමීක්ෂණයේ (ප්‍රධාන පුස්තකාලය හා ශාඛා පුස්තකාල) නිර්දේශ හා යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ඉල්ලා සිටිනවා. යෝජනා ක්‍රියාත්මක කිරිම සඳහා මන්ත්‍රිවරුන්ගේ නම් දෙකක් යෝජනා කරන්න කියා ඉල්ලා සිටිනවා. මා මන්ත්‍රිවරු දෙදෙනෙක් නම්කරන ලෙස ඉල්ලා සිටිනවා. පුස්තකාල සමීක්ෂණ යෝජනා ක්‍රියාත්මක කිරිමට. ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා සහ ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්.සරත් චන්ද්‍ර මහතාගේ නම් යෝජනා කරනවා. ඔබ දෙදෙනා කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී  රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමා දැන් ඔය සම්ක්ෂණ වුණාට පසු පුස්තකාල වල ගැටළුවක් තිබෙනවා. ඒ අස්ථානගත විම තුළ . ඒ පොත් ගෙනයන අය නිසියාකාරව භාර දි තිබෙනවාද?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එකට තමයි ඔබතුමලා පත් කරන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

නැහැ කලින් ඒවා අහන්නේ. මේක නෙමේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පුස්තකාලයාධිපතිතුමිය ඉන්නවාද ?

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

පුස්තකාලයෙන් අයකර ගෙන තිබෙනවාද ?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මා දන්න විදියට අයකරගෙන තිබෙනවා. නැහැ මන්ත්‍රීතුමලා දෙන්න පත් කරන්නේ එහෙම අඩුපාඩුවක් තිබෙනවා නම් එය නිවැරදි කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

කලින් එක ගැන කතා කරන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කලින් එකේදි මන්ත්‍රීවරු පත්කර තිබෙනවා. ඔබතුමලා එහි අධික්ෂණය නිසි ලෙස කරන්න. මෙහිදි නිලධාරින් සිටිනවා. මෙන්න මේ නිලධාරින් ඉන්නවා. ගණකාධිකාරි, පරිපාලන නිලධාරි, විමර්ශන නිලධාරි ( පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය ) , අභ්‍යාන්තර විගණන නිලධාරි , ප්‍රජා සංවර්ධන නිලධාරි , සභාපති ප්‍රධාන පුස්තකාල සමික්ෂණ මණ්ඩලය, සභාපති ශාඛා පුස්තකාල සමික්ෂණ මණ්ඩලය සහ ඔබතුමලා දෙන්නායි. නිලධාරින් 07යි ඔබතුමලා දෙන්නායි ඔක්කොම 09යි.

**ගරු නගර සභා මන්ත්‍රී එස් .එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , මට ඒ සඳහා සහභාගි වීමට අපහසුයි . මේ තිබෙන රාජකාරි සමඟ වෙනත් කෙනෙකු යොදවන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

චම්පා මන්ත්‍රීතුමිය භාර ගන්න. මොකද අපි මේවා විනිවිද භාවයෙන් හා අවශ්‍යතාවයෙන් සිදු කරන්න ඕනේ. අනවශ්‍යතාවයෙන් සිදු කරන්න ඕනේ. විපක්ෂයේ මන්ත්‍රීවරු සහභාගි විම ඉතා වැදගත්.

**තීරණය -**

2019.12.31 දිනට පවත්වන ලද පුස්තකාල පොත් සමීක්ෂණයේ (ප්‍රධාන පුස්තකාලය හා ශාඛා පුස්තකාල) නිර්දේශ හා යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවටත් එම කාර්යයන් අධීක්ෂණය කිරීම සඳහා ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී එම්.චම්පා සුමුදු කුමාරි මහත්මිය පත්කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 03.08 2020.06.15 දින සිට වරිපනම් ගෙවීම් පරිගණකගත කිරීමේ ගැටලු සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

2020.06.15 දින සිට වරිපනම් ගෙවීම් පරිගණකගත කිරීමේ ගැටලු සම්බන්ධව. කොවිඩ් වසංගතය නිසා වරිපනම් බදු ගෙවිමේදි දඩ අය කිරීම සම්බන්ධව කටයුතු කිරිම සඳහා 2020.07.07 දින අංක 03.21 ගත් තින්දුව අනුව කටයුතු කිරිමට උපදෙස් ලබා දී ඇත. 2020.06.15 දක්වා පළවන කාර්තුවේ සහන කාලය ලබා දී ඇත. නමුත් පරිගණක මෘදුකාංගය කාර්තුව අවසාන දිනය වන 2020.06.30 දින දක්වාම සහනයක් ලැබෙන සේ සකස් වී ඇත. 2020.04.20 දින සිට මේ දක්වා වරිපනම් බිල්පත් ගෙවීමේදි අතින් ලියන ලද බිල්පතක් නිකුත් කිරිම සිදු කරයි. 2020.4.20 දින සිට 2020.06.15 දින දක්වා බිල්පත් 366ක් පරිගණකගත කර අවසන් අතර 2020.06.16 දින සිට මේ දක්වා බිල්පත් 289ක් පරිගණක ගත කළ යුතුව ඇත. කාර්තුව අවසන් කරන තෙක් බිල්පත් පරිගණකයේ මුද්‍රණය කල නොහැකිවි ඇත. එබැවින් 2020.06.16 සිට බිල්පත් පරිගණකගත කිරීමේදි ගැටළු සහගත තත්ත්වයක් ඇත. අන්න ඒ දිනය දක්වා එම සහනය ලබා දෙන්න කියා අපේ එකඟතාවය පල කරනවා.

**තීරණය -**

වරිපනම් පරිගණක මෘදුකාංගයේ පවතින ගැටලු සහගත තත්ත්වය මත 2020.06.15 දින සිට 2020.06.30 දින දක්වා වරිපනම් දඩ ගෙවීම් සඳහා සහන කාලය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.09 ජල සේවා කර්මාන්තය සම්බන්ධ මහජන උපදේශනය යන මැයෙන් දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ජල සේවා කර්මාන්තය සම්බන්ධ මහජන උපදේශනය . මේ ලේඛණය මන්ත්‍රිවරුන්ට ලැබුණාද? එහි අවශ්‍ය උපදෙස් තිබෙනවා . ලිඛිතව දන්වන්න ලේකම්තුමිය වෙත. මෙය කතා කරන්න අවශ්‍ය නැහැ. ඒ සියල්ලම අපි රජයට දැනුම් දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙහෙමයි. මේ අම්බලන්ගොඩ කොට්ඨාශයේ ජලය නොලැබෙන ස්ථාන කිහිපයක් තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ ප්‍රශ්න තිබෙන තැන් ඔබතුමලා ලිඛිතව දැනුම් දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එතකොට අපි ලිඛිතව දැනුම් දුන්නාම එය සභාව ගත් තින්දුවක් හැටියට යවන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එක යවන්නම්. මෙයින් බලාපොරෝත්තු වෙන්නේ රජය යම්කිසි ප්‍රතිපත්තියක් හදන්න. මන්ත්‍රිවරුන්ගේ අදහස් දැන ගන්න. අපට මේ සුළු මොහොතෙන් අදහස් දක්වන්න බැහැ. මේ සඳහා ගමේ ජනතාවට තිබෙන ප්‍රශ්න ටික හරියට එවන්න. ඒ ටික අපි යවන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩට ජල ටැංකියක් අවශ්‍යයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හරි එය ලියා දෙන්න.

**තීරණය -**

ජල සේවා කර්මාන්තය සම්බන්ධ මහජන උපදේශනය යන මැයෙන් දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් එවා ඇති ලිපිය අනුව මහජන අදහස් රජයට දන්වා යැවීම සඳහා මහජන අදහස් ලිඛිතව ගරු මන්ත්‍රීවරුන් විසින් ලේකම්තුමිය වෙත ලබාදෙන ලෙස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ගරු සභාවට දැනුම්දෙන ලදී.

**03.10 අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජික සාමාජිකාවන් 100,000 ක් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමේ ජාතික වැඩසටහන පිළිබඳව අම්බලන්ගොඩ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජික සාමාජිකාවන් 100,000 ක් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමේ ජාතික වැඩසටහන. ඒ අනුව රජයේ සෞභාගයේ දැක්ම රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව දිළිඳු බවුල් නගා සිටුවා ආර්ථික සංවර්ධනයට ඔවුන් දායක කර ගැනීමේ අරමුණ ඇතිව අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අදාලව පිහිටුවනු ලබන ප්‍රාදේශීය කමිටු 2020.07.31 දින ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පැවැත්වෙන බැවින් මෙහි බඳවා ගැනිමට අපේක්ෂිත රැකියාලාභින් සඳහා මාස 06ක කාලයක් තෝරාගත් වෘත්තීය පුහුණු පාඨමාලාවක් සඳහා යොමු කිරීමට අපේක්ෂිතය. එම පාඨමාලා ලේඛණය මේ සමඟ අමුණා ඇති අතර එම පාඨමාලා අතරින් ඔබ ආයතනයට ප්‍රායෝගික පුහුණුව ලබා දිය හැකි අවස්ථා පපිළිබඳව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ. මේ ලේඛණයේ පිටපතක් මන්ත්‍රිවරුන්ට ලබා දෙන්න. ඒ අනුව ඒ අවශ්‍ය කට්ටිය යොමු කරන්න.

**තීරණය -**

අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජික සාමාජිකාවන් 100,000 ක් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමේ ජාතික වැඩසටහන පිළිබඳව අම්බලන්ගොඩ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය විසින් එවා ඇති ලිපිය ගරු සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

**03.11 2006 අංක 25 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 4(අ) වගන්තිය යටතේ ඇළ රක්ෂිත ප්‍රකාශයට පත්කිරීම සම්බන්ධව සැලසුම් කමිටුවේ ගත් තීරණය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

2006 අංක 25 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 4(අ) වගන්තිය යටතේ ඇළ රක්ෂිත ප්‍රකාශයට පත්කිරීම. ඒ අනුව මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාශ ලේකම් විසින් ඔබ අමතා ඇති LASLRDC/483 2019.11.08 දිනැති ලිපියේ සඳහන් පරිදි ඇළ රක්ෂිත ප්‍රදේශයට පත් කිරීමට ඔබ පළාත් පාලන ආයතනයේ කැමැත්ත දකුණු පළාත් , පළාත් පාලන කොමසාරිස්ට හා ඔබටද පිටපත් සහිතව මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශ ලේකම් වෙත කඩිනමින් යැවීමට කටයුතු මෙන් දන්වා සිටිනවා. මෙය සැලසුම් කමිටුවට අපි ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපි මේ වගේ දෙයක් හොඳින් අධ්‍යනය කරන්න ඕන. මේ වගේ එකක් මන්ත්‍රීවරුන්ට දි බලා ඒ අනුව කටයුතු කිරිම හොඳ බවයි මාගේ අදහස.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

එය පසුවට තින්දු කරනවා. ඊලඟ එකට දමන්න.

**තීරණය -**

2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 4(අ) වගන්තිය යටතේ ඇළ රක්ෂිත ප්‍රකාශයට පත්කිරීම සම්බන්ධව සැලසුම් කමිටුවේ ගත් තීරණයට අදාල ලිපියේ පිටපත් ගරු මන්ත්‍රීවරුන් හට බෙදාදීමෙන් පසුව ලබන මස සභාවට (2020 සැප්තැම්බර් මස) නැවත ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් දන්වන ලදී.

**03.12 ඓතිහාසික අම්බලන්ගොඩ ඕලන්ද ස්තාලය දෙපාර්තමේන්තුවට පවරා ගැනීම සම්බන්ධව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව . ඓතිහාසික අම්බලන්ගොඩ ඕලන්ද ස්තාලය ගොඩනැඟිල්ල සඳහා යටිතල පහසුකම් ලබා ගැනීම සඳහා . ඓතිහාසික අම්බලන්ගොඩ ඕලන්ද ස්තාලය

දෙපාර්තමේන්තුවට පවරා ගැනිම. උක්ත කරුණ සම්බන්ධව මා ඇමතු 2019.02.26 දිනැති ලිපිය හා 2019.09.19 හා 2019.11.11 දිනැති ව මා විසින් ප්‍රාදේශිය ලේකම්, අම්බලන්ගොඩ වෙත යොමු කරන ලද ලිපි හා ඊට පිළිතුරු වශයෙන් ප්‍රාදේශිය ලේකම් , අම්බලන්ගොඩ විසින් මා ඇමතු 2019.10.25 දිනැති ලිපිය හා බැදේ. මා වෙත යොමු කර වාර්තාවේ පරිදි පෞද්ගලික සමාගමක් මැදිහත් වි උක්ත ගොඩනැඟිලි පරිශ්‍රයේ අනවසර කටයුතු සිදු කරමින් පවතින බව වාර්තා කර ඇත. 2000.10.04 අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව සිදුකරනු ලබන ඕනෑම සංවර්ධන කටයුත්තක දි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුව ඇත. එසේම මෙම පැරණි ගොඩනැඟිල්ලෙහි පවතින ඓතිහාසික වටිනාකම හා වස්තු විද්‍යාත්මක අඟය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවයි. ලංකාවේ ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස් වූ එච්.ඩී.පී.බෙල් මහතා , ආර්.එල්.බ්‍රොහියර් මහතා සහ ජේ.වි.ලුවිස් මහතා විසින් අම්බලන්ගොඩ ඕලන්ද ස්තාලය හා ඊට අදාල අනෙකුත් ගොඩනැඟිලි සම්බන්ධව වටිනා තොරතුරු රාශියක් තම ඓතිහාසික ලේඛන වල වාර්තා කර ඇත. ඒ අනුව ගාලු කමාන්ඩරියේ මහබැද්දේ ප්‍රධානියා ලෙස කටයුතු කරනු ලැබු ඇඩ්‍රියන් උස්ඩයික්ගේ කාර්යාලය , නේවාසික ස්ථානය , කුරුඳු ගබඩාවක් , දේවස්ථානය හා පල්ලිය යනාදී ගොඩනැඟිලි මෙහි ස්ථාපිතව තිබු බවට මුලාශ්‍රවල තොරතුරු දැක්වේ. ගොඩනැඟිල්ලේ ශිලා ලේඛනයක් දක්නට ලැබෙන අතර , 1750 දි මෙය අඩ්‍රියන් ඌස්වයිස් විසින් නිමවා ඇත. ඒ අනුව මෙම ස්ථානය පිළිබඳව සිදුකළ ස්ථානීය ගවේෂණ මඟින් හා ඓතිහාසික මුලාශ්‍රගත තොරතුරු අනුව ඕලන්ද දේවස්ථානය සහිත භූමිය හා ගොඩනැඟිලි බව තහවුරු වේ. තවද මෙම ස්ථානයට අදාල ඉදිකිරිම වර්තමානය වන වට අම්බලන්ගොඩ ප්‍ර දේශය සතුව පවතින පැරණි ගොඩනැඟිලි කිහිපය අතුරින් නිශ්චිත මුලාශ්‍ර සහිත ඉතිහාසයට උරුමකම් කියනු ලබන සුවිශේෂී පුරාවිද්‍යාත්මක විටිනාකමක් සහිත ගොඩනැඟිල්ලකි. එමනිසා පුරාවිද්‍යා ආඥාපනතට අනුව මෙය පුරාවිද්‍යා පැරණි ස්මාරක සනයෙහි ලා සැලකෙන බැවින් ඉදිරි සංරක්ෂණ හා නඩත්තු කටයුතු සිදුකර ඉදිරියට පවත්වා ගැනිමට අප දෙපාර්තමේන්තුවට පවරා දිමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකරදෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනව බව ප්‍රා දේශිය සහකාර අධ්‍යක්ෂ ඒ.ඩී.එම්.ඩබ්.කේ.කේ.අලහකෝන් මහතා විසින් ලිපියක් එවා තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන්ද ඔය දෙපාර්තමේන්තුවට මතක්වෙලා තිබෙන්නේ මෙහෙම එකක් තිබෙනවා කියා. දැන් මේ ලිපිය අනුව ඓතිහාසික ඕනලන්ද ස්තාලයට පවරා ගැනීම අනුව දැන් මෙය අපේ නගර සභාව සතුයි. නගර සභා මන්ත්‍රීවරුන්ට වගකිම තිබෙනවා මෙය ආරක්ෂා කිරිම. අපසතු වගකිම දිලා වරද්ද ගත්ත තැන් ගොඩක් තිබෙනවා. එමනිසා අපේ ඉල්ලිම තිබෙන්නේ

මෙය වගකීම තිබෙන විදියට ආරක්ෂා කර දෙන්න කියන එකයි අපේ අදහස. අපේ ළඟ තිබෙන එක අපට අහයක් නැතිනම් පිට මිනිහෙකුට අහයක් තිබෙන්න විදිහක් නැහැනේ. එමනිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මෙය අපේ යටතේ තියා ගන්න. යම් මොනවා හරි ඒ අයගේ උපසේ පරිදි ක්‍රියා කරන්න. නැතිනම් මෙය එක එක්කෙනාට පැවරීමේ තත්ත්වය යටතේ මෙහි විනාශකාරි තත්ත්වයන් ඇති වුණා. අන්තිමට වගකියන්න වෙන්නේ කවුරුවත් කරන එකට නගර සභාවට. මා ඉල්ලා සිටිනවා අපේ වත්කමක් හැටියට එය ආරක්ෂා කර ගනිමින් කටයුතු කරන්න කියා .

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු රාහුල මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ අකාරයට. ඓතිහාසික ස්ථානයක්. අම්බලන්ගොඩ නම රැකෙන ස්ථානයක්. එතුමා ප්‍රකාශ කළ ආකාරයට මෙය සංරක්ෂණය විය යුතුයි. මෙහි අයිතිය සභාවට තිබෙන්න ඕන. වගකීම පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට තිබෙන්න ඕන . මෑතකදි වෙච්ච සිද්ධීන් අපි දන්නවා . මෙහි සංරක්ෂණ කටයුතු පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් සිදු විය යුතුයි. නැතිනම් සභාවක් හැටියට මෙය අපට සභාවෙන් කරන්න බැහැ. හැබැයි එය සභාව සතු දේපලක්. එය පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට පවරනවාට වඩා අපේ යටතේ තිබිමත් එහි සංරක්ෂණ කටයුතු පුරා විද්‍යා දෙපාර්තමේන්තුව හරහා කිරිමත් මොකද එහි පුරා විද්‍යා දෙපාර්තමේන්තුව සතු දේපලක් සංරක්ෂණ කටයුතු අපට කරන්න බැහැ . පුරා විද්‍යා සතු දෙයක් සභාවකට තියා කාටවත් කරන්න බැහැ . එම කටයුතු සිදු කළත් අපි පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ අවසර ලබා ගෙන ඕන සිදු කරන්න . මෙහි සංරක්ෂණ කටයුතු පුරා විද්‍යා දෙපාර්තමේන්තුව සතුව තිබිලා මෙහි අයිතිය පමණක් ගරු රාහුල මන්ත්‍රීතුමා කිවූ පරිදි අයිතිය සභාව සතුව තිබුණොත් හොඳයි කියන එකයි මාගේත් අදහස. මා හිතනවා මෙය සභාව සතු වුණත් මෙහි සංරක්ෂණ කටයුතු පුරා විද්‍යා දෙපාර්තමේන්තුව හරහා මෙය ආරක්ෂා කිරිම හොඳයි කියා. පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ සිටිනවා මෙහි ආරක්ෂක කටයුතු සිදු කරන අය. දැනටමත් මා හිතන්නේ මෙහි එක්කෙනෙක් හරි දෙදෙනෙක් හරි ඉන්නවා. එමනිසා ඒ කටයුතු ඒ විදියට සිද්ධ කරන්න. එහි අයිතිය සභාව සතුව තිබෙන්න හරින්න. මොකද මෙය ඉතිහාසයේ සිටම සභාව සතුව තිබුණ දෙයක්. නැතිනම් අපි මෙය ලබා දුන්නොත් ඉදිරියේදි වරදකරුවන් හැටියට නගර සභාව පත්වෙනවා. කවුද මෙහෙම ලබා දුන්නේ කියා. දැන් තනායමේදිත් ඒ සිද්ධිය වෙලා තිබෙනවා. නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගත් පසු ඒ සිද්ධිය වුණා. එහි තිබෙන වගකිමත් අපට 50%ක් හෝ ආවා. නමුත් පවරා ගැනීමේ කටයුතු සිදු කළේ ඒ ආයතනය. නැවත අපට පවරා දෙනවිට මෙය සම්පූර්ණ විනාශ වෙලා තිබුණේ. එමනිසා මේ තත්ත්වය ඇති කරන්න දෙන්න

එපා. මෙක සභාව සතු දේපලක් විදියට තියා ගන්න. සංරක්ෂණ කටයුතු සහ මෙහි ආරක්ෂා කිරිමේ කටයුතු පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දුර අතිතයට දිවෙන මේ මහඟු සම්පත අපේ නගර සභාව සතු වත්කමක්. එය කිසිසේත්ම අනුනට පැවරිමෙන් අපේ වටිනාකම අඩුවිමක් සිදු වෙනවා. ගරු රාහුල මැතිඳුන් , ගරු උපසභාපතිතුමා කිවූ ආකාරයට මේ වත්කමේ අයිතිය තව දුරටත් තබා ගෙන කළහැකි සංවර්ධනයක් වෙතොත් විමසා මේ කටයුතු සිදි කිරිම සුදුසු බවයි අපි අදහස් කරන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි මෙය මෙහෙම කරන්න. පුරා විද්‍යා දෙපාර්තමේන්තුවත් සමඟ සාකච්ඡා කරන්න. දැනට අපි අපේ ගිවිසුමේම සඳහන් කර තිබෙනවා මේ කොටසට කිසිම දෙයක් කරන්න බැහැ කියා. අනිත් ඉදිකිරිම් කරන්න ඕන කියා. තවත් මේ සමඟ ලිපියක් තිබෙනවා. මේ පුරා විද්‍යා ස්මාරකය අපේ තහවුරු වූ භූමිය වෙන්කරගෙන කරන තුරු සංවර්ධනය කිරිමේ කටයුතු සඳහා පුරා විද්‍යා නිර්දේශය ලබා දෙනතුරු සිදු නොකල යුතු බවට නිර්දේශ ලබා දි තිබෙනවා. ඒ කියන්නේ දැනට මේ ලිපිය එවන්න ප්‍රධාන වශයෙන්ම හේතු වුණේ අදාල අපෙන් බදු ගත් සමාගම පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් අවසර ඉල්ලා තිබෙනවා මේ ඉදිකිරිම් කරන්න. එතකොට මේ අය යොදන උපක්‍රමයක් තමයි සභාවට මේ ඉඩම පවරන්න අපි මෙහි අනුමැතිය දෙන්නම් කියා. එමනිසා මෙකෙදි අපි පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට අපි කණ්ඩායමක් ගිහින් අපි සාකච්ඡා කරන්නම්. අපේ තත්ත්වයක් කියා. එගොල්ලන්ගේ තත්ත්වයක් කියා. අපෙ෮ මෙතෙක් කල් අම්බලන්ගොඩ නගර සභාව මෙහි පුරා විද්‍යා වටිනාකම ආරක්ෂා කර තිබෙනවා. කාටවත් මෙය බදු දිලත් නැහැ. වෙනත් කාර්යක් සඳහා මෙය යොදවලත් නැහැ. අපි මෙය ආරක්ෂා කර තිබෙනවා. පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් සිදු කරන හැම දෙයටම අපි උදවු කර තිබෙනවා. අපි නෙමේ මෙය රජය විසින් ඡන්ද මධ්‍යස්ථානයක් බවට පත් කර තිබෙනවා. මන්ත්‍රිවරු වශයෙන් අපි ගිහින් මෙය පුරා විද්‍යා දෙපාර්තමේන්තුවත් සමඟ සාකච්ඡා කරන්නම්. මෙහිදි අපේ බාධකය වෙලා තිබෙන්නේ අපි බදු දිපු ආයතනය දැන් අපහසුතාවයට පත්වෙලා තිබෙනවා. මෙය අනුමත කිරිම සඳහා පුරා විද්‍යා ආයතනයේ නිර්දේශය දෙන්න ඒ අය ඉල්ලන දෙයක් තමයි මේ ඉඩම අපිට පවරා දෙන්න කියා. එගොල්ලන්ටත් අවබෝධ කර දිය යුතුයි මෙය සභාව සතු දෙයක් කියා. මෙය වටිනා ස්ථානයක්. මාසයකට රුපියල් දෙකක ආදායමක් ලබනවා. ඒ කියන්නේ ඒ අවශ්‍ය පසුබිම නැති වුණත් ඒ ස්ථානය සඳහා අපිට බද්දක් ලැබෙනවා. ලක්ෂ තිහක පමණ වාර්ෂික ආදායම ලබන

ස්ථානයක්. මෙතනදි අපි මෙය දියුණු කර ගන්න ඕන . මෙතැන තිබෙන පරණ තනායම වෙනුවට අනුව එය ඉදිකරන්න ඕන. ඒ වගේම අපේ ව්‍යාපාරිකයන්ට අපේ ගමේ ජනතාවට රැකියා අවස්ථා ලබා දෙනවා. ඔය සියල්ලම අපි සලකා බලා මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම වඩා සුදුසුයි. මා හිතනවා මෙයට පුරා විද්‍යා දෙපාර්තමේන්තුවත් සමඟ සාකච්ඡාවක් ඉල්ලා අපි සාකච්ඡාවකට යන්. එයට මන්ත්‍රීවරු කණ්ඩායමක් මාත් සමඟ යන්. කැමැත්තෙන් ඉදිරිපත් වෙන්න මන්ත්‍රීවරු. සරත් චන්ද්‍ර මන්ත්‍රීතුමා , ශ්‍රේෂන් මන්ත්‍රීතුමා . ධර්මදාස මන්ත්‍රීතුමා , සෝභිත මන්ත්‍රීතුමා , අයිරාංගනී මන්ත්‍රීතුමා , නිලානි මන්ත්‍රීතුමිය ඇතුළු මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් මේ සඳහා සහභාගි වෙන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී . සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මේ ලිපිය පරිදි අපිට තිබෙනවා චෝදනාවක් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන්. මේ ගරු සභාවට තමයි මේ චෝදනාව දමා තිබෙන්නේ. ඉතිහාසයේ මේ කෞතුක ස්ථාන විනාශවෙලා ගිහින්. මෙය දකුණු පළාත් සභාව සතුව කාලයක් තිබුණා. නාගරික සංවර්ධන අධිකාරිය සතුව කාලයක් තිබුණා. ඒ කාල වකවානුවට අපිට පැවරුන දේ තමයි අපි භාර ගත්තේ. වක්‍රකාරව සභාව සතු දේ විනාශ වෙනවා කින එක තමයි සඳහන් කරන්නේ අපිට චෝදනා කර තිබෙන්නේ. අනිත් එක පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට අයිති කිසිම දෙයකට අනවසරයෙන් ඇතුල් වෙන්න බැහැ. අනිත් පැත්තට සංරක්ෂණ කටයුතු සියළු දේ කරන්නේ ඔවුන්. තින්ත පවා ආලේප කරන්නේ ඒ අයගෙන් එන අය. වෙන පිට අයට තින්ත ගාන්න බැහැ. උදාහරණයක් විදියට මහ අම්බලන්ගොඩ මහපන්සලේ තිබෙන ස්මාරකය පන්සල සතු ඉඩමේ තිබෙන්නේ. ඒ අය තමයි ඇවිත් සියළු සංරක්ෂණ කටයුතු සිදු කරන්නේ. පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට අයිති වුණාට පසු ඒ අය තමයි සංරක්ෂණ කටයුතු සිදු කරන්නේ. ඒ අය නිලධාරින් දමා එය ආරක්ෂා කරනවා. අපි ගැටුමකට යාමට අවශ්‍ය නැහැ. එකම දේ අපේ සභාව සතු දේපල අවසතු කිරීමේ අවශ්‍යතාවයක් නැහැ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අපි මෙය සාකච්ඡා කර අවසන් කරන්න. අපිට සභාව කියන දේ වැටහෙනවා. සභාව අපේක්ෂා කරන්නේ මේ පුරා විද්‍යා ස්මාරකය සභාව යටතේම තියා ගෙන පුරා විද්‍යා පරිපාලනය යටතේ පවත්වාගෙන යැමටයි. අද වෙනකම් මේ සභාව එහි ඇණයක් වත් කඩලා නැහැ. අපි කර තිබෙන්නේ හැමදාම එය සංරක්ෂණය කිරීමට උදවු කර තිබෙනවා .

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, දැන් මෙය ඔබතුමලාගේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව භාර ගන්නා අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කරන්න. සභාව ඉල්ලන්නේ අපේ වස්තූන් අපි රකින්න ඔනේ. මෙය සංරක්ෂණය කිරිමෙන් විශාල මුදලක් අයකරගන්න පුළුවන්. මොකද පැරණි ගොඩනැඟිලි සංරක්ෂණයෙන් නගර සභාවට දැන් ලැබෙන ආදායමට වඩා වැඩි ආදායමක් ලබා ගන්න පුළුවන්. පුරා විද්‍යා නිලධාරින්ට වඩා ගරු ඇමතිතුමා සමඟ සාකච්ඡා කරන්න. එතකොට මෙය විසඳා ගන්න පුළුවන්. එය කරන්න කියා ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මෙය සාකච්ඡා කර ගන්න ඕන තීරණ ගන්න. සාකච්ඡා කර ගනු ලැබූ තීරණ ගෙන සභාවට ඉදිරිපත් කරන්න.

<u>**ගරු නගර සභා සෝභිත රංජිත් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මා ගිය සභාවේදි විමසා සිටියා තානයම භූමියේ පිහිටි වසර 150ක් පමණ පැරණි ගසක් ඉවත් කිරිම සම්බන්ධව. දැන් ඔබතුමා ගිය සභාවේදි වාර්තාව ඉදිරිපත් කරන්නම් කිවුවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

දැනට කර තිබෙන ටික ලේකම්තුමිය විසින් විස්තර කරනු ලබයි.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මා කනගාටු වෙනවා. ලේකම්තුමියගේ එම පිළිතුරට. හරිම කනගාටුයි . මා හිතන්නේ නැහැ ඔබතුමා ඉදිරිපත් කර පිළිතුර රාජ්‍ය ආයතනයක ප්‍රධානියෙක් හැටියට මෙවැනි පිළිතුරක් ඉදිරිපත් කිරිම ගැන කනගාටු වෙනවා. මොකද රාජ්‍ය දේපලක යම්කිසි ගසක් කපා ඉවත් කළහොත් සංවර්ධනය සඳහා වුණාට කමක් නැහැ. අඩුම ගණනේ එම ගසේ කඳ කොටස සභාව සතු වෙන්න ඕන. නැතිනම් එය රාජ්‍ය දැව සංස්ථාවට භාර දෙන්න ඕන. මේ වෙනකම් අපෙනුත් ජනතාව එක එක දේවල් අහනවා. නමුත් මේ වෙනකම් මොකුත් ක්‍රියාමාර්ගයක් ගත්තේ නැති එක ගැන කනගාටු වෙනවා. ගිය සභාවටත් මට එන්න බැරි වුණා. මා මෙය ගිය සභාවටත් කතා කරන්න හිටියේ. මොනයම් ගසක් හෝ කඳුරු ගසක් හෝ කැපුවා නම් එහි දැව ඒ දැව කඳන් රාජ්‍ය දැව සංස්ථාවට භාර දෙන්න ඕන. නැතිනම් සභාව සතුව තිබෙන්න ඕන. නැතිනම් මෙය වෙන්දේසි කරන්න. මෙහි වටිනාකම අවශ්‍ය නැහැ. මෙහි වටිනාකම රු.50ද ඒ තියෙන්න ඕනේ සභාව සතුව. මේ වෙනකොට කිසිම දෙයක් නැහැ. මට ගස ඉවත් කිරිම

සම්බන්ධව කිසිම ගැටළුවක් නැහැ. මේ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ගයයි මට අවශ්‍ය වෙන්නේ. මොකද ඔබතුමිය හොඳටම දන්නවා. මේ දේවල් ක්‍රියාත්මක වෙන්න ඕන මොනවාද කියා. ගසක් කැපුවාම එහි කොටුවක් හෝ කිසිම මිනිහෙකුට ගෙනියන්න බැහැ. අපි බදු දුන්නාත් කිසිම ආයතනයකට එය ගෙනියන්න බැහැ. එය සභාවේ දේපලක් වශයෙන් තිබෙන්න ඕන. එමනිසා එය මේ වෙනකොට නැතෙයි කියා තමයි මිනිසුන් කියන්නේ. එමනිසා මේ සම්බන්ධව ඉතා ඉක්මනින් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා , දැන් සාමාන්‍යයෙන් මන්ත්‍රීවරුන්ට

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීවරුන් අදහස් දක්වන වන විට විටින් විට අදහස් දක්වන්න එපා. එකපාරක් විතරක් අදහස් දක්වන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මා දැන් මෙයට පලමු වරට අදහස් දක්වන්නේ. දැන් මෙයට ගිවිසුමක් ගැසුවේ එම ගොඩනැඟිල්ලක් හදන්න. ඒ කියන්නේ හෝටල් සංචිතයක් හදන්න. එතකොට ඔය ගිවිසුමේ තිබෙනවාද ? මේ සම්බන්ධව. සටහන් කර තිබෙනවාද ? ගිවිසුමත් බැලුවාද ලේකම්තුමිය. ගිවිසුමක් ගහලා මෙය භාර දිලා තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**මේ ඔය ප්‍රශ්නය අහන්න එපා. ඔබතුමා හිටපු මන්ත්‍රීවරයෙක්. මේ සභාව සම්මත කරලා අත ඔසවා සියළු දෙනාගේ සම්මුතියක්. එතකොට මේ ලේකම්තුමිය මේ ඊයේ පෙරේදා ආවේ. එක වැරදියි. එහෙම අහන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එකනේ කියන්නේ. ඔබතුමා කියන දෙය අහන්න. ඇහුම්කන් දීම තිබෙන්න ඕන මේකට. අපි ඔබතුමාගෙන් හැම තිස්සේම බලා පොරෝත්තු වෙන්නේ . දැන් අපිට ඔය ගිවිසුමේ හැම වගන්තියක්ම අපිට මතක නැහැ. අපිට ඕන මෙය කරන්න. එහෙනම් ඔබතුමිය වාර්තාව දෙනවිට මෙකත් දෙන්න ඕන. දැන් මේක කපලා ඉවරයි. වරදක් මේක. ලොකු වරදක්. වරද වෙලා තිබෙන්නේ වාර්තාව අනුව මොකක්ද සිද්ධ වෙලා තියෙන්නේ කියන එකත් අපිට ඉදිරිපත් කරන්න. ඊළඟ සභාවට. දැන් මෙය අවුරුදු 150ක් විතර පැරණි ගසක්. මෙයට හදිස්සියේවත්

නිත්‍යානුකූල තත්ත්වයක් දි තිබුණොත් එහෙම බොරුවක් වෙනවා. එමනිසා එම කරුණු ලබන සභාවට ඉදිරිපත් කරන්න කියා අප ඉල්ලා සිටිනවා.

**තීරණය -**

ඓතිහාසික අම්බලන්ගොඩ ඕලන්ද ස්තාලය දෙපාර්තමේන්තුවට පවරා ගැනීම සම්බන්ධව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපිය අනුව ඒ සම්බන්ධව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කිරීමට පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් සහභාගී වන ලෙස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් දැනුම් දෙන ලදී.

ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා

ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිනියගේ මහතා

ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස ද සිල්වා මහතා

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා

ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය

ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය

ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය

**03.13 මහජන ක්‍රීඩාංගනයේ තණතිලිවල නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය ක්ලේ කවර ලබාදෙන ලෙස ඉල්ලා සහන් සංකල්ප මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපsය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

සහන් සංකල්ප , ක්‍රිඩාභූමි භාරකරු. සහන් සංකල්ප. සංවර්ධනය වන මහජන ක්‍රීඩාංගනයේ ඉදිරියට කටයුතු පවත්වාගෙන යාමේදි ඒ සඳහා කලේ අවශ්‍ය වනු ඇත. එබැවින් ඒ සඳහා අවම වශයෙන් කලේ කවර පනහක් ( 50 ) පමණ වන තොගයක් තබාගත යුතුව ඇත. එබැවින් එම කටයුතු ඉටුකර ගැනීමට අවශ්‍ය ඉදිරි පියවර සලසා දෙන මෙන් ඉල්ලා සිටි. මෙය තාක්ෂණසේවා නිලධාරි මහතා විසින් නිර්දේශ කර තිබෙනවා. ඒ සඳහා අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙය සභාවෙන් කරන දෙයක්ද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නැහැ. නඩත්තු කිරිම සඳහා ඉදිරියට.

**තීරණය  -**

මහජන ක්‍රීඩාංගනයේ තණතිලිවල නඩත්තු කටයුතු සඳහා  ක්ලේ කවර 50 ක් ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර  කරන ලදුව සභා සම්මත විය.

**03.14 නගර සභා පරිශ්‍රයේ නවතා ඇති වාහන ගාල් කිරීම සඳහා රථගාලක් ඉදිකිරීම යන මැයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නගර සභා පරිශ්‍රයේ නවතා ඇති වාහන ගාල් කිරිම සඳහා රථගාලක් ඉදිකිරිම . උක්ත කරුණට අදාළව 2020.07.21 දින මා විසින් සිදු කරනු ලැබූ ස්ථාන පරික්ෂාව අනුව පහත කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි. නගර සභාවේ ප්‍රධාන කාර්යාලය පිහිටි පරිශ්‍රයේ අක්‍රමත්ව ලෙස ට්‍රැක්ටර් හා යන්ත්‍රෝපකරණ ගාල්කර තිබීම මත එම පරිශ්‍රයේ අලංකාරයට සහ එහි පැමිණෙන සේවාලාභින්ගේ ආරක්ෂාවට අහිතකර බලපැමක් ඇතිවන බව මා විසින් නිරික්ෂණය කරමි. එමෙන්ම එම රථවාහන අව්වැසිවලින් ආරක්ෂාවීමට ආවරණයක් නොමැතිව ගාල් කර තැබීම මඟින් ඒවායේ  කල්පැවැත්ම හා ආයුකාලය අඩුවීම ද සිදු විය හැකි බව නිරීක්ෂණය විය.  ඒ අනුව ඉහත කරුණු පිළිබඳ ඔබ සභාවේ අවධානය යොමු කර ප්‍රධාන පරිශ්‍රෙයන් පිටත සුදුසු ස්ථානයක නිසි ආවරණයක් හා ආරක්ෂාවක් සහිත ස්ථානයක රථවාහන හා යන්ත්‍රෝපකරණ ගාල් කිරිමට කටයුතු කරන ලෙස කාරුණිකව නිර්දේශ කරමි. මේ සඳහා අද දින මාගේ පරික්ෂාවට ලක්වූ ඔබ සභාවට අයත් හල්වතුර ප්‍ර දේශයේ නේවාසික ප්‍රදේශයක පිහිටි ඉඩම යොදා ගන්නේ නම් මහජන පිඩාවන් ඇති නොවන පරිදි සියලු ආරක්ෂිත ක්‍රියාමාර්ග හා නෛතික සිමාවලට අනුකූලව වාහන අංගනයක් ඉදි කර පවත්වාගෙන යාමට පියවර ගන්නා ලෙසද කාරුණිකව දන්වමි.  කියා පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ලිපියක් එවා තිබෙනවා. එය දැන ගැනීම සඳහා සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , කවදාද එම ලිපිය එවා තිබෙන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙය එවා තිබෙන්නේ 2020.07.22

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඔය ලිපිය සම්බන්ධව අපි පොඩ්ඩක් කතා කළ යුතුයි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපි ඉල්ලීමක් කර තිබෙනවාද පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් මෙය මේ විදියට කරන්න කියා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පළාත් පාලන කොමසාරිස්තුමා අම්බලන්ගොඩ නගර සභාවේ නිරික්ෂණ කටයුත්තක් සඳහා පැමිණියා. ඒ පැමිණි වේලාවේ එතුමා අහපු ප්‍රශ්නයක් තමයි ඇයි මේ වාහන මෙහෙම දමා තිබෙන්නේ. ඕක තමයි අහපු ප්‍රශ්නය.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

එහෙම නැතිව ඉල්ලීමක් කරලා නෙමේ නේද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නැහැ. මා මෑත කාලයේ සභාව ගත් තින්දුව කිවුවා. මේ සභාව ගත් තින්දුව අනුව මෙක කරන්න බැහැ කිවුවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙතැන මහජනතාවගේ ඡන්දයෙන් පත් වු මන්ත්‍රීවරු සිටින්නේ. අපි මෙතැන සභාව ගන්න තින්දු පළාත් පාලන කොමසාරිස්තුමාට ඕන විදියට වෙනස් කරන්න බැහැ. ගරු සභාපතිතුමා ඇතුළු මේ මන්ත්‍රීවරුන්ට කරන හැල්ලුවක්. එත අගෟරවයක්. මා එමනිසා ඉල්ලීමක් කරනවා අපි මේ සභාවේ ගන්න තීරණයක් පළාත් පාලන කොමසාරිස්තුමාට එහෙම අයිතියක් නැහැ. සභාවේ ගන්න අයිතියක් පළාත් පාලන කොමසාරිස්තුමාට කරන්න. එහෙම කරනවා නම්

සභාවක් අවශ්‍ය වෙන්නේ නැහැ පළාත් පාලන ආයතන ගෙන යාමට. කරුණාවෙන් ඉල්ලා සිටිනවා මේ වගේ කටයුක්තකදි මේ වගේ දෙයක් කරන විට ගරු සභාපතිතුමා , මන්ත්‍රීවරු සමඟ සාකච්ඡා කර කරනවා නම් කිසි ගැටළුවක් නැහැ. හැබැයි මෙතැන සිටින ගරු මන්ත්‍රීවරු හැල්ලුවට ලක් කරන්න එපා කියන සිද්ධිය මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා . දිගින් දිගටම ඔබතුමා දන්නවා අපිට තිබුණ කාර්ය . අපිට මෙතැන ලක්ෂ 20ක වැඩ කරන්න තිබුණා. අපිට කරන්න තිබුණ කාර්ය ලක්ෂ 5 දක්වා අඩු කළා. අපේ රජයක් ආවාට පසු තමයි අපි කතා කර මෙය ඉල්ලා ගත්තේ. මා නිලධාරින් කියන දෙයට මේවා වෙනවා නෙමේ. මේ ගරු සභාවේ ගන්න තීරණ වෙනස් කිරිමේ හැකියාවක් කොමසාරිස්තුමාට නැහැ කියා මේ අවස්ථාවේදි ප්‍රකාශ කරනවා. එහෙමනම් මේ සභාව අවශ්‍ය වෙන්නේ නැහැ. නිලධාරින්ට ඕන විදියට මේ සභාව පාලනය කරන්න පුළුවන්. එමනිසා කරුණාවෙන් ඉල්ලා සිටිනවා මේ ගන්න තීන්දු පළාත් පාලන කොමසාරිස්ට යට කරන්න දෙන්න එපා කියන ඉල්ලිම කරනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අපිට උපදේශයක් දි තිබෙන්නේ. සභාවට ඕන නම් පිළිගන්නත් පුළුවන්. නැතිනම් නිකං ඉන්නත් පුළුවන්. සභාවේ බහුතර කැමැත්ත අනුව වැඩ කරන්න පුළුවන්. සභාවේ බහුතර කැමැත්ත අනුව කරනවා මිසක ආයේ කිසිම විටක ඊට එහාට ගිහිල්ලා නැහැ. හැබැයි මතක තියා ගන්න කොමසාරිස්තුමාට අපේ සභාවට උපදෙස් දීමේ බලය තිබෙනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්**

බලය තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී  රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

අපිට ටිකක් කතා කරන්න පුළුවන්ද ?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

නැහැ කතා කරන්න දෙයක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී  රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

වාර්තාවේ තිබෙනවා. ගිය සභාවේ කතා කරලා . මහජන විරෝධය තිබෙන නිසා මෙය අපි එතැන වාහන අංගනය ඉදිකිරිම සම්බන්ධව

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි අපි එම ඉදිකිරිම අයින් කර තිබෙන්නේ. එක කර තිබෙන්නේ. කතා කරන්න දෙයක් නැහැ. වෙනින් එකක් කරන්න පුළුවන්. පොදු වෙළඳපොළ එහෙම ගහන්න පුළුවන් ගිහින්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඒකාධිපති පාලනය කරන්න ලැහැස්ති වෙන්න එපා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මොළේ තිබෙන විදියට තමයි වැඩ කරන්න වෙන්නේ. ඇණ කිරුවාම මොළයක් නැහැ. පාසැල් යන්න ඕන මන්ත්‍රීතුමා. ඇණ කිරලා හරි යන්නේ නැහැ . පාසැල් යන්න.

**තීරණය -**

**නගර සභා පරිශ්‍රයේ නවතා ඇති වාහන ගාල් කිරීම සඳහා රථගාලක් ඉදිකිරීම** යන මැයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපිය ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

**03.15 2020 ප්‍රජා සහභාගීත්ව අයවැයකරණය සඳහා යෝජනා ලබාගැනීමට පෝස්ටර් මුද්‍රණය කිරීම සඳහා රු.15000/- ක් වියදම් දැරීමට අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2021 වර්ෂයේ අයවැය ලේඛණ සම්පාදනය සඳහා අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ කොට්ඨාශ 13ට අදාලව ප්‍රජා මණ්ඩල මට්ටමින් දැනුවත් කිරිම , අදහස් හා යෝජනා ලබා ගැනිම හා ප්‍රජා මණ්ඩල ප්‍රතිසංවිධානය සඳහා එක් වසමකට 25 බැගින් වන සේ අඩි 25 ප්‍රමාණයේ වර්ණ පෝස්ටර් 325ක් මුද්‍රණය කිරිම සඳහා රුපියල් 15000/= ක මුදලක් වියදම් වශයෙන් දැරිමට නිසි අනුමැතිය ඉල්ලා සිටිනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මේ ඇස්තමේන්තු අනුමත කිරීමේ ගැටළුවක් නැහැ. හැබැයි මේ කරණ ක්‍රියාවලියේ සාර්ථකත්වයක් තිබෙනවාද කියා මට ප්‍රශ්නයක් තිබෙනවා. ජාතික විගණකාධිපති මහත්මිය එවන ලද විගණන වාර්තාවේ ප්‍රකාරව ගිය සභාවේ මේ සම්බන්ධව තිබෙනවා විගණක වාර්තාවේ තිබෙනවා 2019 අයවැයේ මේ ආකාරයට සමාන වැඩසටහන් 13ක් පවත්වන ලද යෝජනා වලින් 4% ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. 90% ක් ක්‍රියාත්මක වෙලා නැහැ කියා. මෙය බරපතල තත්ත්වයක්. එකයි මා මෙයට අනුමැතිය දෙන ගමන් කිවුවේ. 4% ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. 90% ක් ක්‍රියාත්මක වෙලා නැහැ. අන්න එකයි මා කිවුවේ මෙය කතා කිරීමේ වැඩක් තිබෙනවාද කියා. ජාතික කාර්යාලයේ විගණකාධිපති මහත්මිය එවා ඇති විගණක වාර්තාවේ ප්‍රකාරව තිබෙනවා 2019 අයවැයේ ප්‍රකාරව ප්‍රා දේශීය වසම් 13ක් මුල්කර ගෙන කරන ලද යෝජනා වලින් 4%යි ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. 96% ක්‍රියාත්මක වෙලා නැහැ කියා. මෙය බරපතල තත්ත්වයක්. එකයි කිවුවේ මෙයට අනුමැතිය දෙන ගමන් මා කිවුවේ මෙහි තේරුමක් තිබෙනවාද කියා. ගම්මු කැඳවා අපි යෝජනා ගෙන සභාවට මෙය දෙන එක. ඒ 2019 වසරේ. මා දන්නේ නැහැ 2018 වසරේ කොපමණ ක්‍රියාත්මක වෙලා තිබෙනවාද කියා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ගම්මුන්ට අවස්ථාව තිබෙන්න ඕන තමන්ගේ කොට්ඨාශයේ පාලකයන්ට හොඳ හරි නරක හරි කියන්න. බැණුම් අහන්න හරි ලැහැස්ති වෙලා අපි එය තියන්න ඕන. එය අපේ වගකීමක්. සමහර මන්ත්‍රීවරුන්ට මුදල් දුන්නාම වැඩ කරන්නේ නැහැ. වැඩ කරන්නේ නැතුව එහෙම කියන්න එපා. එතනට ගිහින් කතා කරන කොට ගම්මු ඉදිරිපිටදී ඒ මුදල් දී වැඩ කරන්නේ නැති හේතුවට උත්තර දෙන්න මන්ත්‍රීවරු ලැහැස්ති වෙලා ඉන්න. ඒක මතක තියා ගන්න. මා මුදල් දීමෙන් වැලකී නැහැ. අදටත් සපිරි ගමක් වැඩ සටහන යටතේ ලක්ෂ 20 ගණනේ හැමෝටම දුන්නා. එම ලක්ෂ 20 වැඩ කර තිබෙන්නේ කී දෙනාද ? තමන්ගේ කොට්ඨාශය තුළ වැඩ නොකර අඩුයි කියනවා. මෙතැන තමන්ගේ කොට්ඨාශයේ ජනතාව කරන යෝජනා අපි එතනට දමා තිබෙනවා. තමන්ගේ කොට්ඨාශයේ වැඩ කරන්න. අපිට මිනිසුන් ඉදිරිපිට වැඩ කිරීමේ හැකියාව තිබෙන්න ඕන. නැතිනම් මන්ත්‍රීකම නොගෙන ඉන්න ඕන. අපිට වැඩ කරන්න බැරිනම් අපි මෙතැන දලා යන්. අපි ජනතාවට ඇත්ත කියන්න ඕන. ඇයි අපිට වැඩ කරන්න බැරි වුණානම් වැඩ කරන්න බැරි වුණේ ඇයි. එහෙනම් වැඩ කළානම් වැඩ කළේ ඇයි. ඇයි අපි අකර්යක්ෂම වුණේ ඇයි. මේ සම්බන්ධව ගිය වසරේ අයවැය පසු විපරම් රැස්වීම් 4ක් 5ක් තියා තිබෙනවා. මන්ත්‍රීවරු කී දෙනාද ආවේ. ඒ ආපු හැම වේලාවේම අහලා තිබෙනවා ඔයාගේ කොට්ඨාශයට මෙච්චර වැඩ කර තිබෙනවා. මෙච්චර මුදල් දී තිබෙනවා. ඇයි මේ වැඩ කොටස ඉවර කර නැත්තේ. කියන ප්‍රශ්නය

අසා තිබෙනවා. මා ඕනනම් ඒ සියළුම වාර්තා ලබන සභාවට දෙන්නම්. කී දෙනාද ඒ රැස්වීම් වලට පැමිණ තිබෙන්නේ. අවශ්‍ය වැඩ කොටස් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපති ඒ නම් එක්කම කියන්න. අපි සහභාගි වී තිබෙනවා ඒ හැම එකකටම.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නම් වශයෙන් ලබන සභාවට ඉදිරිපත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මොකද හේතුව අපි හැමදෙයකටම සහභාගි වෙනවා. නම් වශයෙන් දෙන්න. අපි හැමදෙයටම සහායෝගය දෙනවා. ඔබතුමාට මතක නැතු වුණාට අපිට කරන්න දෙයක් නැහැ . මේ ගත් ප්‍රජා මණ්ඩල මඟින් ගනු ලබන යෝජනා කියක් මේ වන විට ඉටු වෙලා තිබෙනවාද? එකයි අපි කියන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එකනිසා තමයි ජනතාව ඉදිරියට මෙය ගෙනියන්නේ

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එකට අපි විරුද්ධයි. මේ දාපු ටික ඉටු කර ඉන්න. ඕන වේලාවක දෙන්න සංඛ්‍යාවත් එක්කම. මෙකේ තිබෙනවා ඕකන්දට දාපු ඒවා. මටනම් ඔබතුමා විදුලි ලාම්පුවක්වත් දමා දෙන්නේ නැහැ. මට ඔනෙත් නැහැ. නමුත් මහජනතාවගේ වැඩ කරන්න ඕන. ඔබතුමාගේ සැලසුම හොඳයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමාගේ අලුත්වැඩියා කටයුතු සිදු කරන්නේ නැද්ද? අර බාල ලී දමා හදපු එක. එතකොට ප්‍රජා ශාලාව හැදුවේ කවුද ? බාල ලී දමා කඩන් වැටෙන විදියට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

පොඩ්ඩක් ඉන්නකෝ කියනකම්. මේකට අපි වියදම් කරන්න ඕන වේලාවක ලැහැස්තියි. මේ ටික අවසන් කර ඊට පස්සේ ප්‍රජා කමිටු පත්කර මෙය අවසන් කරන්න. කොට්ඨාශ වල අවසන් කර මෙය පටන් ගන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මන්ත්‍රීතුමා, ඔබතුමාට බොහොම ලේහෙසියි . අපි පාලකයෝ. අපි වැඩය කලේ නැති එක ගමේ මිනිසුන් ඉදිරිපිටදි කතා කරන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. අපි එකට මුහුණ දෙන්න ලැහැස්තියි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඔබතුමාගේ කුණ්ඩවාලත් කරගහගෙන අපි එවත් ඉවර කරනවා. ඔබතුමා කොට්ඨාශයට ගිහින් අපිට බනිනවා. ඒක වෙනම කතන්දරයක්.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ඊළඟ එකට යන්.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතමා, මටත් වචනයක් කතා කරන්න ඕන.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මටත් ටිකක් කතා කරන්න ඕන.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මන්ත්‍රීතුමා මිනිසුන්ට අපි පත් කළා වගේම අයිතියක් තිබෙනවා ඒ ගමේ වැඩ කොටස කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඒ මිනිසුන් ප්‍රශ්න කරනවා අපි වැඩ කර නැහැ කියා

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මා කරලා නැහැ නෙමේ. මන්ත්‍රීතුමලා කරලා නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

ඔබතුමා බලයක් දෙන්නේ නැහැනේ අපේ මන්ත්‍රීවරුන්ට. ඔබතුමාගේ පක්ෂයේ කට්ටියට විතරයිනේ ඔබතුමා බලයක් දෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ හැමෝටම දී තිබෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඔබතුමිය එහෙම කතා කරන්න එපා . කොට්ඨාශේ මන්ත්‍රීවරුන්ගේ වැඩ කොහොමත් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

ඔබතුමාට නෙමේ සභාපතිතුමාට කතා කිරීමේ අයිතියක් තිබෙනවා. මමත් මන්ත්‍රීවරියක්. ඔබතුමා කොහොමද මට එහෙම කතා කරන්නේ. මට කතා කරන්න පුළුවන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමිය, මේ ළඟදි බොක්කුවක් ගෙනත් කොන්ත්‍රාත් එක කළේ ඔබතුමියගේ කොට්ඨාශයේ නෙමේද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

වැඩේ කළේ නැහැ තාම.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලක්ෂ 15කට වැඩි වැඩ කොටසක්. අපි එහෙම විරුද්ධ පක්ෂයේ කියා නැහැ. වැඩය කරන්න ඕනනම් කර දෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

පොඩ්ඩක් ඉන්න. ඔබතුමාගේ මන්ත්‍රීතුමාගෙන් ගෙන්න කියනවා නිතරම . අපිත් හැල්ලුවට ලක් කරන්න එපා. අපිත් මන්ත්‍රීවරු. ඔබතුමා නිතරම කියනවා. දැන් බලන්න මහ අම්බලන්ගොඩ වසමේ විදුලි කණු හා දුරකථන කණු ඉවත් කිරීම. මා දන්නේ නැහැ. 2004 මා අයින් වුණේ එදා

සිට කිත්සිරි මන්ත්‍රීතුමා ද කරන්න ගියා. තාම කෙරිලා නැහැ. මෙතනින් තමයි කෙරෙන්න ඕන. ලක්ෂ්මි මන්ත්‍රීතුමිය දන්නවානේ. ඔබතුමියටත් ලිපියක් එවා තිබුණානේ. නමුත් මේ වන තෙක් පාර පළල් කණු තිබෙන්නේ පාර මැද්දේ. අපි කොච්චර කිවුවත් අර කර්මාන්ත අධිකාරියේ සිටින නිලධාරිතුමිය කියන්නේ ගරු සභාපතිතුමා කියන්නේ ප්‍රදේශයේ සිටින මන්ත්‍රීතුමියගෙන් ලිපියක් ගෙන්න. එතුමිය මෙවාට කැපවීම යම්කිසි විදියකින් අඩුනම් ඒ වෙනුවට මහජනතාව වෙනුවෙන් කැප වෙන්න තමයි අපි මහජනතාව නියෝජනය කරන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රීතුමියගේ ගමේම තමයි විදුලි සමාගම තිබෙන්නේ. එක මෙහේට එවන්න. මහදෙයක් නෙමේ. නැතුව තාක්ෂණසේවා නිලධාරි කෙනෙක් හදන ඇස්තමේන්තුවක් නෙමේ. එය විදුලි සමාගමෙන් හදන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>

මමත් ආස නැහැ . හැල්ලු වෙලා වැඩ කරන්න. අපේ ජනතාව වෙනුවෙන් කරනවා නම් මට යම්කිසි වගකීමක් දෙන්න ඕනේ සභාවෙන්. එහෙම දෙන්නේ නැතුව ඔබතුමා තමන්ගේ කොට්ඨාශයේ මන්ත්‍රී කියා එතුමන්ලාට විතරක් බලය දීලා අපිව නිකං හැල්ලු කරන්න ලැහැස්ති වෙන්න එපා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඔබතුමියට බලය දීලා තමයි සංචාරක මණ්ඩලයේ තනායම කැඩුවේ. එතකොට ඔබතුමිය අධ්‍යක්ෂකතුමිය.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>

තනායමේ කතාවක් අවශ්‍ය නැහැ. ඔබතුමාත් හවුල් ඒවාට . අපි දන්නවා. ඒ ගැන කතා කරන්න එපා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ සපිරි ගමක් යටතේ ආව ලක්ෂ 20 මේ වන විට අවසන්. නිලානි මන්ත්‍රීතුමියගේ නිවස ළඟ පාරට තමයි එක කොටසක් යෙදෙව්වේ. අපේ ලක්ෂ 20 ඒ ආකාරයට බෙදී යනවා. අර කලින් ඒවා ගැන කිවුවාම අපේත් වැරදි තිබෙනවා. එය කරන්න ඕන ජගත්

කුමාර මන්ත්‍රීතුමා තමයි කරන්න ඕන. මට අයිති නැතිනිසා මට කරන්න බැහැ. මාගේ ගේ ඉදිරිපිට කාණුවට මා ඕනැවට වඩා උනාන්දු වුණොත් මිනිසුන් මට කියයි මා එය මට මේවා කර ගන්නේ කියා. මා දැන් කරන්න ඉන්නේ එතැන එහාට කොන්ක්‍රීට් ටිකක් දමා වසා දමනවා. ඒ කෙසේ වෙතත් මට කියන්න ඕන එතුමාට විතරක් දොස් පවරනවාට මා අකමැතියි. මොකද අපි එක එක යෝජනා දුන්නාට එහි අපේත් වැරදිම් තිබෙනවා. අපි එය උනාන්දු වී නොකිරිම. දැන් අපි යෝජනා දෙනවා. අපි ඒවා කර ගන්න ඕන. ඉතිං ඒවාගේ අතපසුවිම් වෙනවා කියා මාත් පිළිගන්නවා. නමුත් මේ සපිරි ගමක් යටතේ ලක්ෂ 20 අපි යොදවලා තිබෙනවා. ඊට අමතරව ගරු රමේෂ් පතිරණ මැතිතුමා අපට ලක්ෂ 5ක් එව්වා අපේ කොට්ඨාශයට. එකත් අපි යොදවලා දැනට අවසන් කර තිබෙනවා. ඉදිරියේදි විදුලි කණු ටික ප්‍රශ්නය තමයි . මා අද යන විට බලන්නම් විදුලි සමාගමට ගිහින්. එතරම් ලොකු වැඩ කොටසක් අපේ කොට්ඨාශයේ නැහැ. නිලානි මන්ත්‍රීතුමිය බොරුවට සද්දේ දනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වැඩකරන හැම තැනකම වැඩ පරික්ෂක වගේ හිටගෙන ඉන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

එහෙම තමයි මහජනතාව වෙනුවෙන් කැප වීම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

මා එහෙම යන්නේ නැහැ. නිලානි මන්ත්‍රීතුමිය එකට කැපවෙලා. මා ගෙදරට වෙලා ඉන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් ගැමි කමිටු සාදා ප්‍රජා මණ්ඩල හරහා ආයතන රැස් කරලා ප්‍රජා කමිටු හරහා තමයි යෝජනා ගත්තේ. දැන් මාස ගණනකට කලින් මේ සභාවේ මා කතා කරලා වසර 30කට 035කට කාලයක සිට අම්බලන්ගොඩ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙක් හිටියේ නැහැ මාගේ කොට්ඨාශයේ. මා පත් වූ දිනයේ සිට මා තාක්ෂණසේවා නිලධාරින් එක්ක ගෙන ගිහින් යෝජනාවක් කළා. ඉල්ලිමක් කළා මේ තිබෙන කාණු පද්ධති නවීකරණය කරන්න කියා. මෙහි සිටින තාක්ෂණසේවා නිලධාරින් සමඟ ගිහින් බලා මැනිම් කටයුතු කළා. ඒත් එවා සාදා දුන්නේ නැහැ. කරපු දේ ගැන සතුටු වෙනවා. ඔබතුමා යම්කිසි වැඩක් කර තිබෙනවා. යෝජනා අරගෙන ගැමි කමිටු හරහා ඒවා කෙරෙන්නේ නැතිනම් අපි ඒ ගැන කනගාටු වෙනවා. ගමට

පැමිණි මුදල් ගෙන ගමේ වැඩ කටයුතු කරපු මන්ත්‍රීවරයෙක් මා. ගමපෙරළිය යටතේ ලක්ෂ 15ක් විතර කලින් කොන්ත්‍රාත්කරුට ගෙවන්න තිබෙනවා. කොන්ත්‍රාත්කරුවෙකු බැලුවා. කිසිම කොන්ත්‍රාත්කරුවෙකු ලබා ගන්න බැරි වුණා. ගම්පෙරළිය යටතේ මුදල් ගෙවන්න තිබෙන නිසා එම කොන්ත්‍රාත්කරුවන් වැඩ භාර ගන්නේ නැහැ. ඒ පිළිබඳ ගැටළුවක් තිබෙනවා. ඉතිං ඔබතුමා කිවුවා බය නැතුව කරන්න කියා. ඔබතුමා මැදිහත් වෙන්නම් කියා. ඒ ගැනත් අපිට ලොකු විශ්වාසයක් තිබෙනවා. නගර සභාව හරහා මේවා කරනවා නම් හොඳයි. ඉතිං එක කෙරෙන්නෙත් නැහැ . කොට්ඨාශයේ මන්ත්‍රීවරයෙක් විදියට අම්බලන්ගොඩ නගර සීමාවේ මට දීපු මුදල් වලින් උපරිම ප්‍රයෝජන ගත් චරිතයක් මා. මට අද වෙනකොට කොන්ත්‍රාත්කරුවෙක් එන්නේ නැහැ. කාට කතා කළත් පසුගිය රජයෙන් කරන ලද වැඩවලින් භාගයක් මුදල් ගෙවා නැහැ. කොන්ත්‍රාත්කරුවන් වැඩ කරන්නේ නැහැ. මේ මුදල් ගොඩක් යනවා. අනිත් එක තමයි නගර සභාව හරහා අපිට මේ මුදල් ටික ගෙන ඔබතුමා මැදිහත් වෙලා කොට්ඨාශ මන්ත්‍රීවරයාට අභයක් වටිනාකමක් එන විදියට කරන්න. අපේ ගමේ ඕනම කෙනෙක් දන්නවා මට නැති මුදල් ගෙන මා ගමේ වැඩ කළා. මට මේ වේලාවේ මේ මුදල් වලින් ප්‍රයෝජන ගන්න බැරි වුණා. මොකද මාගේ තිබුණ වැරද්දක් නිසා නෙමේ. අපේ යහපාලන ආණ්ඩුවෙන් මුදල් ගන්න බැරි වුණා. කොන්ත්‍රාත්කරුවන් ඒ සම්බන්ධයෙන් අපිට ඇඟිල්ල දික් කරන්න බැහැ. මිනිසුන් ඉදිරිපිට ප්‍රජා මණ්ඩල වුණත් අපිට කතා කරන්න අයිතිය තිබෙනවා. ගමේ මිනිසුන් දන්නවා. එමනිසා ඒ චෝදනාව මට කරන්න එපා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ප්‍රජාතන්ත්‍රවාදි රටක් . මේ ප්‍රජාතන්ත්‍රවාදය යටතේ ප්‍රධාන වෙන්නේ පාලිතයා. ජනතාව. ජනතාවට අදහස් දැක්වීමට ලැබෙන ඉඩකඩ බොහොම විරලයි. ඔවුන් ඡන්දය පාවිච්චි කරනවා ඡන්දය දවසට. ඉන්පසුව ඊළඟ ඡන්දයේදි තමයි ඔවුන්ට බොහෝ දෙයක් කියන්න අවස්ථාව ලැබෙන්නේ. ඔබතුමා සැකසූ මේ ප්‍රජා සහාගතීත්ව අයවැයකරණය නිසා අපේ ගම්මුන්ට යම් වදනක් අපේ පාලනය ගැන පවසන්නට ඉඩ අවස්ථාව ලැබුණා. ඒ සුවිශේෂී අවස්ථාව. එමනිසා පසුගිය යෝජනා ක්‍රියාත්මක කරලීම සඳහා ප්‍රධාන වගකිව යුත්තා වන්නේ ප්‍රාදේශිය පාලකයායි. ඒ ප්‍රාදේශිය පාලකයින්ට මහජන නියෝජිතයන්ට විවිධ හේතු නිසා එළි දැක්කපු යෝජනා ඉටු කර ගැනීමට තිබෙනවා. උදාහරණයක් හැටියට අපේ ප්‍රමුඛතා අනුපිළිවළ යටතේ යෝජනා 7ක් පමණ පෙළ ගස්සවා තිබුණා. නමුත් ගරු සභාපතිතුමනි, අපිට 5ක් ක්‍රියාත්මක කිරිමට හැකි වුණා. ඒ කළ නොහැකි වුණේ විවිධ මායිම් ගැටළු විවිධ දූර්මත නිසා දෙකක් ක්‍රියාත්මක කරන්න නොහැකි වුණා. නමුත් ජනතාව සතුටු වෙනවා 70% 75% ක් ඉටුකර

ගැනීමට හැකි වීම පිළිබඳව. එමනිසා මා කියනවා කොන්ත්‍රාත්කරුවන් සොයා ගැනීම තවත් ගැටළුවක්. එමනිසා මේ අවස්ථාවේ කුමන හේතුවක් නිසාවත් ප්‍රජා සහභාගිත්ව වැඩ සටහන පසුබට නොවන්නට ඉඩ නොදී ඔවුන් රැස් කිරිමේ කටයුතු කළ යුතුයි. එමනිසා අපේ සරත් ශ්‍රී ලාල් මහතාගේ අදහසට අනුව පසුගිය යෝජනා ඉටු කර ගැනිමට නොහැකි වුණත් ඉදිරියේදි නැවත ඔවුන් කැඳවා මේ විමසිම සිදු කළ යුතු වන්නේ. එම අවස්ථාව සලසන්න කියන ඉල්ලිම අපි කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ මාර්ග අලුත් වැඩියා කිරිමේ ලේඛණය දැන් ලැබුණේ. මේ කාරණය ගසා තිබෙන්නේ ඉංග්‍රීසියෙන්. මේ සිංහල ඉංග්‍රිසියෙන් ලියා තිබෙන්නේ. මා දන්න විදියට රාජ්‍ය භාෂාව සිංහල. මෙය මහ කුණු හරුපයක්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ ඒ ආයතනයෙන් ආපු ලිපියක්. අපි ගහපු එකක් නෙමේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ඔබතුමාට ඉලක්ක කරනවා නෙමේ. මේක කුණුහරුපයක්. සිංහල ඉංග්‍රිසියෙන් ලියලා මාගේ ඉදිරිපිටින් යන පාර. පඤ්ඤාලෝක පාර. මේක තිබෙනවා පඥ්ඥාලෝක මාවත කියා. පඤ්ඤාලෝක මාවත කියන එක ඉංග්‍රිසියෙන් ලියන්න දන්නේ නැතිනම් එය දන්න සිංහලෙන් ලියා එවන්න කියා ඒ අයට දන්වා එවන්න. මේ වගේ බාල වැඩ කරන්න දෙන්න එපා. පඤ්ඤාලෝක පාර ලියන්න දන්නේ නැතිනම් එන්න කියන්න මා කියලා දෙන්නම්. මා ඉංග්‍රිසි කාරයෙක් නෙමේ. නමුත් උවමනා තැනට ඉංග්‍රිසි පාවිච්චි කරන්න අපි දන්නවා. මේ වගේ කුණුහරුප වැඩ කරන්න දෙන්න එපා. රාජ්‍ය ආයතනයක. මේ සිංහල ඉංග්‍රිසියෙන් ලියා තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි යවන ලද ලිපිවල සිංහලෙන් ලියා තිබෙන්නේ. ඉංග්‍රිසියෙන් ලියන විට ඒ යතුරුලියන කරන ලද කෙනා ලිවිමේදි තමයි ඒ විදියට ලියා තිබෙන්නේ. එය ආයතනයේ වරදක් නෙමේ. එය යතුරුලියන කරන ලද කෙනාගේ වරදක්. එය සලකන්න එපා. අපිට වටිනවා ඊට වඩා මුදල් ගණන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ සංවර්ධන කටයුතු නොකිරිම ගැන ඔබතුමාටම චෝදනා කරන්නේ නැහැ අපි. කොට්ඨාශ මන්ත්‍රීවරු අපි. හැබැයි සමහර යෝජනා ඉදිරිපත් කරද්දි කොට්ඨාශ මන්ත්‍රීවරුන් අතර මත ගැටුම් නිසා සමහර යෝජනා ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ ගැන විශේෂයෙන්ම කනගාටු වෙනවා අපි ආදාහනාගාරයේ. අද වෙනතුරු හදා ගන්න බැරි වුණා. ඇත්තටම එක එක මත ගැටුම් නිසා එය නතර වෙලා තිබෙනවා. එක ලොකු පාඩුවක්. ඔබතුමාට දොස් කියන්නේ නැහැ. අද වෙනතුරු මා කියන ලද දේවල් සිද්ධ වුණේ නැහැ. අර ගොඩනැඟිල්ල කඩා ඉවත් කිරිමක් සිදු වුයේ නැහැ. සකස් කෙරුණේ නැහැ. නමුත් ඔබතුමාට චෝදනා කරන්නේ නැහැ. එක එක අදහස් දැක්වීම මත  අද එය නතර වෙලා තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමිය මා එක තමයි කියන්නේ. සාමාන්‍ය ජනතාව මේ සිටින මන්ත්‍රීවරුන්ගේ කුණු ලොට්ට ටික දැන ගන්න ඕන. මා මේ අම්බලන්ගොඩ සංවර්ධනයේ යම්කිසි වැඩ කොටසක් කරන්න මට භාරදිලා මා නොකර ඉන්නවානම් ජනතාව ඉදිරියේදි මා නොකර සිටිනවානම් මා පිළිගන්න කැමතියි. හැබැයි මතක තියා ගන්න ඒ දේට මට තනියම පිළිතුරු දෙන්න බැහැ. එතකොට මේවාට හේතු ගොඩක් තිබෙනවා. ඔබතුමා කොච්චර ලැහැස්ති වුණාද ඕකන්දට සේවා පියසක් ඉදිකරන්න. දැන් ආණ්ඩුවෙන් මුදල් නොදි නෙමේ. ඒ වුනාට බාහිර කරුණු මත බැරි වුණා. ජනතාව දැන ගන්න ඕන කවුද මෙහි හරහට සිටි පුද්ගලයන් කියා. එතකොට විස්තර කතා කරන්න. එළිපිට කතා කරන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. මාත් ලැහැස්තියි . මන්ත්‍රීවරුත් ලැහැස්ති වෙන්න . මොකද වුණේ කියා ජනතාව ඉදිරිපිට කියන්න. එකතමයි සිද්ධවෙලා තිබෙන්නේ කියා. මන්ත්‍රීවරු ලැහැස්ති වෙන්න. මං ලැහැස්තියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

අන්න එක තමයි. මේ වැඩ ක්‍රියාත්මක විමේදි ඔබතුමාට චෝදනා කරන්නේ නැහැ මා. අපිත් එම චෝදනාව පිළිගන්න වෙනවා. මොකද අපි ඔක්කොම කොට්ඨාශ මන්ත්‍රීවරු . කොට්ඨාශ වල වැඩ කරන කොට අපිට එක එක බලපෑම් එනවා. දැන් මා කිවුව ආදාහනාගාරය. එය කෙරුණේ නැහැ. ඊට පස්සේ දැන් ඔබතුමා දන්නවා නිල පියසත් . එක කෙරුණෙත් නැහැ. ඊට පස්සේ දැන් සපිරි ගමක් යටතේ ලක්ෂ 20 අනුමත වෙලා තිබෙනවා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් කොන්ත්‍රාත්කරු කතා කලාම කිවුවාලු මුදල් තවම ලැබිලා නැහැ කියා. එතකොට ඒ අය බයයි

දැන් වැඩය අත ගහන්න. ගිය සැරේ යහපාලන ආණ්ඩුවෙන් මුදල් නතර විමක් නිසා කට්ටිය මෙය භාර ගන්නේ නැහැ. අපිට ඕනේ පාර හදන්න. මේ පාරට කලින් මුදල් වෙන්කර තිබ්බා. ගරු වජිර අබේවර්ධන අමාත්‍යතුමාට කියලා. එයත් කර ගන්න බැරුව ගියා. එතුමා පොරොන්දු වුණා එය කරන්නම් කියා. එම පාරම තමයි දමා තිබෙන්නේ. එතකොට එක තාම සකස් කරන්න බැරි වුණා. නමුත් අර කෙරිච්ච වැඩ කොටස් වල පාලකයා වශයෙන් ඔබතුමාට ඇඟිල්ල දික් කරනවා නෙමේ. අපිත් භාර ගත යුතුයි. චුටි චුටි වැඩ අපේ පරිපාලන අංශවලින් කෙරි නැහැ. මොකද අපි මොනවා හරි යෝජනා කළාම ඔබතුමා සම්මත කරනවා කළ යුතුයි කියා. නමුත් තවම එවා කෙරිලා නැහැ. එකෙත් පොඩි අඩුවක් තිබෙනවා. අඩුව තිබෙන ගමන්ම මා කියනවා අපි මන්ත්‍රිවරු ඔක්කොම එය භාර ගන්න ඕන. එක්කෙනෙකුට විතරක් චෝදනා කරන්න බැහැ. අපි මොනවා හරි යෝජනා කළානම් ගම්මාන මට්ටමින් ඇවිත් ඔබතුමාට කරදර කිරිම කරන්න ඕන මන්ත්‍රිවරයා. ඔබතුමා තනියම කරන්න බැහැ. එක කොට්ඨාශ මන්ත්‍රිවරයා දැන ගතයුතුයි. අපේ කොට්ඨාශයේ මන්ත්‍රිවරු තුන්දෙනෙක් සිටිනවා. එතකොට ඒ අය මාගේ වැඩය කරනවා වගේම ගරු සභාපතිතුමා මගේ වැඩය කෙරිලා නැහැ. මෙය කළයුතුමයි. එක හඩ නගන්නේ නැතුව අපි ඔබතුමාට දොස් කියන්නේ නැහැ. නමුත් වැඩ කිරිමේ අපහසුතාවය. මන්ත්‍රිවරු දෙතුන් දෙනෙක් සිටින විට වැඩ කිරිමේදි එහෙම වෙනවා. මා කළොත් අනිත් අය විරුද්ධයි. අපි මෙය සමගියෙන් කළොත් මේ වැඩ කළා අවසන්. මේවා නෙකෙරෙන්න මූලික හේතුව ඒක. කනගාටුවෙන් වත් ඒ දේ කියන්න ඕන. මිට පසුවත් අපි සමගියෙන් අපි මේ වැඩකටයුතු කරන්න. කොට්ඨාශවල මන්ත්‍රිවරු හතර පස් දෙනෙක් සිටිනවා. එක්කෙනාට නෙමේ. හතර පස් දෙනා සමඟතම මෙය කළයුතුයි කියා හඩ නගන්න. උදවු කරන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙය මෙහෙමයි. මන්ත්‍රිවරු මතක තියා ගන්න අපි නැවත අවුරුදු දෙකකට පස්සේ මහජනතාව ඉදිරියට ගිහින් අපේ මන්ත්‍රවරු වශයෙනුත් අපේ නගර සභාවෙන් වෙච්ච සේවය ගැන ප්‍රසිද්ධ විවේචනයක් කරන්න දිලා ජනතාවට මෙන්න මේවායි අවශ්‍ය කියා එහෙම කතා කරලා මේවා කරන්න. එහෙම කළේ නැතිනම් අන්තිම වෙනකොට අපි කිසිම දෙයක් කරලා නැහැ. උත්තරය බින්දුවයි. මිනිසුන්ට වැඩ කරන්න නම් මිනිසුන්ගේ විවෙචන වලට මුහුණ දෙන්න පුරුදු වෙන්න. අපි මේ වැඩ කොටස කරන්න ඕන. එමනිසා බයනැතුව වැඩ කරන්න. මේ වසර ගත්තාම ජනතාව දන්නවා මේ වසර තුළ වැඩ කරන්න පුළුවන්ද බැරිද කියන එක ජනතාවට තෙරෙනවා. ඒ විදියට අපි කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

හරි අපි ලැහැස්තියි එකට. ලබන මාස දෙක ඇතුලත මේ සේරම වැඩ කරන්න. අපි එන්නම්. මේ සියළුම වැඩ කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ඔබතුමලා එක එක බාධා සිදු කලේ නැතිනම් මේ වනකොටත් සියල්ල කෙරිලා අවසන්.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

නැහැ. අපි බාධා කරන්නේ නැහැ. මේවා කරන්නේ නැති එක තමයි අපිට ප්‍රශ්නය. කිසිම බාධාවක් නැහැ. අපිට ඕනේ මෙය කරන්න. දැන් මේකට කලිනුත් අපි මේකට අනුමැතිය දුන්නා. කිසි ගැටළුවක් නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අපි ඕක කරන්න තමයි රැස්වීම් තිබ්බේ. කරන්න නැතුව ආයේ ගමට යන්න නෙමේ අපි. දැන් අපේ කෙරමිණිය මන්ත්‍රීතුමා කිවුවේ යෝජනා හතෙන් පහක් කරලා තිබෙන්නේ. එතුමාගේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මාගේ කොට්ඨාශයේ විතරක් නෙමේ මා කියන්නේ. කරලා ඉවර වෙලා ඊට පස්සේ යෝජනා ගන්න. එකයි අපි කියන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්**

ඇත්තටම වසරක් පසා මේ යෝජනා කැඳවා මේ කරන කටයුත්තෙදි ඒ අයට අදහස් දක්වන්න තිබෙන්නේ මේ කරන අවස්ථාවේ. අපේ හෙප්පුමුල්ල ප්‍රදේශයේ කරන ලද යෝජනා වලිනි ගොඩක් කටයුතු සිද්ධ වුණා. නමුත් ගියවසර කරන්න යෝජනා කරන ලද කිහිපයක් කරන්න බැරි වුණා. ඇස්තමේන්තු කරලා ඒ ඇස්තමේන්තුවත් අනුමත වෙලා තියෙද්දි කොරෝනා වසංගතහය පැමිණී නිසා ඒ ඇස්තමේන්තුවේ වැඩ කටයුතු කරගන්න අපහසුතාවයක් වුණා. මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඒ පසුගිය යෝජනා කරලා ඇස්තමේන්තු කරලා කරන්න බැරි වු වැඩ මේ වසර සඳහා යෝජනා කරලා ඒ වැඩ කටයුතු කර දෙන්න කියා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මා පොඩි කාරණයක් මතක් කර දෙන්න ඕන. සියළුම මන්ත්‍රීවරුන් මගෙන් ඉල්ලීමක් කළා. සියළු වැඩ නතර කර මේ වැඩය කරන්න කියා. එතකොට මේ ක්‍රිඩාංගණයේ වැඩ කටයුතු සම්බන්ධයෙන් මීට ඉහතදී ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළා. ඒ වෙනකොට සභා අරමුදලෙන් ලක්ෂ 79ක් අපි වියදම් කර තිබුණා. එවැනි තත්ත්වයක් අපේ තිබෙන්නේ. ඔබලාම යෝජනා කරනවා මේ විදියට කරන්න කියා. එතකොට සමහර විට ගමේ තිබෙන යෝජනාව පහුවෙන්න පුළුවන්. ගමේ යෝජනාත් අපි කරනවා. කිසිම මේකත් නැහැ. මිනිසුන්ට විවේචනය කරන්න තිබෙන අවස්ථාව. විපක්ෂයේ මන්ත්‍රීවරු කැමති වෙන්න ඕන අපි මේ වගේ දෙයක් කරන එකට. මොකද මිනිසුන්ට විවෙචනය කරන්න තිබෙන අවස්ථාවක්. එමනිසා අපි මෙය වැඩියේ කතා කරන්න අවශ්‍ය නැහැ. අපි මේ රැස්වීම් ටික තියන්න ඕන. අපේ වරදක් තිබෙනවා නම් අපිට ජනතාව කියාවි. අපේ හොඳක් තිබෙනවා නම් අපිට කියාවි. අපි වෙනස් වෙන්න ඕන නම් අපිට කියාවි . ප්‍රශ්නයක් නැහැ. මේ නගර සභාව මන්ත්‍රවිරුන්ගේ අදහස් වලට වැඩිය මේ අම්බලන්ගොඩ ඡන්දය දෙන ජනතාවගේ අවශ්‍යතාවය සඳහා සිටිය යුතු සභාවක් කියන එක මතක තියා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ඒ ගැන අපි හොඳින් දන්නවා. දැනගෙන තමයි කටයුතු කරන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි මේක අනුමත කරගෙන මේ වැඩ ටික කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ඒ වගේම ඔබතුමා ඉස්සෙල්ලා කිවුවේ පිට්ටනිය ගැන. මගේ නම් මතය අපේ නගර සභා ගොඩනැඟිල්ල හදන එක. අපිට මෙයට පිළිතුරක් දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔබතුමිය කතා කළා. මන්ත්‍රීතුමියට කතා කරන්න දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අර ශ්‍රේෂන් මන්ත්‍රීතුමා කිවු පරිදි වැඩ හතෙන් පහක් කෙරිලා තිබෙන්නේ. අපි පින්නදූව තොටුපළ පාර අත්පත් කරගෙන කරන්න තීරණයක හිටියා. එතකොට මා මේ

අවස්ථාවේ අහනවා කොහොමද ඒ තීරණයට වෙන්නේ කියා. මොකද ඔය කියන සියළුම පාරවල් ගත්තාම ඔය කියන පාර අති දුෂ්කරම පාර. තොටුපළ පාර.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තොටුපළ පාර සකස් කිරිම සඳහා මුලික පිඹුර සකස් කිරිම සඳහා ටෙන්ඩරය මෙතැන කඩලා තිබෙන්නේ. අපි වැඩ කරගෙන යනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්</u>**

තව පොඩි දෙයක් අහන්න තිබෙනවා. පින්නදුව පාරට ගොඩනැඟිල්ලක් අනුමත වුණානේ. ඒ ගොඩනැඟිල්ලට මොකද වෙන්නේ කියන කාරණයත් දැන ගන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය බැලුවාම අපිට ලැබුණේ ලක්ෂ 20යි . ඒ හම්බ වුණේ අමාත්‍යාංශයක මුදල්. ඒ අමාත්‍යාංශයේ මුදල් වලින් ඔබතුමියගේ මේ කටයුත්ත කරන්න බැහැ. ඔබතුමියගේ මේ වැඩය ලක්ෂ 62 ඉක්මවා ගිහින්. මා වෙනත් ආයතනයකින් සොයා දෙන්නම් මේක. අපි හදලා දෙන්නම්. නගර සභාව මඟින් නෙමේ. අපි එකඟයි නේද මේ රැස්වීම් තියෙනවාට. සියළු දෙනා එකඟයි. අපි ජනතාව ළඟට යනවා.

**තීරණය -**

2020 ප්‍රජා සහභාගීත්ව අයවැයකරණය සඳහා යෝජනා ලබාගැනීමට පෝස්ටර් 325 ක් මුද්‍රණය කිරීම සඳහා රු.15000/- ක් වියදම් දැරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.16 සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයෙහි ලියාපදිංචි කරනු ලැබ ඇති හෝටල්වලින් අයකරනු ලබන 1% බලපත්‍ර ගාස්තුව සම්බන්ධව යන මැයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයෙහි ලියාපදිංචි කරනු ලැබ ඇති හෝටල් වලින් අයකරනු ලබන 1% බලපත්‍ර ගාස්තුව සම්බන්ධවයි. මේ එවන ලද ලිපිය පරිදි හෝටල් වලින් බලපත්‍ර වලට අයකරන ලද 1% ගාස්තුවක් අයකරනවා. එය නගර සභා ආඥා පනතේ සහ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ පිළිවෙළින් 247 අ (2) 164 හා 149 වගන්තිය යටතේ. ඒ අනුව 1% ගාස්තු ගැනීම කල්පනා කරන්නේ නැතුව මේ සංචාරක ව්‍යාපාර වැටීම හිතන්නේ නැතුව අපිට අයවැය වෙනකොට අපිට පුළුවන්නම් අඩු කරන්න කියා ඉල්ලීමක් කරනවා. එය අපි අයවැය සමඟ කතා කරන්න.

**තීරණය -**

**සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයෙහි ලියාපදිංචි කරනු ලැබ ඇති හෝටල්වලින් අයකරනු ලබන 1% බලපත්‍ර ගාස්තුව සම්බන්ධවයි** යන මැයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපිය ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

04. යථා පරිදි කල් දි ප්‍රශ්න — නැත

05. යථා පරිදි කල් දී යෝජනා

**05.01 ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.01.01 හල්වතුර කසළ අංගනයට පස් දමා තුනීකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

හල්වතුර කසළ අංගනයට පස් දමා තුනීකිරීම සුදුසු බවට යෝජනාව කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණිය මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, පස් දමා තුනි කරන්න ඕන. මා දැක්කා විගණන විමසුමේත් තිබෙනවා මේවා නිසි නිලධාරියෙක් අධික්ෂණය කර නැහැ කියා. මේවාට මේක දමන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

වෙනම වැඩ පරික්ෂක මහතෙකු පත්කර  තිබෙන්නේ. එක්සත් ජාතික පක්ෂයේ නිවේදක පත් කළේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඒක එකක්. තාක්ෂණසේවා නිලධාරිනුත් මේවා බලන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මා හැම තිස්සේම විවෙචනයට ලක්වල හැම තැනකම විපක්ෂයේ කෙනෙකු පත් කරන්නේ මොකද නියම තත්ත්වය සභාවට දැන ගන්න. අවශ්‍යතාවය අනුව. සුමිත් යසරත්න මහතා පත් කරලා ඒ යටතේ තමයි අධික්ෂණය කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එකක් එකක් අපි විශේෂයෙන්ම කියන්න ඕන තාක්ෂණික නිලධාරින් බලාන්න ඕන. පස් දමන විට දමන ප්‍රමාණයන් අනුව පොඩි පොඩි අඩුපාඩුකම් තිබෙනවා. ඒවා බලා කරන්න කියා අපි ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔබතුමාත් පත් කරන්නද මා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මාව නම් පත්කරන්න එපා.

**තීරණය -**

හල්වතුර කසළ අංගනයට පස් දමා තුනී කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.02 2020 ලෝක ළමා දින සැමරුම උළෙල පැවැත්විම සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020 ලෝක ළමා දින සැමරුම උළෙල පැවැත්විම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

විරුද්ධ අය ඉන්නවාද? නැහැ.

**තීරණය -**

2020 ලෝක ළමා දින සැමරුම් උළෙල පැවැත්වීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.03 අම්බලන්ගොඩ, පටබැඳිමුල්ල, හාෂිණී මහත්මියගේ නිවස අසල කාණු පද්ධතිය ඉදිකිරීමට සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ, පටබැදිමුල්ල, හාෂිණී මහත්මියගේ නිවස අසල කාණු පද්ධතිය ඉදිකිරීමට සුදුසු සුදුසු බවට යෝජනා කරනවා.

<u>ගරු ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා</u> <u>මහතා කතා කරමින්</u>

ස්ථිර කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ, පටබැදිමුල්ල, හාෂිණී මහත්මියගේ නිවස අසල කාණු පද්ධතිය ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.04 අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ ක්‍රීඩාපිටිය පහත් කිරීමට පස් කපා භූමිය විශාල කිරීමට ඉතිරි කොටස පිරවීම (අදියර 01 ) සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ ක්‍රීඩාපිටිය පහත් කිරීමට පස් කපා භූමිය විශාල කිරීමට ඉතිරි කොටස පිරවීම (අදියර 01 ) සුදුසු සුදුසු බවට යෝජනා කරනවා.

<u>ගරු ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා</u> <u>මහතා කතා කරමින්</u>

ස්ථිර කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ ක්‍රීඩාපිටිය පහත් කිරීමට පස් කපා භූමිය විශාල කිරීමට ඉතිරි කොටස පිරවීම (අදියර 01 ) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.05 අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ ,දලුක්කන්ද පාර හරහා ඇති අංක 01 බෝක්කුව ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ ,දලුක්කන්ද පාර හරහා ඇති අංක 01 බෝක්කුව ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

<u>ගරු ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා</u> <u>මහතා කතා කරමින්</u>

ස්ථිර කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ ,දලුක්කන්ද පාර හරහා ඇති අංක 01 බෝක්කුව ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.06 අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ ,දලුක්කන්ද පාර හරහා ඇති අංක 02 බෝක්කුව ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ ,දලුක්කන්ද පාර හරහා ඇති අංක 02 බෝක්කුව ඉදිකිරීම සුදුසු බවට යෝජනා කරනවා.

<u>ගරු ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා</u> <u>මහතා කතා කරමින්</u>

ස්ථිර කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ ,දලුක්කන්ද පාර හරහා ඇති අංක 02 බෝක්කුව ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.07 අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ බිම් මහලේ ආධාරක ඉදිකිරීම (Column 02 ක් හා Beam 01) සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ බිම් මහලේ ආධාරක ඉදිකිරීම (Column 02 ක් හා Beam 01) සුදුසු බවට යෝජනා කරනවා.

<u>**ගරු ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා මහතා කතා කරමින්**</u>

ස්ථිර කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ බිම් මහලේ ආධාරක ඉදිකිරීම (Column 02 ක් හා Beam 01) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මිළහට ග්‍රේෂන් කෙරම්ණිය මහතා විසින් කරන ලද යෝජනාව

**05.02 ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.02.01 අම්බලන්ගොඩ නගර සභා සීමාවේ පදිංචිකරුවන් බොහෝ පිරිසක් තමන්ට ජීවත්වීමට නිවසක් නොමැතිකමින් බදු කුලී ගෙවමින් පීඩාවට පත්ව සිටී. ඔවුනට පිළිසරණ සැලසීම සඳහා නගර සීමාවේ සුදුසු ස්ථානයක තට්ටු නිවාස යෝජනා ක්‍රමයක් ඇරඹීම සඳහා අදාල බලධාරීන් දැනුවත් කළ යුතු යැයි කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ නගර සභා සීමාවේ පදිංචිකරුවන් බොහෝ පිරිසක් තමන්ට ජීවත්වීමට නිවසක් නොමැතිකමින් බදු කුලී ගෙවමින් පීඩාවට පත්ව සිටී. ඔවුනට පිළිසරණ සැලසීම සඳහා නගර සීමාවේ සුදුසු ස්ථානයක තට්ටු නිවාස යෝජනා ක්‍රමයක් ඇරඹීම සඳහා අදාල බලධාරීන් දැනුවත් කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මිනිසාගේ මූලික අවශ්‍යතා අතර නිවසට ලැබෙන්නේ ප්‍රධාන තැනක්. මේ නිවහනක් පිළිබඳ අපේ වත්මන් රාජ්‍ය නායකයා අවධානය යොමලා තමනට ඉඩමක් හිමි අයට යම් සහනයක් සලසන්න වැඩසටහනක් ක්‍රියාත්මක කළා. රුපියල් ලක්ෂ හයක ප්‍රතිපාදන සලස්වා අපේ කොට්ඨාශයක නිවාසයක් හෝ දෙකක් ගොඩනැගීම සඳහා මූලික අඩිතාලම් දැම්මා. නමුත් ඒ පිළිසරණ ලබා ගැනිමට ඇති පිරිස බොහොම විරලයි. මොකද තමන්ටම කියා ඉඩමක් නොමැතිකමයි බලපාන්නේ. එමනිසා බොහෝ ජනතාවක් මේ නගරයේ බදු ගෙවන තත්ත්වයට පත් වී සිටිනවා. එමනිසා අපිට මතකයි මීට ප්‍රථම පාලන සමයේ අම්බලන්ගොඩ නගර සභාවට ලැබුණා තට්ටු නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීමේ අවස්ථාව. ඉඩමක් නොමැති කමින් ඔබතුමා එම තිළිණය ලබා දුන්නා රත්ගම ආසනයට. නමුත් මේ වන විට තත්ත්වය වඩාත් බැරෑරුමේ තිබෙනවා. එමනිසා අපි ඉල්ලනවා බදු කුළි ගෙවන ජනතාවට සහන සැලසීම සඳහා නිවහනක් නැති ජනතාවට සහනයක් සැලසීමට සුදුසු ස්ථානයක තට්ටු නිවාස යෝජනා ක්‍රමයක් අනාගත රජයේ නිවාස අමාත්‍යවරයාට යෝජනා කළ යුතුයි කියා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එම යෝජනාව ස්ථිර කරනවා. අපි එය දන්වා යවනවා. 05.03.01 යටතේ සරත් චන්ද්‍ර මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන යෝජනාව.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා සීමාවේ පදිංචිකරුවන් බොහෝ පිරිසක් තමන්ට ජීවත්වීමට නිවසක් නොමැතිකමින් බදු කුලී ගෙවමින් පීඩාවට පත්ව සිටින බවත් ඔවුනට පිළිසරණ සැලසීම සඳහා නගර සීමාවේ සුදුසු ස්ථානයක තට්ටු නිවාස යෝජනා ක්‍රමයක් ඇරඹීම සඳහා අදාල බලධාරීන් දැනුවත් කළ යුතු යැයි ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් කළ යෝජනාව ගරු සභාපතිතුමා විසින් ස්ථිර කළ අතර, එම යෝජනාව ගරු නිවාස ඉදිකිරීම් අමාත්‍යවරයා වෙත දන්වා යවන බව දැන්විය.

**05.03 ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.03.01 අම්බලන්ගොඩ නගරය පුරා ප්‍රසිද්ධ ස්ථානවල ඇති දැන්වීම් පුවරු මේ වන විට කඩාවැටී හෝ ඉවත්කර ඇති බවත් එම පුවරු යලි ස්ථාපනය කර ජනතා අවශ්‍යතාවයන් සපුරා කටයුතු කිරීම සුදුසු යැයි කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගරය පුරා ප්‍රසිද්ධ ස්ථානවල ඇති දැන්වීම් පුවරු මේ වන විට කඩාවැටී හෝ ඉවත්කර ඇති බවත් එම පුවරු යලි ස්ථාපනය කර ජනතා අවශ්‍යතාවයන් සපුරා කටයුතු කිරීම සුදුසු යැයි යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

අපි මෙය කලිනුත් යෝජනා කළා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හරි මන්ත්‍රිතුමා අපි එය කරන්නම්. එය කරන්නේ දැන්විම් පුවරු සකස් කරන අය ලවාම තමයි. නගර සභාව මඟින් නෙමේ. නැවත ස්ථාන ගත කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ඒ යන වියදම් වලට සාපේක්ෂව අඩු වියදමක් යන්නේ. මෙයින් වැඩිම බලපෑමකට ලක් වන්නේ අපි. අපිට දැන්විමක් ගසනවා නම් එය සාදාචාරත්මකව විදියට ගහන්න ඕනේ. ඒ හැම තැනම ගහන්න බැහැ. තාප්ප වල ගහන්න බැහැ. පාරවල් වල බෝඩ්වල ගහන්න බැහැ. අපේ දේශපාලනය සාදාචාරත්මක විදියට කරගෙන යන්න ඔබතුමාගේ සහායෝගය අපි බලාපොරෝත්තු වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි සහායෝගය දෙනවා . එහෙනම් අපි එකඟයි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතමා අපි බැලුවා කලින් අර කුලරත්න විද්‍යාලය ළඟ තිබෙන බෝඩ් එකේ කඩාගෙන වැටිලා කැල්ල එල්ලි එල්ලි තිබෙන්නේ. ඒවා මොකක් හරි කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අලුත් වැඩියා කටයුතු කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඒවා අලුත්වැඩියාවක් කරන්න. හොඳ යෝජනාවක් කර තිබෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

මේකේ කොතනද තිබෙන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සංශෝධිත න්‍යායපත්‍රයක් ලබා දී තිබෙනවා. ඒ යටතේ 05.03.02 යටතේ තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, පලවෙනි යෝජනාව යටතේ කතා කරන්න තිබෙනවා. කඩා වැටී තිබෙනවාට වඩා මේ බෝඩ් වලින් නම්කර තිබෙන පාරවල් වලින් මේ නගරයට පිටින් එන ජනතාවට පාරක් තොටක් හොයා ගන්න බැහැ. මා කිහිප වතාවක් යෝජනා කළා කරිත්ත කන්ද වසමේ කුලරත්න පාර ආදර්ශමත් විදියට මෙන්න මේ විදියට නම් කරන්න කියා. ඒ විදියට පාරවල් නම්කරන විට එක පැත්තකින් . එක පැත්තකින් ඔබතුමාට හොඳටම පැහැදිලියි ඔබතුමා යෝජනා කරන ලද පාරවල් කාපට් කිරිමට මොකද වුණේ. සංඝරාජ පාර ඔබතුමා යෝජනා කළා. සංඝරාජ පාරට ඒ අය දැම්මා ධර්මශෝක විද්‍යාලය ළඟ සිට පන්සල ළඟට . එතැනින් එහාට තිබෙන්නේ පිරිස් වෙද මාවත. අන්න ඒ වගේ ප්‍රශ්න. එමනිසා ජාත්‍යාන්තරයේ මුහුණුපොත හරහා අද වන විට මේ පාරවල් තිබෙනවා. මිනිසුන්ට බලා ගන්න විදියක් නැහැ . මේ පාර මොකක් ද කියා. අසවලා

නිවස ළඟ පාර කියා තමයි ඔක්කොම යෝජනා තිබෙන්නේ. එමනිසා මේ පාරවල් නම්කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ සරත් මන්ත්‍රීතුමා කිවු පරිදි ඔබතුමා අවධානය යොමු කරන්න ඕනේ. පසුගිය කාලයේ පාරවල් නම්කිරිම සම්බන්ධව. ලක්ෂ්මි මන්ත්‍රීතුමියගේ සහෝදරයා නමින් පාරක් නම් කළා. ඒවා ක්‍රියාත්මක වුනේ නැහැ. ඒ වගේම මා දැක්කා ධම්මානන්ද මාවත දැන් ඉතාලියා පාර වෙලා දැන් එයට හැමෝම කියන්න අරගෙන ඉතාලියා පාර කියා. අද බෝඩ් එක ඉතාලියා ගහලා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

දැන් එක කැඩුවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

එය කැඩුවාද? කැඩුවා නම් හොඳයි. අනිත් එක තමයි මේ බෝඩ් වල තිබෙන ඒවා. අනිත් එක තමයි මහ අම්බලන්ගොඩ තිබෙන බෝඩ් . ඇත්තටම එය ප්‍රයෝජනයට ගන්න පුළුවන්. කඩලා දමා තිබෙනවා. ඒවා ගෙනත් අවශ්‍ය ප්‍රතිසංස්කරණයක් කර ඒවා නැවත ගසන්න පුළුවන් නම් හොඳයි. මොකද මේ මහජනයාගේ මුදල්. ඒ සියළුම බෝඩ් ගෙනත් අපේ කර්මාන්ත අංශයේ සිටින අය ලවා හරි ගස්සවා ඒ ගැන සොයා බලා අවශ්‍ය තැන්වලට විතරක් බෝඩ් ටික ගහන්න. මොකද මේ මහජනයාගේ මුදල් නාස්ති කරන්නේ අපි. ඒ ගැන අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මගේ යෝජනාවට කලින් මේ මාතෘකාව ආපු නිසා මා කතා කරන්නේ . අර සිමෙන්තියෙන් බෝඩ් බඳින්න කියා. ඔබතුමා මොකක්ද සමාගමක් එක්ක

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහිදි මා මන්ත්‍රීවරුන්ට පැහැදිලි කරන්න ඕනේ . මේ බෝඩ් සම්බන්ධයෙන් අපි සමාගමක් එක්ක එකඟතාවයකට ඇවිත් තිබෙන්නේ. ඒ අය අවුරුදු දෙකකට වරක් ඒ බෝඩ් අලුතින් යොදනවා කියා. ඒ සමාගමේ එම කාර්ය කරලා නැහැ. එමනිසා එය අවලංගු කරලා අලුත්

සමාගමකට එන්න ඕනේ. දැනට ඔය බෝඩ් සඳහා සතයක්වත් අම්බලන්ගොඩ නගර සභාවෙන් වියදම් කලේ නැහැ මීට ඉස්සර වෙලා. ඒවා සියල්ලම වෙළඳ ප්‍රචාරණ ආයතන මඟින් තමයි කළේ. ඒ අනුව තමයි බැලුවේ. නැතිනම් එක බෝඩ් එකක් හදන්න හොඳ ගණනක් යනවා.එමනිසා වෙනත් වෙළඳ දැන්වීම් කරන ආයතනයක් හරහා තමයි මෙය සිදු කරන්න යන්නේ. එකයි අපි බැලුවේ. නගර සභාවේ මුදල් ඉතිරි කර ගැනීමේ පරමාර්ථයෙන්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

ඔබතුමාගේ උත්සාහය මා කියන්නේ නැහැ වැරදියි කියා. නමුත් අර රෙක්සින් එකේ බෝඩ් එක ගැහුවාම එක ඉරන්න අසාවක් තිබෙනවා. දැන් හැදෙන ළමයින්ගේ හැදියාව තමයි කියන්නේ. එතකොට බෝඩ් එක හදලා මාසයක් යන්න කලින් එක ඉරනවා. හරි ලස්සනට එම බැම්මේ ලස්සනට බෝඩ් එක තිබෙනවා. එහි කවුරුවත් දැන්වීම් අලවන්නේ නැහැ. ගහන්නේ නැත්තේ එය හොඳට තිබෙනවා. ඊට පස්සේ යකඩෙන් ෆ්‍රෙම් එක ගහපු එකේ සති දෙක යන්න කලින් බෝඩ් එක ඉරනවා. සිමෙන්තියෙන් බැම්ම එහෙම ඉරන්න හානි කරන්න බැහැ. මා එමනිසායි මේ පුන පුනා කියන්නේ. මේ වැඩය පවතින විදියකට කරන්න කියා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

හොඳ යෝජනාවක්.

**තීරණය-**

අම්බලන්ගොඩ නගරය පුරා ප්‍රසිද්ධ ස්ථානවල ඇති දැන්වීම් පුවරු මේ වන විට කඩාවැටී හෝ ඉවත්කර ඇති බවත් එම පුවරු යලි ස්ථාපනය කර ජනතා අවශ්‍යතාවයන් සපුරා කටයුතු කිරීම සුදුසු යැයි ගරු නගර සභා මන්ත්‍රී ඇස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා විසින් කළ යෝජනාව සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදුකරන බවට ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

**05.03.02** **අම්බලන්ගොඩ ප්‍ර දේශයේ ප්‍රධාන බෞද්ධ සිද්ධාස්ථානයක් වන ශ්‍රී සුනන්දාරාම විහාරස්ථානය ඉදිරිපිටින් ගාලු පාර දක්වා දිවෙන මාර්ගය දෙපස කැටයම් සහිත ගල් කණු කිහිපයක් බිම දමා ඇත. මේවා අපේ බෞද්ධ ඉතිහාසය පිළිබඳ සාක්ෂි දරයි. අම්බලන්ගොඩ නගරය නටඹුන් ගහණ ප්‍ර දේශයක් නොවුවත් අප සතුව ඇති**

**මෙම ශෛලමය පහන් කණු නැවත සිටුවා අතීත ශ්‍රී විභූතිය නැවත පණ ගන්වන ලෙස කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ ප්‍ර දේශයේ ප්‍රධාන බෞද්ධ සිද්ධාස්ථානයක් වන ශ්‍රී සුනන්දාරාම විහාරස්ථානය ඉදිරිපිටින් ගාලු පාර දක්වා දිවෙන මාර්ගය දෙපස කැටයම් සහිත ගල් කණු කිහිපයක් බිම දමා ඇත. මේවා අපේ බෞද්ධ ඉතිහාසය පිළිබඳ සාක්ෂි දරයි. අම්බලන්ගොඩ නගරය නටඹුන් ගහණ ප්‍රදේශයක් නොවුවත් අප සතුව ඇති මෙම ශෛලමය පහන් කණු නැවත සිටුවා අතීත ශ්‍රී විභූතිය නැවත පණ ගන්වන ලෙස යෝජනා කරනවා. මේ පහන් කණු අපි උපන්දා සිට මෙහෙම වැටිලා තිබෙන්න ඇති. නමුත් අපි සංවේදි වුණේ නැහැ එයට . මෑතකදී රටේ සිදු වු සංවේදි සිදු වීම් බැලුවාම තමයි අපි සංවේදි වුණේ. මේවා මා ටිකක් අසල්වැසියන්ගෙන් විපරම් කර බැලුවාම ඒවා පහන් කණු හැටියට තමයි අවුරුදු සියයකට දෙසිය ඉහත පැවතිලා තිබෙන්නේ. මා දන්නේ නැහැ මේ පහන් කණු ප්‍රතිසංස්කරණය කරන්න අපිට අයිතියක් තිබෙනවාද එහෙම නැතිනම් පුරාවිද්‍යා එකට අයිතිය තිබෙන්නේ කියා එම කාරණා මා දන්නේ නැහැ. කොහොම වුණත් මේ පහන් කණු නැවත කෙලින් කරන්න ඕන. අදාල ආයතනයකින් හෝ නගර සභාව විසින්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මෙය පුරාවිද්‍යා එකට වෙන්නැති අයිතිය තිබෙන්නේ. නමුත් අපි එය දන්වලා හරි එය හදවන්න ඕන. එමනිසා මෙය හොඳ යෝජනාවක්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ පහන් කණු තිබෙන තැන දන්වා යවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මහ පන්සල ළඟ තොරණේ සිට රේල්පාර ළඟට එනවිට මේ පහන් කණුටික වැටිලා තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

කියක් විතර වැටිලා තිබෙනවාද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

පහන් කණු හයක් විතර තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා දන්නවා. මට ආරංචි හැටියට ජයන්ත මහතාගේ නිවස ඇතුළේ තිබ්බේ. ගෙදර වත්තේ. පස්සේ ඒ මනුස්සයා ගලවා පාරට දමා තිබෙනවා. වත්ත ඇතුළේ ගල තිබ්බේ. ගල එළියට දමා තිබෙනවා දැන් මා හිතන්නේ. අපි බලන්නම්

**05.04 ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.04.01 අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ නවතා ඇති ගිලන් රථයට (1990) වර්ෂාවෙන් ආරක්ෂා කරගැනීම සඳහා ආවරණ කුටියක් සකස් කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ නවතා ඇති ගිලන් රථයට (1990) වර්ෂාවෙන් ආරක්ෂා කරගැනීම සඳහා ආවරණ කුටියක් සකස් කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.පේෂලා කුමාරි මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, 1990 ගිලන් රථය මා පොලිස් ස්ථානයට ගිය අවස්ථාවේ හොඳටම වර්ෂාව .මට ඇත්තටම හොඳටම කනගාටු හිතුණා. මේ වගේ වටිනා දෙයක්. සේවයක් වෙනවා. අම්බලන්ගොඩ නගරයට විශාලම සේවයක් වෙනවා. 1990 ගිලන් රථය. කවුරු ගෙනාවත් ගෙනා කෙනා නෙමේ. සේවය සඳහා ඉතා අනර්ග දෙයක්. ඔබට හෝ මට හෝ ජනතාව කාට හෝ කාටහරි විපතක් වුණාම කිසිදු මුදලක් අයකිරීමකින් තොරව පිහිට වෙනවා. මෙය ආරක්ෂා කර

ගැනීම අප සතු යුතුකමක් වෙනවා. මෙය සභාවේ ඔබතුමාට රු.20000/=ක වගේ පොඩි මුදලක් වැය වෙන්නේ. මෙය ආරක්ෂා වීම සඳහා ආවරණ කුටියක් ලබා ගැනීම සුදුසුය කියා මා හිතනවා. සභාව සතුව එය කරන්න බැරිනම් ගරු මන්ත්‍රී සහෝදරවරුන්ගෙන් ඉල්ලනවා පොඩි හරි ආධාර මුදලක් ලබා දෙන්න කියා. මොකද මෙය කිරිම ඉතාම වැදගත්. විනාශ වුණා කමක් නැහැ කියා මේ වටිනාකම ඉතා වැඩියි. එය ආරක්ෂා කිරිම අපේ යුතුකමක්. ඉතාමත්ම ඕනෑ කමින් ඉල්ලා සිටිනවා මෙය සකස් කර දෙන්න කියා. මොකද මෙය වර්ෂාවට වෙලි වෙලි සේවය ගන්න එක නෙමේ . එය දිගු කාලිනව ප්‍රයෝජනයට ගැනීම වැදගත්. නගරයේ ජීවත්වන හැමටම සේවය ලබා ගැනීම සඳහා මෙය ඉටු කර දෙන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මිට අවුරුදු 1 ½ කට විතර කලින් ගරු හිටපු ප්‍රධාන අමාත්‍ය ශාන් විජයලාල් ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් තිබුණු සංවර්ධන කමිටුවේ විපක්ෂ නායක ඩෙනට් පතියන්දුව මහතාත් හිටියා. මේ යෝජනාව ගෙනවිත් කිවුවා මේ ගිලන් රථයට ආවරණයක් ලබා දෙන්න ඇස්තමේන්තුවක් ලබා දෙන්න කියා. ඇමතිතුමා එකට පොරොන්දු වුණා. ඇස්තමේන්තුව එවන්න කියා. මා හිතන්නේ අද වෙනතුරු මෙය කෙරෙන්නේ නැහැ. මා හිතන්නේ සභාවෙන් නෙමේ මෙය කෙරෙන්නේ. පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක් ඉන්නවා ඇවිත්. එතුමා තමයි මෙය කර දෙන්න ඕන. එය කරදෙන්න කියා එතුමාටම භාර දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ ඉන්ද්‍රා අයිරාංගනි මන්ත්‍රීතුමිය විසින් ගෙන ආ යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවකි. මා තමයි සම්බන්ධිකරණ කමිටුවේදි හිටපු ප්‍රධාන අමාත්‍යතුමා හා ගරු සංවිධායක ඩෙනට් පතියන්දුවගේ මහතාත් සිටින විටදි පොලිස් පරික්ෂක කුලසේකර මහතා යෝජනා කළා ඒ අනුව මා එම යෝජනාව ගෙන ආවා. මා හිතන්නේ තවම ක්‍රියාත්මක වුනේ නැහැ. ගිලන් රථය ආරක්ෂා කර ගන්නත් ඕන. අපේ නගර සභාවේ තිබෙන කෝටි ගණනක වාහන දැම්මට අංගනයක් ඕන. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියා මා අපේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. මොකද මහජන දේපළ ඒ දිරාපත් වෙන්නේ. එක අනිවාර්යෙන්ම ආවරණය කළ යුතුයි. ගිලන් රථය වගේම මේ මහජන දේපළත් ආරක්ෂා කරගත යුතුයි කියා මා මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය අම්බලන්ගොඩ නගරයේ නවතා තිබෙන ගිලන් රථය ආරක්ෂා කර ගැනිම සඳහා ආවරණ කුටියක් සකස් කිරිමට යෝජනා කළා. මේ යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවක්.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේවට මුදල් යෙදිමේ බලයක් සභාවට නැහැ. එමනිසා අපි හැමෝම මුදල් දමන්න. මා දමන්නම් මුදල්. ඔය හැමෝම දමන්න මුදල්. ඔය කියන කට්ටිය දමන්න ඕන මුදල්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

අපි එකට වැඩපිළිවළක් හදන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙකෙන් රු.2000/=ක් ගන්න. රු.2000/= දාන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

පොඩ්ඩක් ඉන්නකෝ. කලබල වෙන්න එපා. දැන් නව රජයක් පත්වෙනවානේ. මහජනතාවට ලොකු සේවයක් වෙනවා ඔය ගිලන් රථය. එම ගිලන් රථය ආරක්ෂා කර ගැනීම සඳහා සම්පූර්ණ බලා ප්‍රතිපාදනයක් හරි අරගෙන අපි එය හදන්නම්. අපි මෙය අභියෝග කරලා නොක්කල් කරලා හදලා වැඩක් නැහැ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

හැමෝගේම දිමනාව ලැබුණාම රු.2000/= ක් දමන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , මෙයට ඇස්තමේන්තුවක් ගන්න ඕන. තාක්ෂණසේවා නිලධාරින් ලවා ඇස්තමේන්තුවක් ගන්න. ඒ කරලා අපි අනිවාර්යෙන් එකතු කරලා හරි මෙය කරන්න. ගැටළුවක් නැහැ. එය හොඳ යෝජනාවක්. එමනිසා අපි එතුමියට ස්තුතිවන්ත වෙනවා. මහජනතාවටග්

සෞඛ්‍ය ප්‍රශ්න සමහර වේලාවට රුපියල් සියයක් නැති වෙන වෙලාවල් තිබෙනවා රෝහලකට යන්න . ඒ වගේ අවස්ථාවක ඒ වගේ දෙයක් ලැබෙන එක ලොකු දෙයක්. මෙය ජනතාවට සේවයක් ලැබෙන දෙයක්. අපි එය කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා ඔය ප්‍රශ්නය ගැන දැන් අවුරුද්දකට කලින් කතා කළා. මුදල් එකතු කරලා හදන්න. එතුමා ප්‍රකාශ කළේ ආර්.පිකෝ් සමාගමෙන් මුළු ලංකාවේම මෙය හදා දෙනවා කියා. එමනිසා ඕන නැහැ කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා පොලිසියට ගිහින් මූලස්ථාන පොලිස් පරික්ෂකතුමා සමඟ කතා කළාම කිවුවා මෙය කරනවා කිවුවා. නමුත් මෙය හදන්නේ නැහැ කියා. මට වැඩ කරන්න ඇමතිකම් වැඩක් නැහැ. මා කියන්නේ ඇමතිලා කවුරුවත් වැඩක් නැහැ. බොරුවට තරු අරගෙන පුටුවේ වාඩි වුණාට ඔය කවුරුත් වැඩ කරන්නේ නැහැ. එමනිසා මා ඔබතුමාට කියනවා මේ පුටුවේ වාඩිවෙන එකනෙමේ. වැඩ කරන්න ඕන. එක එක්කෙනා මුදල් දෙන්න. බොරුවට කතා කරලා වැඩක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පොලිසියෙන් ඉල්ලීමක් තිබෙනවාද ? අපි ගිහින් මඩු ගහන්න පොලිසිය වත්තේ. එහෙම ලිපියක් තිබෙනවා නම් වෙළඳ සම්ගමයට ඉදිරිපත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

නැහැ ඉල්ලීම් ලිපියක් නැහැ. මා කියන්නම් කරන්න කියා. නැතිනම් අපි හදන්නම්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙතැන මන්ත්‍රිතුමියක් ප්‍ර දේශයේ ජනතාවගේ අවශ්‍යතාවයක් දැකලා ඉදිරිපත් කර තිබෙනවා. අපේ ආඥා පණත අනුව අපිට කරන්න බලයක් නැතිනම් අපිට තිබෙන්නේ අපේ අතින් මුදල් වියදම් කර මෙය එකතුවෙලා කරන්න. මෙය කර දමන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා මෙය ඇඳ ඇඳ ඉදලා වැඩක් නැහැ. දැන් අවුරුදු ගණනක් මෙය කරනවානේ. මේ සඳහා රු.20000/= ක් විතර තිබුණ ඇති.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි එකඟයි. දෙකෙන් පසු මුදල් දෙන්නම්. එකතු කරලා මෙය හදන්න. මන්ත්‍රිවරු තමන්ට පුළුවන් මුදලක් දෙන්න. මා රු.2000/= දෙන්නම්.

**තීරණය-**

අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ නවතා ඇති ගිලන් රථයට (1990) වර්ෂාවෙන් ආරක්ෂා කරගැනීම සඳහා ආවරණ කුටියක් සකස් කිරීම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ජී.ජී.ආර්.පේෂලා කුමාරි මහත්මිය විසින් ස්ථිර කළ අතර , මෙම යෝජනාව සඳහා මුදල් යෙදවීමේ බලයක් නගර සභා ආඥා පනතේ නොමැති බැවින් විරුද්ධත්වයක් නොමැති නම් සියලු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික වියදමින් මෙම කාර්යය සිදුකිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

06. කාරක සභා වාර්තා

**06.01 2020.07.20 දින පැවති මූල්‍ය කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.07.20 දින පැවති මූල්‍ය කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජ්.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.07.20 දින පැවති මුලා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**06.02 2020.07.22 දින පැවති ටෙන්ඩර් කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.07.22 දින පැවති ටෙන්ඩර් කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ ටෙන්ඩර් කමිටු වාර්තාවේ මෙහෙම දෙයක් තිබෙනවා. මා මන්ත්‍රීවරුන්ගෙන් අහනවා. අපි තින්දු කර තිබෙනවා. පලංචි සඳහා මිළ ගණන් වල පකිස්ථාන් බට සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර එෂියන් ට්‍රෙඩ් වල මිළ ගණන් පිලිගැනීම සුදුසුයි කියා. ඒ අනුව පකිස්ථාන් බට රු.4950/= කි. නමුත් මෙහි මෙල්මා එක තිබෙනවා රු.2975/=

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, සංස්ථා එක ගන්න. සංස්ථාවෙන් ගහනවා බට දමා. සනකමත් හොඳයි. අපි ගෙන්නේ එක.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සංස්ථායි මෙල්මායි කියන්නේ දෙකක්ද?

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සංස්ථායි මෙල්මායි කියන්නෙ දෙකක්. සංස්ථා එක හොඳයි. පොඩි ගණනක වෙනසක් ඇත්තෙ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සංස්ථා එක ගන්න. කෝ තාක්ෂණසේවා නිලධාරි මහතා. සංස්ථා එකද මේ මුදලට දමා තිබෙන්නේ. අපි එහෙනම් සභාවෙන් ඉල්ලා සිටිනවා . මේ බට ගන්නේ නගර සභාවේ අලුත් වැඩියා කටයුතු සිදු කිරිම සඳහා. එළිය ප්‍රදේශය. ඒ සඳහා සිමිත ටෙන්ඩරයක් කැඳවා අපේ නිලධාරින් මහතුන්ට බලය දෙන්න මෙය ලබා ගන්න. එකගයිනේ. ඒ සඳහා ටෙන්ඩර් කැඳවා ලේකම්තුමිය ඇතුළු නිලධාරි මණ්ඩලය තීරණය කරන්න. සංස්ථා කියන එක.

**තීරණය**

2020.07.22 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත වූ අතර, කමිටු වාර්තාවේ අංක 07 යටතේ සඳහන් පලංචි සඳහා ලබාගන්නා G.I. බට මෙල්වා වර්ගයෙන් නොව **සංස්ථා** වර්ගයෙන් ලබාගැනීම සුදුසු බවට ගරු සභාවේ තීරණය වූ බැවින් ඒ සඳහා සීමිත ටෙන්ඩරයක් කැඳවා ලබාගැනීමට ලේකම්තුමිය ඇතුලු නිලධාරී මණ්ඩලයට බලය ලබාදෙන බවට ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

**06.03 2020.07.21 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.07.21 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.07.21 දින පැවති පරිසර,සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.04 2020.07.27 දින පැවති කළමනාකරණ කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.07.27 දින පැවති කළමනාකරණ කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.06.26 දින පැවති කළමනාකරණ කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.05 2020.07.21 දින පැවති ක්‍රීඩා කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.07.21 දින පැවති ක්‍රීඩා කමිටුවේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.07.21 දින පැවති ක්‍රීඩා කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.06 2020.07.20 දින පැවති වෙළඳ සංගමයේ කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.07.20 දින පැවති වෙළඳ සංගමයේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

මේ වෙළඳ සංගමයේ කමිටු වාර්තාවේ කියා තිබෙනවා පි.ඩි නොමන් ජයතිලක මහතා කතා කරමින් කියා තිබෙනවා දුම්රියපොළ මංසන්ධියේ වෙළඳ සංකීර්ණයේ වැසිකිළිය අලුත් වැඩියා කර නොමැති බව. සරත් මන්ත්‍රීතුමාගේ අයෙක් යතුර තබා ගෙන සිටින බව. ඒ සම්බන්ධව සොයා බලන්න කියා තිබෙනවා. මා ලේකම්තුමියගෙන් මේ සම්බන්ධව මොනවාහරි කියන්න පුළුවන්ද?

**<u>ගරු නගර සභා ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමා මේ කියන්නේ මොකක්ද කියා. මා දන්න තරමින් යතුර තබා ගන්නේ ඒ කඩහිමියන්ගේ කට්ටිය එකතු වෙලා. එය බදු දි තිබෙන ඒ කට්ටියද දන්නේ නැහැ. මා දන්නේ නැහැ. එම වැසිකිළියේ යතුර තබා ගන්නේ එම කඩහිමියන් තමයි. සරත් මන්ත්‍රීතුමා නෙමේ. කට්ටිය කිවුවත් මොකා කිවුවත් වගකීමෙන් කතා කරන්න ඔබතුමා. සභාවේ එම වාර්තාවේ තිබෙන්න පුළුවන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම්තුමිය එය පොඩ්ඩක් හොයා බලා ප්‍රශ්නය විසඳන්න.

**තීරණය**

2020.07.20 දින පැවති අම්බලන්ගොඩ නගර සභාව සහ වෙළඳ සංගමය ඒකාබද්ධව පවත්වනු ලබන කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.07 2020.06.25 දින පැවති ඩිජිටල් දැන්වීම් පුවරු පිළිබඳ කමිටු වාර්තාව සභාගත කරන ලදී**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

2020.06.25 දින පැවති ඩිජිටල් දැන්වීම් පුවරු පිළිබඳ කමිටු වාර්තාව යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

එම යෝජනාව ස්ථිර කරනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ අනුව මේ තීරණය යටතේ ඔවුන් සමඟ ගිවිසුමකට එළඹීමට තීරණය කරනවා. මෙය රූස්වෙලා තිබෙන්නේ රාහුල මන්ත්‍රීතුමාගේ ප්‍රධානත්වයෙන් තමයි. කොන්දේසි ඇති. ඒ කොන්දේසි වලට යටත්ව.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඔබතුමා බැලුවේ නැද්ද මේක.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔබතුමා ඔක්කොම කැටයම් ටික දමා තිබෙනවා.

**තීරණය**

2020.07.20 දින පැවති ඩිජිටල් දැන්වීම් පුවරු පිළිබඳ කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.08 2020.07.01 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

2020.07.01 දින පැවති පුස්තකාල කමිටු යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කමිටු ගැන කතා කරද්දි අපේ මේ ත්‍රිවිල් කමිටුව දැන් මාස ගණනකින් රැස්වෙලා නැහැ. ඒ ගැන කියවෙන්නෙත් නැහැ. කමිටුව කැඳවුයේත් නැහැ. මොකද කියා දන්නේ නැහැ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අර බෝඩ් ගෙනත් තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සවි කරගෙන යනවා දැන්. දැනට දවස් තුනක් විතර සවිකරලා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

දැන් සවිකරා කියන්නේ මෙහෙමයි. මීට මාස කිහිපයකට ඉහතදි කමිටුවක මෙය කිවුවේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැනට පොලිසිය විසින් උපදෙස් දුන් සෑම තැනකම සවි කර අවසන්. කෝ අපේ වැඩ පරික්ෂක මහතා සිටිනවාද ? හිමාල් මහතා ඒ සවිකිරිම් පිළිබඳ මොකක්ද තත්ත්වය.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

බෝඩ් ඔක්කොම සවිකර අවසන්ද ? අනිත් තිස් ගණන සවි කරන්න තව මාස ගණනක් යනවාද ? කමිටුව කැඳවන්න කමිටුව දුන් උපදෙස් ක්‍රියාත්මක වෙන්නේ නැතිනම් මා මොකටද කමිටුවක් කැඳවන්නේ. එක වැඩක් කෙරෙන්නේ නැහැ. වැඩක්ද ඉතිං කමිටුවක් කැඳවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔබතුමානේ එහි සභාපති.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු උප සභාපතිතුමා ඔහොම කතා කරන්න එපා. සභාපතිතුමාට ඔක්කොම කරන්න බැහැ. ඔබතුමාත් මෙතැන ඇවිත් බලන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

දැන් මා මාසයක් ආවේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ විෂයභාර ලිපිකාරතුමිය වෙනස් කරනවා සැරින් සැරේ. කලින් පාර කරපු කෙනාට මෙය කරගෙන යන්න බැරි වෙනවා. මාස දෙකෙන් තුනෙන් කැඳෙව්වේ. දැන් එකත් නැහැ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා මෙය රථවාහන ත්‍රිවිල් කමිටුව කියා නම්කර තිබෙන්නේ. අද අම්බලන්ගොඩ තත්ත්වය මා කියන්න ඕන නැහැ. ගරු සභාපතිතුමා දන්නවා. නගරේම ජීවත් වෙන පුද්ගලයෙක් හැටියට අද තිබෙන තත්ත්වය මොකක්ද කියා. නිලධාරින් ගරු සභාපතිතුමා ඔබතුමා කියන දේවල් කරන්නේ නැහැ. නැතිනම් මා කියන දේවල් කරන්න ඕන. මේ කමිටුව කර වැඩක් නැහැ. නිලධාරින් දැන ගන්න ඕන. අද නගරයේ තත්ත්වය හරිම කනගාටුදායක තත්ත්වයකට පත්වෙලා තිබෙන්නේ. එය අපි කියන වේලාවට විතරක් කර වැඩක් නැහැ. එය ක්‍රියාත්මක කරන්න ඕන නිලධාරින් වශයෙන්. ඒවා ක්‍රියාත්මක වන්නේ නැතිනම් අපි මේ කමිටු වල ඉඳලා වැඩක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් ඒ නිලධාරින් ටිකත් එක්ක අන්තිම මොහොතේ සාකච්ඡා කර කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි අපි එය පසුව ගන්න.

**තීරණය**

2020.07.01 දින පුස්තකාල කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

07. ටෙන්ඩර් හා මිළ ගණන්

**07.01 ටෙන්ඩර්**

**07.02 මිල ගණන්**

**07.02.01 විෂබීජහරණ කටයුතු සඳහා අවශ්‍ය Power Spray යන්ත්‍ර ලබාගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | අලුත්ගෙදර හාඩ්වේයාර් ගාල්ල | සඳර්න් ඇග්‍රෝ සර්ව් වක්වැල්ල | ගොවි සෙවන වලහන්දුව |
|---|---|---|---|---|
| 01 | විෂබීජහරණ කටයුතු සඳහා අවශ්‍ය Power Spray යන්ත්‍ර | රු.21800/= | රු.20500/= | රු.21000/= |

**තීරණය:-**

විෂබීජහරණ කටයුතු සඳහා අවශ්‍ය Power Spray යන්ත්‍ර ලබාගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ගාල්ල, සදර්න් ඇග්‍රො සර්ව් ආයතනයෙහි මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.02 පින්නදූව තොටුපල මාර්ගය පුළුල් කිරීම සඳහා එම මාර්ගයට පිඹුරක් සකස් කිරීමට මිල ගණන් ඉදිරිපත් කර ඇති පුද්ගලයින්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | M.N. මැන්ඩිස් මහතා | P.G.රබින් චන්ද්‍රසිරි මහතා | ප්‍රීති විරවර්ධන මහතා |
|---|---|---|---|---|
| 01 | පින්නදූව තොටුපල මාර්ගය පුළුල් කිරීම සඳහා එම මාර්ගයට පිඹුරුපත් සැකසීම සඳහා | රු.13000/= | රු.50000/= | - |

**තීරණය:-**

පින්නදූව තොටුපල මාර්ගය පුළුල් කිරීම සඳහා එම මාර්ගයට පිඹුරක් සකස් කිරීමට මිල ගණන් ඉදිරිපත් කර ඇති මිනින්දෝරු මහත්වරුන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අම්බලන්ගොඩ , ලියාපදිංචි බලයලත් මිනින්දෝරු එම්.එන්.මැන්ඩිස් මහතාගේ මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

## 07.02.03 පුස්තකාලවල ඇති වැල් කැඩී ඇති පුටු වියා සැකසීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති පුද්ගලයින්

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ඒ.පී. මනෝර මහතා අම්බලන්ගොඩ | එම්. තිලක් මහතා අම්බලන්ගොඩ | එස්.එච්.ආරියසේන මහතා පොල්වත්ත |
|---|---|---|---|---|
| 01 | ලොකු පුටුවක් විවිමට (15) | රු.1000/= | රු.1100/= | රු.1200/= |
| 02 | පොඩි පුටුවක් | රු.950/= | රු.1000/= | රු.1000/= |

| | | | | |
|---|---|---|---|---|
| | විවිමට(15) | | | |
| 03 | ඇඳිපුටුවක්විවිමට( 02) | රු.1200/= | රු.1250/= | රු.1250/= |

**තීරණය:-**

පුස්තකාලවල ඇති වැල් කැඩී ඇති පුටු වියා සැකසීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති පුද්ගලයින් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අම්බලන්ගොඩ, පෝරඹ, ඒ.ජී.මනෝර මහතාගේ මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

08 ගෙවීම්

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගෙවීම් යටතේ මට කතා කරන්න තිබෙනවා. පොඩි ප්‍රශ්නයක් වුණා. ඔබතුමාට එවන ලද 2020 ජුනි 16 විගණක වාර්තාව අනුවත් 2019 දෙසැම්බර් 30 ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් එවන ලද දකුණු පළාතේ කර්මාන්ත සම්බන්ධයෙන් එන චක්‍රලේඛය සම්බන්ධයෙන් එන පරිදි කටයුතු කර තිබෙනවාද ? කරමින් පවතිනවාද යන්න පිළිබඳ මට සැහිමකට පත් වෙන්න බැහැ. එමනිසා මා සියළු ගෙවිම් වලට අනුමත කිරිමෙන් වැලකි සිටිනවා. මා විරුද්ධ නැහැ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මොකක්ද මට තෙරෙන්නේ නැහැ. ඔබතුමා කියන දේ. හේතු තිබෙනවාද

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමා කියනවා නම් මා ඉදිරිපත් කරන්නම්. ජාතික විගණක වාර්තාවේ ඉදිරිපත් කර තිබෙනවා. විගණකාධිපතිතුමිය විසින් අයවැයට අනුව මේ සභාවේ 2019 වර්ෂයේ මේ අනුව කටයුතු සිදු වෙලා නැහැ. එතකොට අපිට සදාචාරයක් තිබෙනවා ඕනැම ආයතනයක මේ සභ්‍යත්වය රකින්නේ විගණන වාර්තාව. මෙය ඉස්සෙල්ලා සභාගත කරලා

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගියපාර සභාගත කළා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ඕව් එක අනුමත කළා. මෙතැන වැඩි හරියක් ඉන්නේ අලුතින් ආපු මන්ත්‍රීවරු , මන්ත්‍රීවරියන්.ඒ වගකිව යුතු වාර්තාව ඒ අනුව අනුමත වෙලා ගියා . ඒ අනුව කිසිදු සාකච්ඡාවක් මේ සම්බන්ධයෙන් කිසිදු තීරණයක් නැහැ. විගණනක වාර්තාවෙන් බරපතල දේවල් පෙන්වා දී තිබෙනවා. ඒ අනුව මා මෙහි කතා කරන්නේ නැහැ. ගණකාධිකාරිවරිය අතින් සිදු වූ වැරදි එහෙම නැතිනම් ලේකම්තුමිය අතින් සිදුවූ වැරදි. නිලධාරින් අතින් වූ අඩුපාඩු නෙමේ මේ මා කතා කරන්නේ. අපි මේ මන්ත්‍රීවරු පත්වෙලා ගමේ අයගේ යෝජනාවලින් යෝජනා දෙකකට වඩා තුනකට වඩා කෙරිලා නැහැ. 2020 එකම යෝජනාවක් වත් ක්‍රියාත්මක වෙලා නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමා ඔයාගේ යෝජනා විතරයි ක්‍රියාත්මක වෙලා නැත්තේ. මන්ත්‍රීතුමා වැඩ කරලා නැති එකයි කියන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

2019 පළාත් සභාවෙන් අනුමත කරන ලද පාරත් දැම්මේ නැහැ. නිලධාරිතුමියගෙන් ඇහුවාම කියනවා සභාපතිතුමා අනුමැතිය දෙනකම් ඉන්නේ කියා. සභාව අනුමැතිය දීලා නැහැ. ඔබතුමා මේ චෝදනාව කළා . මා අහගෙන හිටියා. මොකද එය යෝජනාවක් නෙමේ. රු.15000/= වියදමක් . මට සැහිමකට පත්වෙන්න බැහැ. මොකද ලබන වසරේත් මේකම වෙන නිසා. මා තවත් කතා කළ යුතු නැති නිසා මා තවත් නිහඬව අසා සිටියා. මා මේ අවස්ථාවේ කතා කරන්නම්. මන්ත්‍රීවරුන්ට ඔබතුමා යෝජනා කරනවා. ඔබතුමා තනි අතේ මෙය පාලනය කරනවා. ඔබතුමා කිසිදු සාකච්ඡාවක් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු සමඟ සාකච්ඡා කරන්නේ නැහැ. කිසිදු ව්‍යාපෘතියක් සම්බන්ධව. 2018 කරුණු 25ක් දමනවා අනුමැතියට . මේක කොහොමද වෙන්නේ. අපි ජනතාව නිසා මෙතනට ඇවිත් තිබෙන්නේ. ජනතාව අපිට ඡන්දය දී එවා තිබෙන්නේ මේ වැඩ

කරපන් කියා. එතකොට මේ ජනතාව කමිටු කැදෙව්වාම යෝජනා 13 නැතිනම් 14 දි තිබෙනවා අඩු වශයෙන් මේ යෝජනා 13 14වත් කරන්න කියා. එතකොට මේවා සම්මත කරලා නිලධාරින් යවා ඇස්තමේන්තු හැදුවාට වැඩක් නැහැ. මේ විදියට වෙන්නේ නැහැ. අපි මෙතන අවුරුදු දෙකක් තිස්සේ ගත් කිසිම යෝජනාවක් ක්‍රියාත්මක විම තත්ත්වයට අරගෙන නැහැ . ඉතිං අපි මොකක්ද මේ කරන්නේ. මොකක්ද මේ මන්ත්‍රිවරයෙක් වශයෙන් ජනතාවට දෙන පිළිතුර. ඔබතුමා කියනවා මන්ත්‍රිවරු වැඩ කරලා නැහැ කියා. නිලධාරින් කියනවා සභාපතිතුමාගේ අනුමැතියක් නැතුව කරන්න බැහැ කියා. ඔබතුමාට මේ සභාවේ කි වතාවක් කියා තිබෙනවාද වැඩ විමධ්‍යගත කරන්න කියා. මේ මන්ත්‍රිවරුන්ට. මොකද ඒ අයට මේ සභාව යන්නේ නැහැ. ක්‍රිඩාංගණය හදන එකට ලකෂ 400ක් පමණ වියදම් කරනවා අවුරුදු 1 ½ තිස්සේ. කිසිම නිලධාරියෙකුට ඇස්තමේන්තුවක් හදන්න බැහැ මේ මන්ත්‍රිවරයෙකුගේ. ඔබතුමා මන්ත්‍රිවරුන්ට චෝදනා කරනවා මේ මන්ත්‍රිවරු වැඩ කරන්නේ නැහැ කියා. ජනතාව අතර ගිහින් මේ කතාව කියන්න. මා මේක දමනවා මුහුණු පොතට සාකච්ඡාව. මොකක්ද මේ තත්ත්වය. මන්ත්‍රිවරුන්ට චෝදනා කරන්න එපා ඔබතුමා මෙය තනි අතේ පාලනය කරන්න ගිහින්. වරද්ද ගත්තාම ඔබතුමාට. කරිත්ත කන්දේ ජනතාවගේ ප්‍රශ්නය. ඔබතුමා මේ මන්ත්‍රිවරුන්ට චෝදනා කරන්නේ. අඩු වශයෙන් ගමේ මන්ත්‍රිවරයා මා, මා සමඟවත් සාකච්ඡා කළාද? විරුද්ධ වුණාම විරුද්ධයි. කිසිම දෙයක් කරගන්න බැරි වුණා. අඩු වශයෙන් මෙය මීට වඩා වෙනස් විදියකට අඩුම වශයෙන් වාහන කිහිපයක් හරි දමන්න එතන හදා ගන්න තිබුණා. ඔබතුමාගේ තනි තීරණ නිසා මේවා ක්‍රියාත්මක කරන්න ගියාම තමයි ප්‍රශ්නය. අඩුම වශයෙන් මා මේ ගැන කිසිම කෙනෙක් සමඟ කතා කර නැහැ. ධම්මික මන්ත්‍රිතුමා තමයි ගමේ මිනිසුන්ගේ විරෝධතාවය වුණත් ඉදිරිපත් කර තිබුණේ. මට අවශ්‍ය නැහැ ගමේ මිනිසුන් උලුප්පවන්න. මා නගර සභාවේ වැඩක් කරනවා නම් උපරිම සහායෝගය දෙන කෙනෙක්. අපි ජනතාව සේවය කරන්නේ. වචනයේ පරිසමාර්ථයෙන් මා ජනතාවට සේවය කරන්න ඇවිත් තිබෙන්නේ. වෙන කිසිම හේතුවක් නිසා නෙමේ. අපි වැඩ කරගන්න බැරුව ඉච්චාබංගත්වයට පත් වෙනවා. එතකොට ඡන්දය දිපු ජනතාවට මා දෙන පිළිතුර මොකක්ද? දෙන්න උත්තරයක් නැහැ. ඉහළම නිලධාරින් ඔබතුමාගේ අනුමැතිය නැතිනම් කිසිම දෙයක් කරන්නේ නැහැ. එක තමයි මෙකෙ ඇත්ත. අර ගරු ඩෙනට් පතියන්දුවගේ මහතා වෙන්කරන ලද මුදල් වලින් හල්වතුරේ ඔංචිල්ලා හැම දෙයක්ම සවිකර දැන් මාස තුනකට වැඩියි. මා ලේකම්තුමියට කිවුවා වැලි කියුබ් 05ක් 10ක් දමන්න කියා. ඔබතුමා කිවුවා මෙය විවෘත කරන්න දිනයක් දමා ගන්න කියා. මෙයට වැලි දමන්න කියා දැන් මාස 2 ½ කට වැඩියි. අර පොඩි දරුවන් අරගෙන ගිහින් හොරාට දරුවන් ඔංචිලි පද්දනවා. ඉතාම වේදනායි. මේ පොඩි අයට පදින්න තිබෙන ඔංචිල්ලාව වසාගෙන ඉන්නවා නම් අපි ඉබ්බෝ දමා. හදලා ඉවරවෙලත්. ලක්ෂ 30ක්.

එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් වෙන්කරන ලද මුදල්. අපේ සභාවේ මුදල් වත් නෙමේ. මාස 2 ½ විතර. වසාගෙන ඉන්නවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මන්ත්‍රීතුමාගේ නිවසට වැලි අදිනවා . ඔබතුමාගේ වගකීමක් තමයි එම වැලි ටික ගෙනත් කරන්න. එහෙනම් ඔයා කියලා කරන්න ඔයාගේ ගෙදර කට්ටිය නෙමේ අපි. අපි වැලි වලට බලපත්‍ර ඔක්කොම අරගෙනත් ඉවරයි. නමුත් කිසිම දෙයක් හොයන්නේ නැතුව මේ අය ඉන්නවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ඔබතුමාට වැලි කියුබ් 05ක් ගන්න දවසින් පුළුවන් කියා මා ලේකම්තුමියට කිවුවා. එකත් මා කිවුවා . මොකද ජනිත් වික්‍රමතිලක මහතා වැලි අදින්නේ. ඔබතුමා එක්ක දුරකථනයෙන් කතා කරලා පුළුවන් මේ වැලි කියුබ් 05 ගන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි කතා කරලා තිබෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ඒක නිත්‍යානුකුල තත්ත්වයක් නෙමේ. වැලි විකුණන්න පුළුවන් ඕනම ආයතනයකට. මොකක්ද වැලි වලට බලපත්‍ර දමන්න තිබෙන්නේ මෙකේ. ඔබතුමා මේ සභාව නොමග යවන්න එපා . අපි වැලි දමන්න බලපත්‍ර ගනිමින් ඉන්නවා කියා. එක වෙන කෙනෙකුට කියන්න. මට කියන්න එපා. එය බොහොම කනගාටුදායක තත්ත්වයක්. එකට හේතුව තමයි මේ සියළුම නිලධාරින් සියළු දෙනා ඔබතුමා උදේට කරන දෙය තමයි මෙහි කරන්නේ. එත් වෙන කරන්න දෙයක් නැහැ. අයවැයක් මොකටද ගරු සභාපතිතුමා. එත් 2019 මා ඉවසුවා. දැන් මේ 2020 ගැන කතා කරන්නේ. මට කතා කරන්න කියපු නිසා මා මේ කතා කරන්නේ. නැතිනම් මා නිහඬව බැහැලා යන්න හැදුවේ සභාවෙන්. මාගේ වේදනාවට මා නිහඬව ඉන්න හැදුවේ. ඡන්දය දීමෙන් වැලකී. එත් විරුද්ධ වෙන්නේ නැහැ. ඒ නිසායි මා මේ සභාවෙන් බැහැලා යන්න හැදුවේ. මට ඉඩ දෙන්න. තමුන්නාසේලා මන්ත්‍රීවරු වශයෙන් සභාවක් විදියට ඒ නිත්‍යානුකුලව ඒ වැඩකටයුතු කර ගන්න. මට මේ පළාත් පාලන ලේකම්තුමාගේ , කොමසාරිස්තුමාගේ ප්‍රාදේශීය මහ ලේකම්වරයාගේ චක්‍ර

ලේඛණයට අනුව මේ සභාවේ නැහැ  පළවෙනි ශ්‍රේණියේ ඉංජිනේරුවරයෙක්. මෙතුමන්ලා තුන්වෙනි ශ්‍රේණියේ කාර්මික නිලධාරින්. එතකොට අනුමැතිය දිය යුතුව තිබෙනවා . පලවෙනි ශ්‍රේණියේ ඉංජිනේරුවරයෙක්. එතකොට අනුමැතිය අරගෙන තිබෙනවාද මේ ව්‍යාපෘතිවලට. පලවෙනි ශ්‍රේණියේ ඉංජිනේරුවරයෙක්ගෙන්. මට එකක් කියන්න අපි සභා සම්මත කර කරපුවා . අපි මුදල් අනුමත කර ගෙවපුවා. තව ඉදිරියට යයි. විගණන කමිටුව දෙනවා මේ විදියට දෙනවා අයවැයේ අසූපන්ලක්ෂයක වියදම කොට්ඨාශ 13ම. ඔබතුමා කරන්න අනුමැතිය දි තිබෙන්නේ 4%. ලක්ෂ 15ක ව්‍යාපෘතියක් විතරයි. අපි ඇඳුම් අඳගෙනද පාරේ යන්නේ. මේ යෝජනා වලට මන්ත්‍රිවරු ඕන කෙනෙක් නොමග යවන්න පුළුවන්. මා කතා කරන්නේ මේ සියළු තොරතුරු අනුව. සත්‍ය දේ . මා වචනයක්වත් ඔබතුමාට අපහාස වෙන්න වත් , ඔබතුමාගේ සේවය අභය නොකර නෙමේ මේ ඉන්නේ. අපේ වේදනාවට අපි කතා කරන්නේ. කොහේද අපි යන්නේ. කොහේද මේ සභාව තිබෙන්නේ. මේක මෙහෙම වෙන්න බැහැ. අයවැය ලේඛණයක් තිබෙනවා නම් අයවැය ලේඛණයට අනුව යන්න .  ගරු මන්ත්‍රිවරු ඔබතුමා යෝජනාවක් දැම්මාම අනුමත කරනවා. ක්‍රිඩාංගණය හදන්න . ක්‍රිඩාංගණය හදන්න කලින් මේ සභා කාර්යාලය හදන්න කියා මේ මන්ත්‍රිවරු 21නා කොච්චර කෑ ගහනවාද? තාමත් කෑ ගහනවා. ඉතිං එක හැදෙනවායි. තාම මේ ලේකම්තුමිය නිලධාරින් තෙම් තෙම් මේ නිලධාරින් ඔක්කොම වැඩ කරන්නේ. බලු කූඩුවේ වගේ කන්නේ. හතර පස් දෙනා මේ විදියට ඉන්නේ. ඕක තමයි සැබෑ තත්ත්වය. ඔබතුමාට කතා කරන්න වෙන්නේ නැහැ සංවර්ධනය ගැන. සැබෑ තත්ත්වය ඕන නම් මා දවසක් කියන්නම්. පාරට එළියට බැස්සොත් කියන්නම් තිබෙන තත්ත්වය කොහොමද කියා. හරි වේදනායි. වේදනාවට කතා කරන්නේ. ඔබතුමා කිසිම මේ මන්ත්‍රිවරයෙක් එක්ක සාකච්ඡාවක් කරන්නේ නැහැ. එකයි මෙකේ ඇත්ත කතාව. පාලන පක්ෂයේ මන්ත්‍රිවරු එක්ක. කොච්චර සුහදත්වයෙන් මෙය යන්න පුළුවන්ද ? ඔබතුමාට විතරක් තනි බලයක් දිලා තිබෙනවාද ජනතාව. ඔබතුමා සභාපති වෙච්ච පලියට. මේ මන්ත්‍රිවරු ඔක්කොම ජනතාවගේ ඡන්දයෙන් ඇවිත් තිබෙන්නේ. ඔබතුමාට යුක්ති සහගත තත්ත්වයක් තිබෙනවා මේ මන්ත්‍රිවරු එක්ක සාකච්ඡා කර මෙය කරන්න. ඔබතුමා කරලා මේ සභාවට දමන්න. අද වාහන අංගනයේ තාප්ප ඔක්කොම දමා සභාවට දමනවා. එතකොට යෝජනාව එනවා. එදාම අනුමත වෙනවා. මේ සභාවේදි වියදම් ගෙවන්න දමනවා. වැඩ කළයුතුයි. ඔබතුමා කරන විදිය නිත්‍යානුකුලයි. කිසිම විරුද්ධත්වයක් නැතුව ඉතාම සාර්ථකයි. ඔබතුමාට එය කරන්න පුළුවන්. අපිටත් එක කරන්න බැරුව ඉන්නේ. මේ ක්‍රමය අපේ යෝජනාවලටත් මේ සභාව හදන ඒවාටත් කරනවා නම් ඉතාමත් හොඳයි. ඔබතුමා ඔය ඉක්මනට කරන ක්‍රමය. පිට්ටනිය හදන ක්‍රමය සභාව හදන්න කළානම් කොච්චර හොඳද? එහෙනම් කාර්යාලය අද විවෘත කරලා . අපි ක්‍රිඩාංගණය හදනවාට විරුද්ධ නැහැ. බොහොම ලස්සනයි. මේ

ව්‍යාපෘතියට ලක්ෂ 300කට වැඩිය සභාවේ මුදල් වියදම් කර තිබෙනවා. මොන ඉංජිනේරුවරයාගෙන් අවසර ගෙන තිබෙන්නේ. මෙතුමා මේ අනුමත කිරීම මත තමයි මේක යන්නේ. කොහේද අපි මේ යන්නේ. මේ නිත්‍යානුකූලව මේ දේවල් යන්න. මට මේ සභාවේ ගෙවීම් සඳහා අනුමැතිය දෙන්න බැහැ. මේවා නිත්‍යානුකූලව ලේකම්තුමිය ඉදිරිපත් කළ දවසක මා සභාවේ අනුමැතිය දෙන්නම්. බොහොම ස්තුතියි. මන්ත්‍රීවරුන්ටත් බොහොම ස්තුතියි මට ඇහුම්කන්දීම සම්බන්ධව.

- පෙරවරු 11.15 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා සභා ගර්භයෙන් නික්ම ගියහ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා හිතන්නේ බරපතල ප්‍රකාශයක් තමයි මේ සිද්ධ වුණේ. විගණන වාර්තා නම් අපිටත් හම්බ වුණේ නැහැ. මා ඉල්ලුවා බලන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

නිකුත් කළා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මේ දැන් හම්බ වුණේ

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

විගණන වාර්තා දුන්නා. මා කියන්නම් . විගණන වාර්තාව තුළ පැහැදිලි මතයක් විගණකාධිපතිතුමිය ප්‍රකාශ කර තිබෙනවා. පැහැදිලි හොඳ විගණන වාර්තාවක් දී තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමා, පොඩ්ඩක් ඉන්න. වැරදි තත්ත්වයන් තුළ අපිව කැඳවා නිලධාරීන් සමඟ සාකච්ඡා කරලා මෙහි තිබෙන නිවැරදිතාවය යොමු කරන්න. එය අපේ එක වගකීමක්. එහෙම තිබෙනවානම්. මේ තත්ත්වයක් තුළ දැන් චක්‍රලේඛණයන් තුළ තත්ත්වය තුළ පලවෙනි ශ්‍රේණියේ නිලධාරියෙක් අනුමත කර ඉදිරිපත් කරන්න ඕන නම් මේවා ඉදිරිපත් කරන්න ඕන.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රීතුමා දැන් එවැනි තත්ත්වයක් ඔබතුමාගේ ප්‍රධාන අමාත්‍යතුමා දමා තිබුණා. එක ඇත්ත. ඊට පස්සේ අපේ ආණ්ඩුව අවාට පසු මේක වෙනස් කළා. එතකොට මෙගොල්ලන් අනුමත කරනවා. එක කිසි ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අනිවාර්යෙන් පලවෙනි ශ්‍රේණියේ නිලධාරියෙක් අනුමත කරන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එක දැන් නැහැ. එක තිබුණේ ඒ කාලයේ. මේක ලක්ෂ 20 දක්වා ඒ අයට අනුමත කරන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා අපිට මේක අනුමත කරන්න බැහැ. අපි කැමතියි වැඩ කරනවාට . කිසි ගැටළුවක් නැහැ. ඒවා නිවැරදි කරලා මේ වැඩ කටයුතු කරන්න. එමනිසා මේ ගෙවීම් සම්බන්ධව අපගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි ඡන්දය විමසනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේවා නිවැරදි කර කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

08.01 යෝජනා කරනවා. විරුද්ධ අය සිටිනම් ඡන්දය විමසන්න. විරුද්ධ දෙකයි. පක්ෂ 8යි . සම්මතයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා මේ සම්බන්ධව අප දැනුවත් කිරිම පිළිබඳව.

**08.01 2020 මැයි මාසයට සභාව සතු සියලුම වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් රු.220424/- ක් සී/ස. අම්බලන්ගොඩ විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කළ අතර, එම ගෙවීම සම්බන්ධව ජන්ද විමසීමක් සිදු කළ අතර පක්ෂව ජන්ද 08 ක් සහ විපක්ෂව ජන්ද 02 ක් ප්‍රකාශ වීමෙන් අනතුරුව සභා සම්මත විය.**

| | |
|---|---|
| පක්ෂව ජන්දය දුන් සභිකයින් | ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා<br>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා<br>ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මි සිල්වා මෙනවිය<br>ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස ද සිල්වා මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා |
| විපක්ෂව ජන්දය දුන් සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා<br>ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය |
| ජන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා<br>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය<br>ගරු නගර සභා මන්ත්‍රිනී ජී.ජී.ආර්.පේෂලා කුමාරි ද සිල්වා මහත්මිය<br>ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය<br>ගරු නගර සභා මන්ත්‍රිනී එම්.චම්පා සුමුදු කුමාරි මහත්මිය<br>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා |
| රැස්වීමට පැමිණ ජන්දය විමසන අවස්ථාවේදී සභා | ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා |

| | |
|---|---|
| ගර්භයේ නොසිටි සභිකයින් | |

**08:02** **සභාව සතු LL -7642 අංක දරණ කෘ කැබ් රථයේ සේවාව සඳහා බටපොල කග්ගොඩ ආරච්චි මෝටර්ස් වෙත රු.18110/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත වූ අතර, නැවත කැබ් රථය සේවා කිරීමේදී අම්බලන්ගොඩ ආයතනයකින් එම කටයුතු සිදුකරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.**

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මේ ගෙවීම් සඳහා 18110/= ක මුදලක් වැයවෙනවා. සාමාන්‍යයෙන් කර්මාන්ත පරික්ෂක මහතාගෙන් මේ ගැන විමසා සිටියා. ඇහුවාම එතුමා කියනවා මෙහි අලුත්වැඩියා කටයුතු වගයකුත් තිබුණාලු. මෙය දමන විට එකත් ඇතුළත් කරන්න. මේ රු.18110/= කිවුවාම පොඩ්ඩක් බලනවානේ. මේ වාහනයේ සේවා සඳහා මෙච්චර මුදලක් යන්න් නැහැනේ. එය ඇතුළත් කරන විට ඒ ටිකක් ඇතුළත් කරන්න. මේ වැඩ කළා මේ වැඩ කළා කියා එකත් ඇතුළත් කරන්න. නැතිනම් ඕන කෙනෙක් බලනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙහි කරලා තිබෙන්නේ රු.18110/= ට. යට වැසිය සේදීමට රු.1600/=, බෝඩිය රු.1400/=, ග්‍රිස් ගැසිමට රු. 60/=, නිපල් ඇණ යෙදිම රු.1560/=, හයිඩ්‍රොලික් පවර් එකට රු.500/=, ඔයිල් ෆිල්ටර් යොදා සවිකිරිම රු.1600/=, ඩිසල් , ප්‍රෙටල් යොදා සවිකිරිම රු.2500/=, ඩී.එස්.යෙලෝ රු.4200/=, යට ගැසිමට තෙල් රු.1800/=, ජියර් ඔයිල් රු.700/=, ඩිපරන්සන් ඔයිල් රු.700/=, බ්‍රෙක් ඔයිල් රු.750/=, දොර ලොග් රු.950/=, රෙඩියෙටර් බුලට් රු.650/= ක් ලෙස මුළු ගණන රු.18110/=

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මා ඉල්ලිමක් කරනවා. එතුමා කිවුවා ටින්කරින් එහෙම කළා කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ටින්කරින් මුකුත් නැහැ. කෙලින්ම වාහනයේ සේවා කිරිමයි සිදු කළේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මා ගරු සභාවෙන් ඉල්ලිමක් කරනවා. අම්බලන්ගොඩ වාහන සේවා සපයන ආයතන තිබෙනවා දෙකක් හෝ තුනක්. මෙය අම්බලන්ගොඩ සේවා ස්ථානයකට දමන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු උප සභාපතිතුමා මාත් මේ ප්‍රශ්නය මුල ඉඳලාම ඇහුවා. මේ වාහනය සර්විස් කිරීම සඳහා අලෙවි නියෝජිතයෝ මේ ආයතනය. ඒ නියෝජිතයන් වශයෙන් තමයි මෙතැනට යවන්නේ. මීට ඉස්සර ඉඳගෙන යවා තිබෙන්නේ මෙහෙට. එහෙමනම් අපි ටෙන්ඩර් කරන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මා යෝජනා කරනවා ඊළඟ සේවා ලබා ගැනීමේදී අම්බලන්ගොඩ තිබෙන සේවා ස්ථානයකට ගෙනියන්න. මීට වඩා අඩු මුදලකට කර ගන්න පුළුවන්. අපේත් වාහන තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා දන්නේ නැහැ. මාගේ පොඩි වාහනයටත් රු.15000/= විතර යනවා. මේ සේවාව විජේසූරිය එකේ කළත් මේ මුදල යනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා , මා මේ ඉල්ලීමක් කරන්නේ. එක පාරක් බලන්නකෝ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි කරන්නම් . ඒ කරන්න ටෙන්ඩර් කරන්න වෙනවා. මේ අය අලෙවි නියෝජිතයන් නිසා කෙලින්ම කරන්න පුළුවන්. නැතිනම් ටෙන්ඩර් එකක් දමා තමයි කරන්න වෙන්නේ. එහෙනම් ටෙන්ඩර් කරන්න. 08.03 යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපේ විරෝධතාවය. ඔන්න ලියා ගන්න පොඩ්ඩක් මේ සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු නොකිරීම . මේ විගණන වාර්තාවත් එක්ක සංසන්දනය කිරීමේදී නීත්‍යානුකූල නොවන බැවින් එමනිසා නීත්‍යානුකූලව කටයුතු කලායින් පසු අපේ අනුමැතිය ලබා දෙන බවත් අපි සභාවෙන් නික්ම යනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

08.02 විරුද්ධද? සම්මතයි

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඒකමතිකව නෙමේ. අපි විරුද්ධයි මේ සියළු දෙයට. අපි එහෙනම් ගියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙම යන්න බැහැ. ඔයා එහෙනම් වාඩිවෙලා ඉඳලා විරුද්ධ නම් විරෝධතාවය කියන්න. නැතුව ගිහිල්ලා එහෙම ටොෆි දෙන්න බැහැ. කියලා යන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා වගකිමක් ඇති මන්ත්‍රී කෙනෙක් වශයෙන් වගකිමක් තිබෙන්න ඕන

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

වගකීමක් තිබෙනවා. නිත්‍යානුකුල නැතිනම් කරන්න දෙයක් නැහැනේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මා අහන්නේ ගරු සභාපතිතුමා මෙවා කියන විට යම්කිසි දෙයක් බලා විරුද්ධ වුණාට කමක් නැහැ. නමුත් මේ සභාව ඉදිරියට කරගෙන යාම මේ කසළ ඇදිම ආදි දේවල් කරන්න ඕන. මේ විරුද්ධ වුණාම මේ සභාව කරගෙන යන්න විදියක් නැහැ. ඔබතුමා හැම දෙයටම විරුද්ධයි කියනවා. එහෙම වුණාම සභාව ගෙනියන්න බැහැනේ. එමනිසා සභාපතිතුමා කියවන විට මොකක් හරි දෙයකට විරුද්ධ වෙන්න. සේරටම විරුද්ධ වෙන්නේ නැතුව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ අහන්නකෝ. මාගේ අයිතිය විරුද්ධ වෙනවාද නැද්ද කියන එක.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

08.03 මා නැවත යෝජනා කරනවා. මෙයට විරුද්ධ අය ඉන්නවාද?

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ස්ථිර කරනවා.

**08:03 2020 ජුනි 15 දින සිට ජුනි 30 දින දක්වා ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් Ceylon Security and Manpower(private) Limited වෙත රු.139297.54 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එකමතිකව සම්මතයි. 08.04 යෝජනා කරනවා. මෙයට විරුද්ධ අය ඉන්නවාද? මන්ත්‍රීතුමලාගේ ගමන් වියදම් වලට කවුරුත් විරුද්ධ නැහැ. එක හොඳයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>

**ස්ථිර කරනවා**

**08:04** **අම්බලන්ගොඩ නගර සභාවේ ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ 2020 ජූලි මස ගමන් වියදම් ලෙස රු.147,000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

08.05 යෝජනා කරනවා. සම්මතයි.

**08.05** **නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි රථයේ රක්ෂණාවරණය අලුත් කිරීම වෙනුවෙන් අම්බලන්ගොඩ , ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත රු.61628.83 /- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

**08.06 සංශෝධනය කර යෝජනා කරනවා. පොඩ්ඩක් ඉන්න. ඔයා කියන්න ඉස්සරවෙලා වාඩි වෙන්නකෝ. මා කියන්න ඉස්සරවෙලා පනින්නේ. සංශෝධනය කර ඉදිරිපත් කරනවා. හල්වතුර නගර සභා ඉඩම වටා තාප්පයක් ඉදිකිරිම. රු.1776430.33 ක් ඕකන්ද ප්‍රජා බල මණ්ඩලයට ගෙවිමට යෝජනා කරනවා.**

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

සංශෝධන සහිතව.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

සංශෝධන සහිතව . සම්මත වෙනවා. ස්ථිර කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

සංශෝධනය කරන්න බලයක් නැහැ. මොකද හේතුව මෙය සංශෝධනය කරන්නත් ක්‍රමයක් තිබෙනවා. ඒ ක්‍රමයට එන්න. මෙය යෝජනා කරලා ඡන්දයක් විමසා මෙය අපි ඉවත් කර තිබෙන්නේ. ඉවත් කරන යෝජනා වලට කොහොමද ගෙවන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමා මෙය ස්ථිර කරලා . සම්මත වෙලා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එහෙම බැහැ. අපි විරුද්ධයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔයාට බැරි වුණාට අනිත් අය විරුද්ධ නැහැ. විරුද්ධ අය සිටිනම් අත ඔසවන්න. විරුද්ධ අය තුනයි, පක්ෂ අයි 08දෙනයි. සංශෝධන සහිතව.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

වාහන අංගණය කියන සංශෝධන සහිතව.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

වාහන අංගනයක් නැතුව පොදු වෙළඳපොළ දමන්න පුළුවන්. එක මතක තියා ගන්න.

**08:06 නගර සභා වාහන නැවතුම් අංගනය ඉදිකිරීමට හල්වතුර නගර සභා ඉඩම වටා තාප්පයක් ඉදිකිරීම යන්න සංශෝධනය කර හල්වතුර නගර සභා ඉඩම වටා තාප්පයක් ඉදිකිරීම වෙනුවෙන් රු.1776430.33 ක් ඕකන්ද ප්‍රජා බල මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කළ අතර, එම ගෙවීම සම්බන්ධව ඡන්ද විමසීමක් සිදු කළ අතර පක්ෂව ඡන්ද 08 ක් සහ විපක්ෂව ඡන්ද 03 ක් ප්‍රකාශ වීමෙන් අනතුරුව සභා සම්මත විය.**

| | |
|---|---|
| පක්ෂව ඡන්දය දුන් සභිකයින් | ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා<br>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා<br>ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මි සිල්වා මෙනවිය<br>ගරු නගර සභා මන්ත්‍රී ඞී.ධර්මදාස ද සිල්වා මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා |

| | |
|---|---|
| විපක්ෂව ඡන්දය දුන් සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය<br><br>ගරු නගර සභා මන්ත්රී ධනසේන මාදුවගේ මහතා |
| ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය<br><br>ගරු නගර සභා මන්ත්‍රිනී ජී.ජී.ආර්.පේෂලා කුමාරි ද සිල්වා මහත්මිය<br><br>ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය<br><br>ගරු නගර සභා මන්ත්‍රිනී එම්.චම්පා සුමුදු කුමාරි මහත්මිය<br><br>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා |
| රැස්වීමට පැමිණ ඡන්දය විමසන අවස්ථාවේදී සභා ගර්භයේ නොසිටි සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා |

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

08.07 යෝජනා කරනවා. ස්ථිර කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපි විරුද්ධයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

විරුද්ධ අය අත ඔසවන්න. පක්ෂ අය  අත ඔසවන්න. පක්ෂව 11 ක් විරුද්ධව ඡන්ද 03ක් ලෙස සම්මතයි.

**08:07 2020.03.06 දින සිට 2020.06.11 දින දක්වා අම්බලන්ගොඩ නව මාළු වෙළඳපොළෙහි ජල බිල්පත් වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය වෙත රු.15423.86/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කළ අතර, එම ගෙවීම සම්බන්ධව ජන්ද විමසීමක් සිදු කළ අතර පක්ෂව ජන්ද 11 ක් සහ විරුද්ධව ජන්ද 03 ක් ප්‍රකාශ වීමෙන් අනතුරුව සභා සම්මත විය.**

| | |
|---|---|
| පක්ෂව ජන්දය දුන් සභිකයින් | ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා<br>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා<br>ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මි සිල්වා මෙනවිය<br>ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස ද සිල්වා මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා<br>ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය<br>ගරු නගර සභා මන්ත්‍රිනී ජී.ජී.ආර්.පී. කුමාරි ද සිල්වා මහත්මිය<br>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය |
| විපක්ෂව ජන්දය දුන් සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා<br>ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය<br>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා |
| ජන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා<br>ගරු නගර සභා මන්ත්‍රිනී එම්.චම්පා සුමුදු කුමාරි මහත්මිය<br>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා |
| රැස්වීමට පැමිණ ජන්දය විමසන අවස්ථාවේදී සභා | |

| | |
|---|---|
| ගර්භයේ නොසිටි සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා |

**08:08 2020 ජුනි මස අභ්‍යන්තර ජාල දුරකථන බිල්පත වෙනුවෙන් රු.12260.18 ක් ලංකා බෙල් සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:09 2020.03.14 දින සිට 2020.06.15 දින දක්වා මහජන ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරයේ ජල බිල්පත් වෙනුවෙන් සහ 2020 මැයි මස පටබැඳිමුල්ල සිඟිති උයනේ ජල බිල්පත් වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය වෙත රු.16051.04 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

08.10 යෝජනා කරනවා. විරුද්ධ අය ඉන්නවා නම් අත ඔසවන්න. පක්ෂව 11ක් සම්මතයි. විරුද්ධ අය 02යි.

**08:10 හල්වතුර කසළ අංගනයේ කසළ තුනීකිරීම සඳහා D4E යන්ත්‍රයේ සේවය ලබාගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ, එපිටමුල්ල පාර, පී.එච්.සී.සී. ද සිල්වා මහතා හට රු.198000/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කළ අතර, එම ගෙවීම සම්බන්ධව ඡන්ද විමසීමක් සිදු කළ අතර පක්ෂව ඡන්ද 11 ක් සහ විරුද්ධව ඡන්ද 02 ක් ප්‍රකාශ වීමෙන් අනතුරුව සභා සම්මත විය.**

| | |
|---|---|
| පක්ෂව ඡන්දය දුන් සභිකයින් | ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා<br>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා<br>ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මි සිල්වා මෙනවිය<br>ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස ද සිල්වා මහතා |

| | |
|---|---|
| | ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය<br><br>ගරු නගර සභා මන්ත්‍රිනී ජී.ජී.ආර්.පේෂලා කුමාරි ද සිල්වා මහත්මිය<br><br>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය |
| විපක්ෂව ඡන්දය දුන් සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය |
| ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රිනී එම්.චම්පා සුමුදු කුමාරි මහත්මිය<br><br>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා |
| රැස්වීමට පැමිණ ඡන්දය විමසන අවස්ථාවේදී සභා ගර්භයේ නොසිටි සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා |

**08:11 ඇණවුම් අංක 2461 යටතේ ඇණවුම් කරන ලද ඉදල් සහ කොසු වෙනුවෙන් අම්බලන්ගොඩ, කන්දෙගොඩ, ටී.එච්.දුලාන් හසිත මහතා හට රු.11000/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රීනී ලක්ෂ්මී ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:12 ඇණවුම් අංක 2460 යටතේ ඇණවුම් කරන ලද විදුලි උපකරණ වෙනුවෙන් අම්බලන්ගොඩ, පස්වන හරස් වීදියේ චානක එන්ටර්ප්‍රයිසස් වෙත රු.112250/-ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා**

**විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

08.10 යෝජනා කරනවා. විරුද්ධ අය ඉන්නවා නම් අත ඔසවන්න. පක්ෂව 11ක් සම්මතයි. විරුද්ධ අය 02යි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

08.13 යෝජනා කරනවා. විරුද්ධ අය ඉන්නවා නම් අත ඔසවන්න. පක්ෂව 11ක් සම්මතයි. විරුද්ධ අය 03යි.

**08:13 ඇණවුම් අංක 2462 යටතේ ඇණවුම් කරන ලද තින්ත හා පිලර් වෙනුවෙන් අම්බලන්ගොඩ, විලේගොඩ, අතුල ප්‍රදීප් කුමාර මහතා හට රු.45090/-ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කළ අතර, එම ගෙවීම සම්බන්ධව ඡන්ද විමසීමක් සිදු කළ අතර පක්ෂව ඡන්ද 11 ක් සහ විරුද්ධව ඡන්ද 03 ක් ප්‍රකාශ වීමෙන් අනතුරුව සභා සම්මත විය.**

| | |
|---|---|
| පක්ෂව ඡන්දය දුන් සභිකයින් | ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා<br>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා<br>ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී සිල්වා මෙනවිය<br>ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස ද සිල්වා මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා<br>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා<br>ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය<br>ගරු නගර සභා මන්ත්‍රිනී ජී.ජී.ආර්.පේෂලා කුමාරි ද සිල්වා මහත්මිය<br>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය |
| විපක්ෂව ඡන්දය දුන් | ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා |

| | |
|---|---|
| සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය<br><br>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා |
| ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රිනී එම්.චම්පා සුමුදු කුමාරි මහත්මිය<br><br>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා |
| රැස්වීමට පැමිණ ඡන්දය විමසන අවස්ථාවේදී සභා ගර්භයේ නොසිටි සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා |

**08:14 කොවිඩ් 19 වසංගතයෙන් කාර්යාලයේ නිලධාරීන්ගේ ආරක්ෂාව සඳහා ආරක්ෂිත ආවරණයක් ඉදිකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ලබාගත් රු.15000/- ක අත්තිකාරම පියවීම ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

08.15 යෝජනා කරනවා. ස්ථිර කරන්න

<u>ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී ද සිල්වා මෙනවිය කතා කරමින්</u>

ස්ථිර කරනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

විරුද්ධ අය ඉන්නවා නම් අත ඔසවන්න. පක්ෂව 11ක් සම්මතයි. විරුද්ධ අය 04යි.

**08:15 නගර සභා ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය ඉදිරිපිට පොළොවට ඉන්ටර්ලොක් ගල් ඇල්ලීම වෙනුවෙන් රු.957542.80 ක් ඕකන්ද ප්‍රජා බල මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කළ අතර, එම ගෙවීම සම්බන්ධව ඡන්ද විමසීමක් සිදු කළ අතර පක්ෂව ඡන්ද 11 ක් සහ විරුද්ධව ඡන්ද 04 ක් ප්‍රකාශ වීමෙන් අනතුරුව සභා සම්මත විය.**

| | |
|---|---|
| පක්ෂව ජන්දය දුන් සභිකයින් | ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා<br><br>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මි සිල්වා මෙනවිය<br><br>ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස ද සිල්වා මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය<br><br>ගරු නගර සභා මන්ත්‍රිනී ජී.ජී.ආර්.පේෂලා කුමාරි ද සිල්වා මහත්මිය<br><br>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය |
| විපක්ෂව ජන්දය දුන් සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය<br><br>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා |
| ජන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී එම්.අතුල ප්‍රියන්ත මහතා<br><br>ගරු නගර සභා මන්ත්‍රිනී එම්.චම්පා සුමුදු කුමාරි මහත්මිය<br><br>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා |
| රැස්වීමට පැමිණ ජන්දය විමසන අවස්ථාවේදී සභා ගර්භයේ නොසිටි සභිකයින් | ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා |

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

08.16 යෝජනා කරනවා.

**08:16 කා.නි.ප.අංක යටතේ මානාන ක්‍රීඩාංගනයට පස් කියුබ් 70 ක් සැපයීම වෙනුවෙන් රු.203000/- ක මුදලක් පී.එච්.සී.සී. ද සිල්වා මහතා හට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත වූ අතර, ක්‍රීඩාංගනයට පස් ප්‍රවාහනය කිරීමේ කටයුතු පිළිබඳ අධීක්ෂණය කිරීම සඳහා ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා සහ ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය පත්කිරීමට ගරු සභාපතිතුමා විසින් තීරණය කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාතිතුමනි, මේ පස් කියුබ් 70 ක් මානාන ක්‍රිඩාංගනයේ කොහේටද දැම්මේ. මොන හේතුවක් මතද දැම්මේ කියන එක පොඩ්ඩක් දැන ගන්න කැමතියි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

තාක්ෂණ සේවා නිලධාරි මහතාණෙනි මෙයට පිළිතුරු දෙන්න .

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

මානාන ක්‍රිඩාංගණය කට්ටිය එපා කියද්දි සංවර්ධනය කරන්න ඔන නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමිය මෙන්න මෙහෙම දෙයක් තිබෙනවා. අපි මේ සම්බන්ධව ක්‍රිඩා කමිටුවේදි සාකච්ඡා කළා. දැන් අපි ට්‍රප් විකට් එකක් මෙතනත් හදලා මේ විදියට දැඩි ප්‍රශ්නයක් වෙන එකක් තමයි මේ පාපන්දු ක්‍රිඩාව මේ මාධයේ කරන්න අමාරු වෙනවා. අමාරු වෙනකොට මේ පැත්තේ කොන සම්පූර්ණ හදලා නැහැ. එමනිසා එය හදලා මේ තත්ත්වයට හැදුවේ නැතිනම් මෙතැන ක්‍රිඩකයන් අතර ලොකු ගැටුමක් ඇතිවෙනවා. එම ගැටුම නිරවුල් කරන්න තමයි මෙය කර තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් අපි සභාපතිතුමලා ඔතනට ගියානේ. අපි ඉතිං අහගත්ත වචනත් එක්ක කිසි දෙයක් කරනවාට කැමති නැහැ. මොකද ඒ අයට ඕන නැතිනම් ගම සංවර්ධනය කරන්න අපිට උවමනාවකුත් නැහැ. මා ඉපදිලා තිබෙන්නේ ඔය ගමේ ඔය නිවසේ. එමනිසා තමයි අපි කැමති නිසා තමයි ඔච්චර කතා කළේ. අර ස්වාමින් වහන්සේ නමක් කතා කර විදිය අමුම පච විදියට කතා කළේ. ගරු ස්වාමින් වහන්සේ කෙනෙක් විවරයක් දරන විදියට නෙමේ. එමනිසා ඒ අය අර හූ කිය කිය හැසුරුණු ආකාරය අර නරි රැලක් වගේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමා එදා වෙච්ච සිද්දිය ඔක්කොම ඇත්ත. නමුත් මෙහෙම දෙයක් තිබෙනවා. අපිට ක්‍රිකට් ක්‍රිඩකයාත් , පාපන්දු ක්‍රිඩකයාත් ,මළල ක්‍රිඩකයාත් හැමෝම එකයි. අපි එමනිසා ඔවුන්ට පහසුකම් සපයන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලක්ෂ්මී ද සිල්වා මෙනවිය  කතා කරමින්</u>**

මා එකට එකඟයි. එය හැදිය යුතුයි. නමුත් අර ගමේ මිනිසුන් ඇවිත් මොනවා හරි දෙයක් අවොතින් කියන ප්‍රශ්නය තමයි මා අසන්නේ. එතකොට එවැනි දෙයක් අවොත් නගර සභාව ගන්න තීරණය කුමක්ද? ගරු සභාපතිතුමා එය හදනවානේ. මානාන ක්‍රිඩාංගණය

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මානාන ක්‍රිඩාංගණය හදනවා. අන්න ඒ වචනය විතරයි මට ගන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මේ මෙතනට පස් කියුබ් 70ක් දමන නිසා මා යෝජනා කරනවා මේ පස් ඔතනට වැටෙනවාද කියා බලන්න අපේ මන්ත්‍රිවරු දෙපලක් හරි තුන්දෙනෙකු හරි මේ සඳහා පත් කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කිසි ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා  කතා කරමින්</u>**

මා ඉදිරිපත් වෙනවා එක්කෙනෙකු හැටියට. ඒ කියන්නේ 70ක් දමනවා කියන්නේ. මෙය නොදැම්මොත් එහෙම. රු.3000/= ගණනේ 10ක් රු.30000/= ක්නේ. අපි දන්නේ නැහැනේ දමනවාද කියා. මාත් ඉදිරිපත් වෙනවා කැමැත්තෙන්. මන්ත්‍රී කමිටුවක් යොදන්න. ඒ වේලාවට අපේ දුරකථන අංක වලට ඇමතුමක් ලබා දී අපි ගෙන්වන්න කියන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙය දමා අවසන් ඇත්තටම. ගෙවීමයි කරන්නේ. ඉදිරියට කරන කොට අපි දෙන්නම් . රාහුල මන්ත්‍රීතුමා මේ අපේ කසළ දමන තැනට යවන්නම්. ඔබතුමා එම ස්ථානයට පස් ගෙන එනවිට ඉන්න ඕන. පස් ගෙන කොට ඉන්න ඕන. ඔයා ගේට්ටුව ළඟ සිට ලකුණු කරන්න. එච්චරයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලිළිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

මටනම් එම කාර්ය කරන්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා  කතා කරමින්</u>**

මේ පස් සම්බන්ධ එම වැඩපිළිවෙලේදි ටිකක් කවුරුහරි පරික්ෂා කළ යුතු වෙනවා. එකවරක් මුල්‍යා කමිටුවේදි එකම වාහනය එකම අංකයේ වාහනය විනාඩි 20කදි පස් ලෝඩ් දෙකක් ඇවිත් තිබෙනවා. විනාඩි 20ක් තුළ එකම වාහනය එකම අංකය තිබෙන වාහනය. මා ඇසුවා ඒ වේලාවේදි. එය ඒ වේලාවේ එච්චර මේකක් වුණේ නැහැ. අන්න ඒ වගේ අවස්ථාවන් තිබෙනවා. ඒ ගැන සොයා බලන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙම අවශ්‍යතාවයක් තිබෙනවා නම් මන්ත්‍රිවරු පත් කරන්නම්. කිසි ප්‍රශ්නයක් නැහැ. සෝභිත මන්ත්‍රිතුමා ,ඉනෝකා මන්ත්‍රිතුමා මේ සම්බන්ධයෙන් බලන්න. අපි පස් ගෙනැල්ලත් නැහැ. අපි පස් ඇදලත් නැහැ. එමනිසා මේ සම්බන්ධයෙන් කරන්න. ඔබ දෙපල කරන්න. අපි ලැහැස්තියි. 08.17 යෝජනා කරනවා. 08.17 ස්ථිර කරන්න කවුරුහරි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, 08.17 අර විදියට. විගණන විමසුමට අනුව.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

08.17 ස්ථිර කරන්න කවුරුහරි .

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා මේ රු.3333774.08 ගෙවන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ තියෙන්නේ සියයට ගණන. සියයට 20ක් වගේ අපි ගෙවා තිබෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අපි 20% ක් ද ගෙවා තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා හිතන්නේ අපි ගෙවුවානේ කලින්. අත්තිකාරමක් ගෙනාවානේ කලින්. ඊට පස්සේ ගෙවුවේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එක අඩු කරලාද මේ එවා තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එහෙම නේද? මේ රු.3333774.08 ගෙවපු මුදල් අඩු කරලාද මේ දමා තිබෙන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එතකොට මෙහි රැඳවුම් මුදල් තියා ගන්නේ නැද්ද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඒ රඳවා ගැනිම් තිබෙනවා. එකට විරුද්ධ අය ඉන්නවාද කවුරුහරි.

**08:17 අම්බලන්ගොඩ නගර සභා විසිරි ජල සැපයුම් පද්ධතියේ කටයුතු වෙනුවෙන් ගෙවිය යුතු ඉතිරි මුදල වන රු.3333774.08 ක් ජිනසේන පුද්ගලික සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:18 මහජන ක්‍රීඩාංගනයේ ළිංවල කම්බි දැමීමේ කර්මාන්තයේ 10% රැඳවුම් මුදල් ලෙස රු.12298/- ක් කළුවඩුමුල්ල සහජීවන ප්‍රජා මණ්ඩලය වෙත නිදහස් කිරීම සඳහා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:19 මහජන ක්‍රීඩාංගනයේ ළිං අන්තර් සම්බන්ධ කිරීම හා කාණු පද්ධතියේ අතිරේක වැඩ සිදුකිරීමේ කර්මාන්තයේ 10% රැඳවුම් මුදල් ලෙස රු.14005.93 ක් ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත නිදහස් කිරීම සඳහා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මි ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:20 මහජන ක්‍රීඩාංගනයේ පැති විකට්ටුව ඇති දිශාවේ බැම්ම ඉදිකිරීමේ කර්මාන්තයේ 10% රැඳවුම් මුදල් ලෙස රු.25063.72 ක් ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත නිදහස් කිරීම සඳහා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**08:21 මහජන ක්‍රීඩාංගනයේ ආපනශාලාව පැත්තේ බැම්ම කපරාරු කිරීමේ කර්මාන්තයේ 10% රැඳවුම් මුදල් ලෙස රු.25008.48 ක් ඕකන්ද ප්‍රජා බල මණ්ඩලය වෙත නිදහස් කිරීම සඳහා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප්**

මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08.22** නගර සභා ක්‍රීඩාපිටියේ දේවානන්ද විද්‍යාලය පැත්තේ තිබෙන කාණුවේ අලුත්වැඩියා කටයුතු සිදුකිරීමේ කර්මාන්තයේ **10%** රැඳවුම් මුදල් ලෙස රු.**44034.46** ක් කළුවඩුමුල්ල සහජීවන ප්‍රජා මණ්ඩලය වෙත නිදහස් කිරීම සඳහා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:23** මහජන ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය අසල දිශාවේ බැම්ම ඉදිකිරීමේ කර්මාන්තයේ **10%** රැඳවුම් මුදල් ලෙස රු.**23943.56** ක් ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත නිදහස් කිරීම සඳහා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:24** අම්බලන්ගොඩ පොදු වැසිකිළිය අලුත්වැඩියා කිරීම (අදියර **01**) වෙනුවෙන් රු.**338254.38** ක මුදලක් විලේගොඩ ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:25** පනියන්දූව අතුරු මාර්ගයේ කාණු පද්ධතිය හා බෝක්කුව (සංශෝධිත) ඉදිකිරීම වෙනුවෙන් රු.**170215.90** ක් කළුවඩුමුල්ල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**08:26** විදුලි බලය ඇණහිටීම නිසා මාසික සභා රැස්වීමේ වැඩ කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය ජෙනරේටරයක් ලබා ගැනීම වෙනුවෙන් රු.**14000/=** ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි හේමන්ත ද සිල්වා මහතාට ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## **09.** ගිණුම්

09.01 2020 ජුනි මස පොදු ගිණුම් , වියදම් වාර්තාව , වියදම් වැය විශ්ලේෂණය සභාගත කරන ලදී

**තීරණය**

2020 මාසයට අදාළ පොදු වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය හා 2020 මැයි මස ලැබීම් විග්‍රහය පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

10. ඇස්තමේන්තු

**10.01 හල්වතුර කසළ අංගනයට පස් දමා තුනීකිරීම සඳහා රු.270,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

හල්වතුර කසළ අංගනයට පස් දමා තුනී කිරීම සඳහා රු. 270,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.02 2020 ලෝක ළමා දින සැමරුම් උළෙල සඳහා රු.10,00,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

2020 ලෝක ළමා දින සැමරුම් උළෙල පැවැත්වීම සඳහා රු.10,00,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.03 අම්බලන්ගොඩ, පටබැඳිමුල්ල, හාෂිණී මහත්මියගේ නිවස අසල කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා රු. 900,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ, පටබැඳිමුල්ල, හාෂිණී මහත්මියගේ නිවස අසල කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා රු. 900,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.04 අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ ක්‍රීඩාපිටිය පහත් කිරීමට පස් කපා භූමිය විශාල කිරීමට ඉතිරි කොටස පිරවීම (අදියර 01 ) සඳහා රු. 900,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ ක්‍රීඩාපිටිය පහත් කිරීමට පස් කපා භූමිය විශාල කිරීමට ඉතිරි කොටස පිරවීම (අදියර 01 ) සඳහා රු. 900,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.05 අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ ,දලුක්කන්ද පාර හරහා ඇති අංක 01 බෝක්කුව ඉදිකිරීම සඳහා රු. 1,000,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ ,දලුක්කන්ද පාර හරහා ඇති අංක 01 බෝක්කුව ඉදිකිරීම සඳහා රු. 1,000,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.06 අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ ,දලුක්කන්ද පාර හරහා ඇති අංක 02 බෝක්කුව ඉදිකිරීම සඳහා රු. 1,100,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ ,දලුක්කන්ද පාර හරහා ඇති අංක 02 බෝක්කුව ඉදිකිරීම සඳහා රු. 1,100,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.07 අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ බිම් මහලේ ආධාරක ඉදිකිරීම (Column 02 ක් හා Beam 01) සඳහා රු. 1,200,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ බිම් මහලේ ආධාරක ඉදිකිරීම (Column 02 ක් හා Beam 01) සඳහා රු. 1,200,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

11.

වෙනත් කරුණු

12. න්‍යාය පත්‍රයට ඇතුළත් නොවූ වෙනත් කරුණු

**12.01 පඤ්ඤාලෝක මාවත කාපට් කිරිම කටයුතු සැලැස්වීම සම්බන්ධව කළුවඩුමුල්ල ප්‍රදේශවාසි ජනතාව විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පඤ්ඤාලෝක මාවත කාපට් කිරිම කටයුතු සැලැස්වීම සම්බන්ධවයි. ඔබගේ පූර්න මැදිහත්විම යටතේ කලුවඩුමුල්ල පඤ්ඤාලෝක මාවත කාපට් කිරලීමට කටයුතු සැලැස්වීම සම්බන්ධයෙන් කලවඩුමුල්ල ප්‍රදේශවාසින් වන අපගේ ගෞරවනිය ප්‍රණාමය ප්‍රථමයෙන් පුද කරනවා. ගරු සභාපතිතුමනි , මේ වන විට ජලසම්පාදන මණ්ඩලයෙන් මෙකි මාවතේ එලා ඇති ජලනල කල් ඉකුත් විම හේතුවෙන් නිතර ආපදාවන්ට ලක්වීම මත මාවත කැඩෙන ස්වභාවය වැඩි වි ඇත. එසේ හෙයින් මෙකි මාවත කාපට් කරලිමට පෙරතුව ජලසම්පාදන මණ්ඩලය ලවා අලුතින් ජලනල යොදවා ගැනීමට පියවර ගන්නේ නම් වඩාත් උචිත බව දන්වා තිබේ. එසේ අලුතින් ජලනල යොදවා ගැනීමෙන් පසුව මාවත කාපට් කරලීමේ කාර්ය ඉටු කරලීම ඵලදායි ක්‍රියාවක් වනු ඇතැයි විශ්වාස කරනවා. මේ සම්බන්ධයෙන් සක්‍රීය දායකත්වය ලබාදිම සම්බන්ධයෙන්

නැවත වරක් ඔබට ස්තුතිය පලකර සිටිනවා. ඔවුන් ඉල්ලා සිටින්නේ මේ ජලනල අළුතෙන් එලීම සිදු කරන ලෙස. අපි එයට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා. අපි දැනටත් දන්වලා තිබෙන්නේ.

**තීරණය-**

පඤ්ඤාලෝක මාවත කාපට් කිරීමට කටයුතු සැලැස්වීම සම්බන්ධව කළුවඩුමුල්ල ප්‍රදේශවාසී ජනතාව විසින් එවා ඇති ලිපිය ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ගරු සභාවේ දැනගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

**12.02 සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2020 ව්‍යාපෘතියේ අංක 85 පටබැඳිමුල්ල ග්‍රාම නිලධාරී වසම තුළ ධීවර ප්‍රජාව සඳහා ඉදිකිරීමට නියමිත දැල් මැසීමේ ගොඩනැගිල්ලේ වහලය සැකසීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2020 .උක්ත කරුණට අදාල කරුණට අදාල අංක 85 පටබැඳිමුල්ල ධිවර ප්‍රජා ශාලාව සඳහා දැල් මැසිම ව්‍යාපෘතිය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරිම සම්බන්ධව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සකසන ල ද ඇස්තමේන්තුවේ අංක 02 හි I සහ 02 II හි අයිතම සඳහා අයිතම 05 සහ 05 II අයිතම මඟින් අංක දරණ 8 I සඳහා ගෙවීම් නගර සභාව මගින් ගෙවිමට අනුමැතිය ලබා දී ඇත. ඊට අමතරව සභාපතිතුමාගේ වාචික උපදෙස් අනුව සාදන ලද ගොඩනැඟිල්ලේ වහලය සැකසීමේදි යකඩ ඇණ වෙනුවට පිත්තල ඇණ භාවිතා කිරිම සුදුසු බව යෝජනා කරනවා. ඊට හේතු වුයේ මුහුද ඉතා ආසන්නයේ පිහිටි නිසා ඉතා ඉක්මනින් මළ කැමට ලක්වේ. එමනිසා බලපැමක් ඇති නොවන පරිදි පිත්තල ඇණ සවිකිරිම සුදුසු වේ. එම පිත්තල ඇණ සඳහා අමතරව වැයවන ගාස්තුව නගර සභාව මඟින් ගෙවිම් කිරිම සුදුසු බව ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී. ඒ සඳහා නගර සභාවේ මාසික සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරනවා. එමනිසා යකඩ ඇණ වෙනුවට පිත්තල ඇණ යෙදිම සුදුසුයි. තඹ ඇණ ද පිත්තල ඇණද කියා තිබෙන්නේ. මෙහි අමතර මුදල කොන්ත්‍රාත්කරුට ගෙවා අපි හරියට වැඩය කර ගන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, තඹ ඇණ යෙදිම සුදුසුයි.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

එහෙනම් අපි තඹ ඇණ යොදා කර ගන්න.

**තීරණය-**

**සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2020** ව්‍යාපෘතියේ අංක 85 පටබැඳිමුල්ල ග්‍රාම නිලධාරී වසම තුළ ධීවර ප්‍රජාව සඳහා ඉදිකිරීමට නියමිත දැල් මැසීමේ ගොඩනැගිල්ලේ වහලය සැකසීමේ කටයුත්තේදී යකඩ ඇණ වෙනුවට පිත්තල ඇණ භාවිත කිරීම සුදුසු බවට තාක්ෂණ සේවා නිලධාරී වාර්තාවේ සඳහන් කර ඇතත්, පිත්තල ඇණ වෙනුවට තඹ ඇණ භාවිත කිරීම සුදුසු බවටත් ඒ සඳහා වැය වන මුදල සභා අරමුදලින් ගෙවීම සුදුසු බවටත් ගරු ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.03 2020.08.06 දින පැවති තද සුළං තත්ත්වය හේතුවෙන් අම්බලන්ගොඩ නගර සභා මහජන පුස්තකාල ගොඩනැගිල්ලේ ඉහල මාලයේ වහලට අලාභහානි සිදුවීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ නගර සභා මහජන පුස්තකාල ගොඩනැගිල්ලේ ඉහල මාලයේ වහල අළුත් වැඩියා කිරිම. අම්බලන්ගොඩ පුස්තකාලයේ ඉහළ මාලය සුළි සුළඟට ගලවා ගෙන ගියා කොටසක්. ඒ සඳහා අවශ්‍ය වුණා අපිට අඟල් 3 අඟල් 5 යට ලී දිග අඩි 11 ½ කෑලි 05, ඇස්බැස්ටෝස් ෂීට් දිග අඩි 8 ඒවා 05, කොච්චි ඇණ දිල අඟල් 3 ½ ( ඇණ 30 තහඩු නෝලික් සමඟ) ඒ අනුව ටෙන්ඩර් කිරිමෙන් තොරව ගන්න සිදුවුණා පසුගිය සෙනසුරාදා දිනයේදි. එයට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා. මොකද මෙය නැතිනම් අපිට අද මේ රැස්වීම තබන්න වෙන්නේ නැහැ. වහල ගැලවිලා ගිහින් තිබෙනවා. එය සම්පුර්ණ අලුත්වැඩියා කටයුතු සිදු කර තිබෙනවා. මේකේ යට වතුර තිබෙනවා. ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය-**

2020.08.06 දින පැවති තද සුළං තත්ත්වය හේතුවෙන් අම්බලන්ගොඩ නගර සභා මහජන පුස්තකාල ගොඩනැගිල්ලේ ඉහල මාලයේ වහලට අලාභහානි සිදුවීම හේතුවෙන් එහි අලුත්වැඩියා කටයුතු සිදුකිරීම සඳහා සභා අනුමැතියට යටත්ව 3″x5″ ආනයනික දැව දිග අඩි 11½ කැබලි 05 ක්, දිග අඩි 08 ඇස්බැස්ටෝස් ෂීට් 12 ක්, කොච්චි ඇණ අඟල් 3 ½ ඇණ 30 ක් නෝ ලීක් අඩි 01 ක් සමග සහ 3/8″ ට්‍රෙඩ් බාර් අඩි 06 න් 01 ක් (නට් 32 ක් හා වොෂර් 32 ක් සමග)

ලබාගැනීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.04 සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2020 ව්‍යාපෘතිය යටතේ ඕකන්ද පුස්තකාලය අසළ සිට විහාරගොඩ මාවතට සම්බන්ධ මාර්ගය දෙපස කාණු සකසා පාර ගල් අතුරා තාර දැමීමේ කර්මාන්තය සිදුකිරීමේදී නිවසේ තාප්පයට හානි සිදුවීම සම්බන්ධව ඩී. නන්දනී මහත්මියගේ ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2020 ව්‍යාපෘතිය යටතේ ඕකන්ද පුස්තකාලය අසළ සිට විහාරගොඩ මාවතට සම්බන්ධ මාර්ගය දෙපස කාණු සකසා පාර ගල් අතුරා තාර දැමීමේ කර්මාන්තය ආරම්භ කිරිමට යෝජිතව ඇත. 2020.07.14 වන දින ඉහත කාරණාවට අනුව යොමු කරන ලද තාක්ෂණ නිලධාරින් විසින් කරන ලද ක්ෂේත්‍ර පරික්ෂණය අනුව එම මාර්ගයේ කාණු පද්ධති සකස් කිරිම සඳහා නිවසට අදාල තාප්පය හානි වීම සිදුවිය හැකිබවත් නිරික්ෂණය වි ඇති බවට දන්වා ඇති අතර යම් හෙයිකින් තාප්පයට හානි සිදුවුවොත් වගකිම භාර ගත යුතු බවට දැනුම් දි ඇත. මා වැන්දඹුවක් වන අතර මාගේ මිත්තනියගේත් දරුවන් තිදෙනා සමඟය. අනපේක්ෂිත ලෙස තාප්පය බිඳ වැටුණහොත් එය යථා තත්ත්වයට ගැනීමට මා සතුව වත්කමක් නොමැති බව කාරුණිකව දන්වා සිටිනවා. එම මාර්ගය අසළ නිවස ආවරණයක් තිබිම හේතුවෙන් කොන්ක්‍රිට් කණු කිහිපයක් යොදා ගනිමින් දැළක් යොදා ගනිමින් අඩුම වශයෙන් අඩි 4ක් උසට ආවරණය කළ යුතුව ඇත. මේ වත්කමක් නොමැති මා හට මෙය නගර සභාවෙන් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

එය ලබා දෙන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

එහෙම දෙන්න බැහැ. මෙය කඩන්  වැටුණොත් අපි බලන්නම්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ඇත්තෙන්ම සානුකම්පිත ඉල්ලීමක් කර තිබෙන්නේ. එමනිසා මේ ගැන දැඩි අවධානය යොමු කරලා මෙම ඉල්ලීම ගැන බලන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

කැඩෙන් නැතුව බැහැ. කැඩෙන්න ඕන

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්**</u>

කැඩෙන්න ඕන. කැඩෙන්නේ නැතිනම් කඩලා හරි බලෙන් හරි කඩලා ගෙවීම් කර දෙන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

මේ සම්බන්ධව මටත් අදහසක් දක්වන්න ඉඩ දෙන්න. මේ තාප්පය ඒ අයට සකස් කර ගන්න බැරි වෙනවා. නන්දනි මහත්මිය. මොකද එයාගේ දියණියත් මරුමුවට පත් වුණා . පුතාත් ගොඩක් අසරණ තත්ත්වයට පත්වෙලා ඉන්නේ. ස්වාමියා නැහැ. එමනිසා මා ඉතාමත්ම ඕනෑකමින් ඉල්ලා සිටිනවා. උදවුවක් ඕනනම් ලබා දෙන්න පුළුවන්. මේ වෙනුවෙන් තාප්පය පරිත්‍යාග කරනවා. අනිවාර්යෙන් තාප්පය යනවා. මොකද එතුමිය අමාරුවෙන් හදා ගත් තාප්පය. ඒ වෙනුවට අපි මොනවා හරි සහනයක් ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අපි ඕක පරික්ෂා කළා. මෙය අනවසර තාප්පයක්. එතකොට අනවසර තාප්පයක් වුණොත් අපිට ගෙවීම් කරන්න බැහැ. අදාල දේපළට අලාභ හානි නොවන විදියට වැඩය කරගෙන  යන්න පුළුවන්. කරුණා කරලා මන්ත්‍රීතුමියලාත් සභාවේ තත්ත්වය දන්න නිසා දැනට සපිරි ගමක් යටතේ මෙය අනුමත කරලා තිබෙන නිසා මේ වැඩය කරන්න ඕන. මෙය ජනතාවට අවශ්‍යයි. මොකද මා මළ ගෙදරක ගියා. ඉතාමත් ඉක්මනින් කරන්න ඕන. තෙත්බිම් සංවිධානය ඉන්නවාද?

**තීරණය-**

සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2020 ව්‍යාපෘතිය යටතේ ඕකන්ද පුස්තකාලය අසල සිට විහාරගොඩ මාවතට සම්බන්ධ මාර්ගය දෙපස කාණු සකසා පාර ගල් අතුරා තාර දැමීමේ කර්මාන්තය සිදුකිරීමේදී නිවසේ තාප්පයට හානි සිදුවීමේ අවධානමක් ඇති බවට නිරීක්ෂණය වී ඇති බවට අම්බලන්ගොඩ, ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් දන්වා ඇති බවත්, එසේ වුවහොත් තාප්පය වෙනුවට කොන්ක්‍රීට් කණු කිහිපයක් යොදා දැලකින් හෝ නිවස ආවරණය කරගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපාංග ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ, ඕකන්ද, අංක 1/23 හි පදිංචි ඩී. නන්දනී මහත්මියගේ එවා ඇති ලිපිය අනුව, එම තාප්පය අනවසර ඉදිකිරීමක් බැවින් වන්දි ගෙවීමේ හැකියාවක් නොමැති බවත් ඉහත කර්මාන්තය සිදුකිරීමේදී තාප්පයට හානි සිදුනොවන ලෙස කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් දන්වන ලදී.

**12.05 අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මගින් 2020.08.12 දින පැවැත්වීමට නියමිත විශේෂ ඩෙංගු මර්දන වැඩසටහන සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

විශේෂ ඩෙංගු මර්දන වැඩසටහන - අම්බලන්ගොඩ නගර සභා කොට්ඨාය . අම්බලන්ගොඩ නගර සභා කොට්ඨාශයේ පටබැඳිමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ සිදුකරන ලද කීට විද්‍යා පරික්ෂණ අනුව එම ප්‍ර දේශයේ බ්‍රිටෝ දර්ශකය අනුව ඩෙංගු පැතිරීමේ අවදානම් තත්ත්වයක් හඳුනාගෙන ඇත. මෙම තත්ත්වය මත 2020.08.12 දින පෙ.ව.8.00 ට අම්බලන්ගොඩ නගර සභාවෙන් ආරම්භකර විශේස ඩෙංගු මර්දන ගෘහ සමීක්ෂණ වැඩසටහනක් පැවැත්විමට කටයුතු සංවිධානය කර ඇත. මෙම වැඩසටහන සඳහා අප කාර්යාල මහජන සෞඛ්‍ය පරික්ෂකවරු , අප කාර්යාලයේ සහ අවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවල ඩෙංගු මර්දන සෞඛ්‍ය කාර්යය සහයක ඇතුලු 50 දෙනෙකුගේ කණ්ඩායමක් සහභාගීවීමට නියමිතව ඇත. මෙම වැඩසටහන සඳහා සහභාගීවන (50 දෙනෙකු ) අය සඳහා උදෑසන ( කිරි පැකට් එකක් සමඟ මාලු පාන් වැනි ආහාරයක් ) සහ දිවා ( කෑම පැකට් එකක් සහ ලීටර් 0.5 වතුර බෝතලයක් ) ආහාර වේලක් ලබා දීමට අවශ්‍ය කටයුතු යොදන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මේ ඔක්කොම තිබෙන්නේ පටබැඳිමුල්ලේ

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔක්කොම විෂබීජ ටික විනාශ කරන්න ඕන. එක විෂබීජයක් ගියා.

**තීරණය-**

අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මගින් 2020.08.12 දින පැවැත්වීමට නියමිත විශේෂ ඩෙංගු මර්දන වැඩසටහන සඳහා 50 දෙනෙකුට උදෑසන ආහාරය (කිරි පැකට් එකක් මාලු පාන් වැනි ආහාරයක්) සහ දිවා ආහාරය (කෑම පැකට් එකක් සහ ලීටර් 0.5 වතුර බෝතලයක්) ලබාදෙන ලෙස ඉල්ලා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් එවා ඇති ලිපිය අනුව එම ආහාර ලබාදීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.06 වරුසවිතාන වැඩිහිටි නිවාසයේ මිය යන මව්වරුන් හා පියවරුන්ගේ දේහයන් ආදාහනය කිරීම සඳහා නොමිලේ ආදාහනාගාර පහසුකම් ලබාදෙන ලෙසත්, 2020 පෙබරවාරි සහ 2020 ජූලි මස ආදාහන 02 ක් සඳහා නගර සභාවට ගෙවන ලද රු.12000/- ක මුදල ලබාදෙන ලෙසත් ඉල්ලා සීමාසහිත අම්බලන්ගොඩ අවමංගල්‍යාධාර සමිතිය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වරුසවිතාන වැඩිහිටි නිවාසයේ මිය යන මව්වරුන් හා පියවරුන්ගේ දේහයන් ආදාහනය කිරීම සඳහා නොමිලේ ආදාහනාගාර පහසුකම් ලබා දිම සම්බන්ධයෙන්, 1994 වර්ෂයේ අම්බලන්ගොඩ ප්‍රභූ පිරිසකගේ සංවිධානයෙන් ආරම්භ කළ ප්‍රදේශයේ පැරණිතම ස්වේච්ඡා සමිතියක් වන සී/ස අම්බලන්ගොඩ අවමංගල්‍යාධාර සමිතිය 1998.09.09 දින ගැසට් පත්‍ර 523 යටතේ රජයේ පුන්‍යායතනයක් බවට පත්වුනි. මෙම සමිතිය මගින් පාලනය වන වරුසවිතාන වැඩිහිටි නිවාසයේ වැඩිහිටි මව්වරුන් හා පියවරුන් මිය යාමේදි අදාහනය කිරිම සඳහා වැයවන වියදම් පියවා ගැනීමට ඉමහත් ගැටළුවක් පවතී. ප්‍රදේශයේ දාන පින්වතුන්ගේ දෛනික දාන මත හා මහජනතාවගේ ආධාර මත යැපෙන මෙම වැඩිහිටි නිවාසයේ වැඩිහිටි මව්වරුන් මියගිය අවස්ථාවන් වලදි අම්බලන්ගොඩ , පටබැඳිමුල්ල ආදාහනාගාරයේ හෝ පොල්වත්ත , ඕකන්ද ආදාහනාගාරයේදි එම ආදාහනයන් සිදු කිරමට ප.ව. 3.00 හෝ 5.00 වේලාවන් නොමිලේ ලබා දීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටින අතර , 2020 පෙබරවාරි මස 09 දින ප.ව.

5.00 ය ආදාහනය කරන ලද ලොකුගේ රම්පියෙල් මහතාගේ ආදාහනය වෙනුවෙන් ගෙවන ලද රු.6000/= ක මුදලද 2020 ජුලි 26 ප.ව. 5.00 ට පොල්වත්ත අදාහනාගාරයේදි ආදාහනය කරන ලද උත්තමාවඩු ධනසිරි මහතාගේ ආදාහනය වෙනුවෙන් ගෙවන ලද රු.6000/= මුදල ද වශයෙන් වු රු.12000/- ක මුදල ආපසු සී/ස අම්බලන්ගොඩ අවමංගලල්‍යාධාර සමිතිය වෙතට නිදහස් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එය නිදහස් කර දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

එය නිදහස් කර දෙන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපි ස්වාමීන් වහන්සේලාගේ ආදාහන සඳහා මේ මුදල් නිදහස් කර දෙනවා. මේ අම්බලන්ගොඩ වැඩිහිටි නිවාස දෙකක් පමණ තිබෙනවා. එමනිසා එය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැනට අපි කොට්ඨාශ දෙකකට නොමිලේ ලබා දෙනවා. ඒ ලබා දෙන්නේ පලවෙනි එක බද්දේගම වයෝවෘද්ධ භික්ෂු ආයතනයට . සියළුම අපවත් වන වයෝවෘද්ධ අයගේ ආදාහන කටයුතු අපි නොමිලේ කරනවා. අම්බලන්ගොඩ නගරය තුළ විහාරස්ථාන වල සිටින සියළුම භික්ෂුන් වහන්සේලා අපවත් වුණාම ආදාහනාගාරය නොමිලේ ලබා දෙනවා. මා හිතන්නේ මේකත් සාධාරණ ඉල්ලීමක්. මේ ආයතනය රජය පිළිගත් පුන්‍යාතනයක්, වැඩිහිටියන් හුඟ දෙනෙක් ඉන්න තැනක්. අන්තිමට ගිහින් නවතින ඉන්න තැන මෙතනයි. අපි ඒ අයගේ ආදාහන කටයුතුත් ඔලුව නරක් වෙන්නේ නැතුව ආදාහන කටයුතු සිදු කිරිම කළ යුතුයි. ඒ වෙනුවෙන් මා මේ යෝජනාව ඉදිරිපත් කරනවා. කවුරුහරි ස්ථිර කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

ඒ යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

රු.12000/= ක් ලබා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නැහැ අපි මේ රු.12000/= ගන්න ගියොත් ආයේත් ආණ්ඩුකාරතුමාටත් ලියා තමයි දෙන්න වෙන්නේ. එමනිසා අපි ඉදිරියට තිබෙන ඒවා නිදහස් කරන්න.

**තීරණය-**

වරුසවිතාන වැඩිහිටි නිවාසයේ මිය යන මව්වරුන් හා පියවරුන්ගේ දේහයන් ආදාහනය කිරීම සඳහා නොමිලේ ආදාහනාගාර පහසුකම් ලබාදෙන ලෙසත්, 2020 පෙබරවාරි සහ 2020 ජූලි මස ආදාහන 02 ක් සඳහා නගර සභාවට ගෙවන ලද රු.12000/- ක මුදල ලබාදෙන ලෙසත් ඉල්ලා සීමාසහිත අම්බලන්ගොඩ අවමංගල්‍යාධාර සමිතිය විසින් එවා ඇති ලිපිය අනුව, නගර සභාවට ගෙවන ලද රු.12000/- ක මුදල නැවත ලබාදිය නොහැකි බවත් මින් ඉදිරියට වරුසවිතාන වැඩිහිටි නිවාසයේ මිය යන මව්වරුන් හා පියවරුන්ගේ දේහයන් නොමිලේ ආදාහනය කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## වෙනත් කරුණු

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපි ස්තුති වන්ත වෙනවා. මේ මාර්ග කාපට් කිරිමේ ව්‍යාපෘතියට අපේ සභාවට ඒ අවස්ථාව ලබා දිම සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමාට . කොන්ත්‍රාත්කරුවා දැනුවත් කරන්න අදාළ කොට්ඨාශයේ මන්ත්‍රිවරයා දැනුවත් කරන්න මේ වැඩ කරන විට. අපේ යටතේ මේ කර්මාන්ත කිරිමට අවස්ථාව ලබා දෙන ඉල්ලිම කරනවා. විශේෂයෙන්ම කියන්න ඕන ඔබතුමාත් මේ නිලධාරිනුත් දෝෂාරෝපණයට ලක් වෙන්නේ අපේ කාර්මික අංශයේ නිලධාරින් මහත්වරු සිටින්නේ තිදෙනෙක් පමණයි. අපි බලයට ආපු දින සිට මේ ආයතනයට පුහුණු වෙන ළමයින් දෙදෙනෙකු ගන්න කියා ගරු සභාපතිතුමා උපදෙස් දුන්නා. ඒ කාර්යාලයට. මේ වෙනකම් එය කෙරිලා නැහැ. මා මෙය කතා කරන්න ගත්තේ තල්ගස්ගොඩ ඇස්තමේන්තු 03ක් හදන්න

භාරදුන්නා. ඒ ඇස්තමේන්තු හදා ගන්න බැරි කමට එතුමන්ලා ලියා එවා මේ සභාවට අනුමත කර ගත්තා දැන්. ඒ ඇස්තමේන්තු හදන්න. එය ඉතා කනගාටුදායක තත්ත්වයක්. අපි කතා කළාම කියන්නේ මේ සභාවේ කමිටු තිබෙනවා . මහජන ඉල්ලීම් වලට යන්න ඕන. ඉතිං සත්‍යයක් තිබෙනවා. සමහර වේලාවට නිලධාරින් වශයෙන් නිවෙස්වල ගිහින් තමයි කරන්නේ. ඔබතුමා දිගින් දිගටම කතා කළා. ඔබතුමා කතා කළා. අදවෙනකම් මෙය කෙරිලා නැහැ. ඔබතුමා පැමිණ මාස 6න් උපදෙස් දුන්නේ මේ අය ගන්න කියා. අඩු ගණනේ මෙයට ගෙවීමක් කරලා හරි ගන්න. මේ සභාවේ ඉදිරියට ඡන්දයකට යන්න ඉස්සරවෙලා වැඩ කෙරෙන්න ඕන. කරුණාකරලා මේ මාසය ඇතුළත මේ නිලධාරින් දෙදෙනෙකු ගන්න. මේ වැඩ කරන්න පුළුවන් ළමයින් දෙදෙනෙකු. හැබැයි ඒ ළමයින්ට යම්කිසි මුදලක් ගෙවලා. නැතිනම් අපිට අපේ ඉලක්කය කරා යන්න බැරි වෙයි. දැන් ගරු සභාපතිතුමාට දෝෂාරෝපණය කළා පාලක පක්ෂයේම. ඒ කලේ මේ කර්මාන්ත වලට අදාළ ඇස්තමේන්තු කෙරෙන්නේ නැහැ කියා. එය ඇත්ත තත්ත්වය. දැන් මේ මාස දෙක තුන අයවැය යෝජනා වල වැඩ කෙරෙන්න වෙයි. සමහර කොට්ඨාශ වල වැඩ කොටසයි කෙරිලා තිබෙන්නේ. ඒවා කර ගන්න ගියාම මේ නිලධාරින් සමඟ අපිට වැඩ කරගන්න ටිකක් ආමාරු වෙයි. එමනිසා ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේ වගේ තත්ත්වයක ක්‍රියාත්මක වෙන්න. විදුහල්පතිතුමා ඔබතුමාගේ හොඳ මිත්‍රයෙක්. එවන්නම් කියලා කිවුවා. පැනලා දෙන්න එපා මන්ත්‍රීතුමිය .මා කතා කරන කොට මට අවස්ථාව දෙන්න. ඔබතුමා මෙයට සක්‍රිය වෙලා මේ මාස දෙක ඇතුළත ඒ ළමයින් දෙදෙනෙකු ගන්න. ඉතා ඕනැකමින් ඉල්ලා සිටිනවා. මා සභාවේ කිහිප වතාවක කතා කළා. මේ වෙනකම් දිලා නැහැ. ලේකම්තුමියගේත් වගකීමක් තිබෙනවා. ගිහිල්ලා හරි කතා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මාත් කිහිප අවස්ථාවක කතා කළා. මානිම්මුල්ල ආදර්ශ නිවාස එතැන වටරවුම. එක එදා තාක්ෂණසේවා නිලධාරින්ටත් කිවුවා. එයට නිතිමය පියවරක් ගන්න කියා. ඊට කලින් නොතිසියක් හරි යවා දැනුම් දිමක් කරලා මේ සම්බන්ධව නිතිමය ක්‍රියා මාර්ග ගැනිම. ඒ පැත්තට ගියාම වාහනයක් හරවා ගන්න බැහැ. එතැන ගහ අල්ලා ගෙන . මිනිසුන් ඇවිත් අපිට කියනවා. මේ වටරමුව තිබ්බා නම් ඔතන ඔය ප්‍රශ්නය එන්නේ නැහැ. හදපු එක තමයි මා කියන්නේ.ඉතා ඉක්මනින් ක්‍රියා මාර්ගයක් ගන්න. මානිම්මුල්ල ආදර්ශ නිවාස වටරවුම. වටරවුමක් නැහැ එතැන. ඒ මිනිසුන්ට වාහනයක් හරවා ගන්න බැහැ. ත්‍රිවිල් එකක් ගියොත් ආපස්සට එන්න ඕන.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , මා යෝජනාවක් ගෙන එනවා. ආණ්ඩුකාරතුමාට හරි කරන්න. මේ සභාවේ තිබෙන වැඩ අධිකාරි හා කාර්මික නිලධාරි පුරප්පාඩු පුරවන ලෙස දැනුම් දෙන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මේ සම්බන්ධව කතා කළා. නිලධාරින් නැහැ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

නිලධාරින් නැතිකම නෙමේ. නිලධාරින් මේ ආයතනයට එන්න අකමැති කම තිබෙන්නේ. මොකද මේ ස්ථානයේ තිබෙන පහසුකම් හා වෙනත් ස්ථාන වල පහසුකම් අනුව නිලධාරින් මේ ස්ථානයට එන්නේ නැතිකම තිබෙන්නේ. හොදාකාරවම දන්න දෙයක් එමනිසා මෙය ප්‍රධාන ලේකම් හෝ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ට හරි ආණ්ඩුකාරතුමාට දැනුම් දිලා මේ ස්ථානයට නිලධාරියෙක් එවන්න කටයුතු කරන්න කියා. ආණ්ඩුකාරතුමාට මා යෝජනා කරනවා කාර්මික නිලධාරි වරයෙක් ගෙන්වා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණිය මහතා කතා කරමින්**

ස්ථිර කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඕකන්ද ප්‍රජා ශාලාව ළඟ. මා ගියවරත් මේ ඉල්ලීම කළා. මොකද එතැන පාර කඩලා තිබෙනවා ජලය ලබා ගන්න. නමුත් එම පාර හදලා නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ගමේ ගියේ නැහැනේ . ඊයේ හැදුවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමා මාගේ ගේ ඉදිරිපිට මොකක් හරි කරලා දෙන්නකෝ. දැන් මට අදාලත් නැහැ. අංක 6 ට නිසා මට කතා කරන්නත් බැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කොන්ත්‍රාත්කරුවෙකු එවන්න අපි කරලා දෙන්නම්. මා කරන්නේ මුදල් දෙන එක. මා කොන්ත්‍රාත් කරන්නේ නැහැ . කටවත් වැඩක් නැහැ . කඩලා දමන්න. ඔය එක එක්කෙනා සනසන්න බැහැ. කතා කරලා කියන්න. සභාවේ වැඩ කටයුතු මෙයින් අවසන් කරනවා. තෙත්බිම් උරුමය සංවිධානයේ කවුරු හරි ඉන්නවාද?

පස්වරු 12.05 ට සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා.

ඩබ්.ඩී.ආර්.ජේ.රුද්‍රිගු මිය
ලේකම්
අම්බලන්ගොඩ - නගර සභාව

අරුණ ප්‍රදිප් මණිමෙල්වඩු
සභාපති
අම්බලන්ගොඩ - නගර සභාව

2020.08.28

වන දින

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදි.